المكتب التعاوني للدعوة
وتوعية الجاليات بالربوة
هاتف: ٠١١٤٤٥٤٩٠٠ - فاكس ٠١١٤٩٧٠١٢٦
ص.ب: ٢٩٤٦٥ الرياض ١١٤٥٧
حساب رقم: SA7080000296608010058587
بمصرف الراجحي - فرع الربوة
٠٥٤٥٤٥٥٥١٢
٠٥٦٦٠٦٦٨٢٨


خيراتكم
بعض إنجازات عام ١٤٣٤هـ


١,٧٥٣ المسلمون الجدد


٢,٢٦٥ الكلمات والمحاضرات


٢,١٠٥ طلاب الدورات الشرعية


١١,٤ مليون عدد زيارات موقع دار الإسلام


٢٢٤,٥ تيرا بايت كمية سحب البيانات لموقع دار الإسلام


١٠١ عدد اللغات في موقع دار الإسلام



٢,٦٨١,٥٨٢ المطبوعات الدعوية التي تم توزيعها


١٥٠٣ الذين تم دعوتهم عن طريق الجوال الدعوي


٥٤٣ محاضرة ودرس في إصلاحية الملز

تواصلكم يسعدنا
OFFICERABWAH

# සොයාගත් නැවුම් යථාර්ථය

**සකස් කිරීම:**
**මුහම්මද් අස්හර් මුහම්මද් යූසුෆ්**

**කැඳවුම්කරු**
**විදේශිකයන් කැඳවීමේ හා මඟ පෙන්වීමේ කාර්යාලය - අල් ජුබෙල්**

# حق عرفناه

(باللغة السنهالية)

جمع وإعداد:
محمد أزهر محمد يوسف
داعية
بمكتب الدعوة وتوعية الجاليات
بالجبيل
الطبعة الأولى: ١٤٣٠

ح المكتب التعاوني للدعوة والإرشاد وتوعية الجاليات بالجبيل، ١٤٣٠هـ

فهرسة مكتبة الملك فهد الوطنية أثناء النشر

يوسف، محمد أزهر

حق عرفناه (اللغة سنهالي)./ محمد ازهر يوسف.-الجبيل، ١٤٣٠هـ

١١٦ ص ، ١٢ × ١٧ سم- (مطبوعات المكتب؛ ٣٣٣)

ردمك : ٢-٢٩-٨٠٤٤-٦٠٣-٩٧٨

١- اعتناق الإسلام – قصص

أ- العنوان ب- السلسلة

ديوي ٢١٣ ١٤٣٠/٥٩٥

رقم الإيداع : ١٤٣٠/٥٩٥

ردمك : ٢-٢٩-٨٠٤٤-٦٠٣-٩٧٨

الطبعة الأولى

١٤٣٠هـ



# පටුන


| මාතෘකාව | පිටුව |
|---|---|
| ප්‍රස්ථාවනාව | 02 |
| බිලාල් ෆිලිප්ස් | 06 |
| ශුද්ධවූ අල්කුර්ආනය කළ හාස්කම! | 23 |
| අලී බිලෝසින් | 32 |
| ස්වාමි ආනන්දා මුහිබ්බුල්ලාහ් වූයේ කෙසේද? | 43 |
| ඉස්ලාමය කරා උමර් රාචි | 65 |
| අබ්දුල්ලාහ් මනුලාල් | 71 |
| අබ්දුල්ලාහ් මනුලාල්ගෙන් ඔබටත් ඇරයුමක්! | 76 |
| අස්මා සිත්ති ෆර්සානා | 89 |
| ආමිනා අස්ලම් | 94 |
| කවිතා "නූර් ෆාතිමා" ලෙස | 99 |

# ප්‍රස්ථාවනාව

සියළු පැසසුම් හා ප්‍රශංසාවන් හිමිවන්නේ ලෝකය මවා එහි සියල්ල පාලනය කරමින් සිටින සර්ව බලධාරී අල්ලාහ්ටයි. ඔහුගේ ශාන්තිය හා සාමය මෙලොවට අවසන් වශයෙන් අවතීර්ණවූ මුහම්මද් නබි (සල්) තුමන්ට, එතුමන්ගේ පවුලේ ඥාතීන්ට හා මිත්‍රවරුන්ට හිමිවේවා!

මෙම විශ්වයෙහි නිර්මාතෘවරයා හා පාලකයා වන අල්ලාහ් ඉදිරියෙහි පිළිගනු ලැබූ එකම දහම ඉස්ලාම් වේ. එය ශුද්ධවූ අල්කුර්ආනය පහත සඳහන් ආකාරයට විස්තර කරයි:

"නියත වශයෙන්ම අල්ලාහ් ඉදිරියේ පිළිගනු ලැබූ (එකම) දහම ඉස්ලාම් වේ". (ශු අල්කුර්ආනය - 3: 19).

"කව්රුන් ඉස්ලාම් හැර වෙනත් දහමක් පිළිගනීද එය (අල්ලාහ්) ඉදිරියෙහි නොපිළිගනු ලබයි. තවද ඔහු මතු ලොවෙහි පරාජිතයකු බවටද පත්වෙයි." (ශු අල්කුර්ආනය - 3: 85).

මානවයා විසින් ඇති කරගත් වැරදි සංකල්පයන් පිළිපැදීමෙන් කිසිදු සුගතියක්, ජයග්‍රහණයක් ලබාගත නොහැක. අප සියල්ල මැවූ විශ්වයාධිපති ඉදිරියේ කුමන දහම පිළිගනු ලබයිද එයයි අපි අනුගමනය කළ යුත්තේ. ඉස්ලාම් යනු සකල ලොව හිමියන් අල්ලාහ් විසින් මානවයාට දයාදය කරනු ලැබූ ජීවන සැලස්මකි. ශුද්ධවූ අල්කුර්ආනය යනු අල්ලාහ් විසින් මානවයාට නිවැරදි මග පෙන්වීම සඳහා අවසන් ශාස්තෘවරයානන්



වන මුහම්මද් (සල්) තුමන්ට අනාවරණය කරන ලද ග්‍රන්ථයයි. එහි පරිශුද්ධත්වය, පිවිතුරු බව එලෙසම ආරක්ෂා වෙයි. එහි මුල් ස්භාවායට අබමල් රේණුවක තරම් හෝ කැළැලක් ඇති නොවීය.

ශුද්ධවූ අල්කුර්ආනය මගින් අල්ලාහ් මෙසේ පොරොන්දු වෙයි: "අපි මෙය (අල්කුර්ආනය) අනාවරණය කළෙමු. අපිම මෙය ආරක්ෂා කරමු." (ශු අල්කුර්ආනය - 15: 9). අවුරුදු 1400 ට පෙරම අල්ලාහ් විසින් දෙන ලද මෙම පොරොන්දුව ඒ ආකාරයටම ආරක්ෂාවීම ශුද්ධවූ අල්කුර්ආනය දේව ග්‍රන්ථයක් බවට පවතින හොඳම නිදසුනකි.

නමුත් ඊට පෙර ශාස්තෘවරුන්ට අනාවරණය වූ පුස්තක මුල් ස්භාවායෙන්ම ආරක්ෂා නොවීය. එම ශාස්තෘවරුන්ගේ ඇවෑමෙන් පසු එහි බොහෝ විකෘති කිරීම්, අඩු වැඩි කිරීම් සිදුවිය. ශුද්ධවූ අල්කුර්ආනය එය මෙසේ සඳහන් කරයි:

"යම් ස්වල්පවූ ලෞකික ආදායමක් අරමුණු කොටගෙන සිය දෑතින්ම ග්‍රන්ථයක් ලියා පසුව මෙය අල්ලාහ්ගෙන් යැයි ජනතාවට පවසන මොවුන්ට ශාපය! මෙය ලියූ මොවුන්ගේ සිය දෑත් වලටද අනර්ථය, තවද එමගින් ඔවුන් අත්පත් කරගන්නා ලාභ ප්‍රයෝජනද ඔවුන්ට විනාශය." (ශු අල්කුර්ආනය 2:79).

"පුස්තකය ගැනම දිව් හරවන්නාවූ පිරිසක් ඇත්තෙන්ම ඔවුන් අතර වෙති, එය පුස්තකයේ අන්තර්ගතව නොතිබීයේදී පුස්තකයෙන් යැයි ඔබ සිතනු පිණිසය. අල්ලාහ්ගෙන් නොතිබියදී එය අල්ලාහ්ගෙන් යැයිද

ඔවුහු කියන්නෝය. ඔවුහු දැනුවත්වම අල්ලාහ් කෙරෙහි බොරු කියන්නෝය.” (ශු අල්කුර්ආනය 3:78).

මෙවැනි පසුබිමක් තුළ මුළු ලෝක වාසි ජනතාවටම මග පෙන්වීමක් වශයෙන්, අනාවරණය කරනු ලැබූ ශුද්ධවූ අල්කුර්ආනය, තවද මුළු ලොවටම ශාස්තෘවරයකු වශයෙන් එවනු ලැබූ මුහම්මද් (සල්) තුමන්ව අනුගමනය කිරීමයි මානව සංහතියට අනිවාර්යය වන්නේ.

“මගේ සහෝදරයා වන මූසා (මෝසස්) (අලෛ) දැන් ජීවතුන් අතර සිටිය ද මා රැගෙන ආ මාර්ගෝප දේශත්වය පිළිපැදීම නියතය” යනුවෙන් නබි (සල්) තුමන් ප්‍රකාශ කළහ. (මූලාශ්‍රයන්: අහ්මද්, දාරමි).

අවසන් ශාස්තෘවරයා වන මුහම්මද් නබි (සල්) තුමන්ගේ ශාස්තෘ පදවිය කෙනෙකු පිළ නොගන්නා විට ඔහුට සුගතියක් නොමැත යනු ඉහත ප්‍රකාශයෙන් මොනවට තහවුරු වෙයි. කිතුවරුන් හා යුදෙව්වරුන් අවසන් ශාස්තෘවරයානන් වන මුහම්මද් නබි (සල්) තුමන්ගේ ශාස්තෘ පදවිය නොපිළිගනී. එයින් ඔවුන්ට අත්වන්නේ පරාජය පමණයි.

කෙනෙකුට තමන් කැමති දහමක් අනුව ජීවත් වීමේ නිදහස පැවතිය යුතුය. නමුත් ඉස්ලාම් දහම නිවැරදි ජීවන මග යනුවෙන් වටහාගත් බොහෝ සහොදරවරුන් එය පිළිගෙන ජීවත් වීමට අදි මදිකමක් දක්වති. මෙයට මූලික හේතුව වශයෙන් පවතින්නේ සමාජය ඔහුට එරෙහිව පෙළ ගැසෙයි දෝ යන චකිතය හා බියයි. ඇත්ත වශයෙන්ම මෙයින් විනාශයට පත්වන්නේ ඔහුගේ දෙලොව ජීවිතයයි. තාවකාලික හා අස්ථිර මෙලොව ජීවිතයෙහි සමහර ආශ්වාදයන් සඳහා



මරණින් මතු සදාතනිකවූ ජීවිතය කෙසේ විනාශ කර ගත හැකිද?

කෙනෙකු සිංහල බෞද්ධයෙකු වශයෙන් සිටීම සමාජය පිළිගන්නේ නම්, කෙනෙකු සිංහල කිතුවරයකු වශයෙන් සිටීම සමාජය පිළිගන්නේ නම්, මන්ද, කෙනෙකු සිංහල මුස්ලිමෙකු වශයෙන් සිටීම සමාජය නොපිළිගන්නේ? කෙනෙකු ඉස්ලාම් අනුව ජීවත් වීමට තීරණය කළ විට මන්ද ඔහුට වෛර කරන්නේ? මන්ද ඔහුට එරෙහිව පෙළ ගැසෙන්නේ?

ඉස්ලාම් දහම තම ජීවන සැලැස්ම වශයෙන් තෝරා ගත් විවිධ මට්ටමේ පුද්ගලයින්ගේ අත්දැකීම් මෙහි සඳහන් වේ. මෙසේ පොත් පිංචයක් සකස් කිරීමට අපි අදහස් කළේ, මෙය කියවන පාඨකයින් කුමන අභියෝග මැද්දේ වුවද සත්‍යවූ ඉස්ලාම් දහම තම ජීවන සැලැස්ම බවට පත්කර ගත යුතුයි යන අපේක්ෂාවෙනි.

මෙම පොත් පිංච ඔබේ අතට පත්වීම සඳහා නන් අයුරින් සහයවූ සියළු සහෝදරවරුන්ට මාගේ අවංක ස්තූතිය.

ඔබගේ හිතවත්

මුහම්මද් අස්හර් මුහම්මද් යූසුෆ්

(කැඳවුම්කරු)

විදේශිකයන් කැඳවීමේ හා මග පෙන්වීමේ කාර්යාලය

අල්ජුබෙල්.

# සෝෂියලිෂ සංකල්පයෙහි සිට ඉස්ලාම් කරා "බිලාල් ෆිලිප්ස්!"

**වත්මන් ඉස්ලාමීය ලෝකය තුළ නොදන්නා කෙනෙකු නැත යන තරමට ප්‍රචලිත වී සිටින ප්‍රවීන ඉස්ලාමීය විද්වතෙකු වන බිලාල් ෆිලිප්ස් නම් චරිතය, වසර 30 කට පෙර සෝශලිස වාදියෙකු වශයෙන් තමන් හඳුනාගෙන කළු ජාතිකයින් වෙනුවෙන් ඇප කැපවී සිටි චරිතයකි. එතුමන්ගේ ජීවිතයෙහි මෙතරම් සහ විපර්යාසයක් ඇති කිරීමට තුඩු දුන් හේතුන් මොනවාද?**

බිලාල් ෆිලිප්ස් කිතු පවුලක උපත ලැබූ කෙනෙකි. ක්‍රිකට් ක්‍රීඩාවට ප්‍රසිද්ධියක් උසුලන බටහිර ඉන්දිය කොදෙව් දූපතෙහි පිහිටා ඇති "ජමෙයිකා" නම් නගරයෙහි 1947 දී උපත ලැබුවේය. ඔහුගේ දෙමාපියන් දෙදෙනාම වෘත්තියෙන් ගුරුවරුන් විය. ඔහුගේ මුත්තා බයිබලය හදාරා කිතු ප්‍රචාරක කටයුතු කළ කෙනෙකි.

ෆිලිප්ස්ගේ පවුලේ උදවිය පරාර්ථකාමී හැඟීමෙන් යුතු අය විය. බල කිරීමකින් තොර තම මවත් සමග සෑම සති අන්තයකම ෆිලිප්ස් පල්ලියට ගොස් පැමිණෙමින් සිටියේය.

ෆිලිප්ස්ට වයස අවුරුදු 11 ක්ව පවතින විට ඔහුගේ පවුලේ උදවිය කැනඩාව බලා යන්නට විය. එවකට කැනඩාවෙහි ජීවත් වූ බහුතරයක් යුරෝපයෙහි හා වෙනත් රටවල්හි සිට පැමිණී උදවිය විය. යුරෝපයට හිමි කම් කියන අප කැනඩාවෙහි උසස් ජාතීන් යන



උඩඟුකම හා මමත්වය ඔවුන් තුළ පැවතුනි. මෙය කුඩා ළමයෙකුවූ ෆිලිප්ස්ගේ සිත් තුළ තදින් බලපාන්නට විය.

මිනිසුන් අතර සමානව නොසැළකීම ෆිලිප්ස් තුළ ලොකු බලපෑමක් ඇති කළේය. ෆිලිප්ස්ගේ දෙමාපියන් කෙතරම් වෙනස් කම් වලට මුහුණ පෑවේද යනු ඔවුන් විස්තර කළේය. මා අත් දුටු දේට වඩා මාගේ දෙමාපියන් පාසැල් අවදියේදී බොහෝ අසාධාරණ කම් වලට මුහුණ දුන්හ. යනු මා දැනගත්තෙමි යනුවෙන් ෆිලිප්ස් පවසයි.

කැනඩාවෙහි ජීවත්වූ කාල වකවානුවෙහි මුස්ලිම් සමාජයක් සමග කිසිදු සම්බන්ධකමක් ඔහුට නොතිබිනි. ෆිලිප්ස්ගේ දෙමාපියන්ට කැනඩාව හා කොළඹ යන ගිවිසුමක් මත මැලේසියාවෙහි ගුරු පත්වීමක් ලැබිනි. ප්‍රථම වරට මුස්ලිම් සමාජයත් සමග ඇසුරක් ඔහුට ලැබෙන්නේ එහි සිටින විටයි. කැනඩාවට වඩා මැලේසියාව තරුණ ෆිලිප්ස්ට සතුට ගෙන දෙන්නට විය. නමුත් මැලේසියාව මුස්ලිම් රටක් යන්නට කිසිදු සළකුණක් ඔහුට නොපෙනුනි.

බ්‍රිතාන්‍යයෙහි යටත් විජිත පාලනය යටතේ මැලේසියාව පැවතීම නිසා එම සළකුණු එහි පෙනෙන්නට විය. ෆිලිප්ස්ගේ මිත්‍රයින් වශයෙන් ඉංග්‍රීසි දන්නා ගුරුවරුන් හා ඉංග්‍රීසි දන්නා මැලේසියානුවන් සිටියේය. "රාක්" සංගීත කණ්ඩායමක් ඇති කර වෘත්තියක් වශයෙන් ගිටාර් වාදනය කරමින් ෆිලිප්ස් කාලය ගත කළේය.

මැලේසියාවෙහි සිටින කාල වකවානුවෙහි ෆිලිප්ස්ගේ දෙමාපියන් ඉන්දුනේසියානු මුස්ලිම් දරුවෙකු හදාගන්නට විය. ෆිලිප්ස්ගේ මවට ඉස්ලාම් පිළිබඳ සාමාන්‍ය දැනුමක් පැවතුනු නිසා එම දරුවාට සලාතය හා උපවාසය කරන ආකාරය පිළිබඳ කියා දුන්නේය. වරක් තම අළුත් සහෝදරයා සලාතය කරන එම දර්ශනය දුටුවේය. ඔහු වෙනත් චරිතයක් යන හැඟීම පමණක් ඔහු තුළ ඇතිවිය. එනමුත් ඔහුගේ ප්‍රතිපත්තීන් හා විශ්වාසයන් පිළිබඳ දැනගැනීමට ෆිලිප්ස් තුළ අදහසක් පහළ නොවීය.

ෆිලිප්ස් අධ්‍යාපනය ලබාගැනීමට එතරම් කැමැත්තක් නොදක්වා සංගීතය, ඒ වගේම තම සයිකලයෙන් කරක් ගැසීමට වැඩි අවදානයක් යොමු කිරීම නිසා ඔහුගේ අධ්‍යාපන කටයුතු අඩාල විය. එබැවින් ඔහුගේ දෙමාපියන් යළිත් වරක් ඔහුව කැනඩාවෙහි පිහිටි සෙමන් බ්රේසර් විශ්ව විද්‍යාලයෙහි අධ්‍යාපයන ලබාගැනීම සඳහා එව්වේය.

කැනඩාවෙහි 60 දශක අවසානයෙහි 70 දශකයේ මුල් අවදිය වන විට ශිෂ්‍ය සංගම් ප්‍රබල ලෙස ක්‍රියා කරන්නට විය. ෆිලිප්ස්ද එහි ක්‍රියාකාරි සාමාජිකයෙකු වශයෙන් තමන්ව බඳවා ගත්තේය. එවකට අලෙන්කින්ස්මේර්ක් තවද තිමෝති ලීයරියි වැනි ප්‍රබලයන් විසින් මත් ද්‍රව්‍ය හා හිප්පි සංවිධානය ප්‍රචලිත වෙමින් පැවතුනි, ගුරුවරු විසින්ම මත් ද්‍රව්‍යන් මිශ්‍ර කළ සිගරට් ශිෂ්‍යන්ට පිරිනමා එය සියළු අය බීමෙන් පසු විෂයයන් ඉගැන්වීම ආරම්භ කරන ලදි.



මෙවැනි පසුබිමක් තුළ පිලිෆ්ස් මා වෛද්‍යවරයකු හා කලාවේදියෙකු විය යුතුයි යනු සිහින මවන්නට විය. මේ සඳහා පිලිෆ්ස් ජීව රසායන විද්‍යාව (Bio- Chemistry) නම් විෂය ·තෝරාගත්තේය. කලා විශ්ව විද්‍යාලයකින් ආධාර මුදලක් ද ඔහුට ලැබිනි.

ෆිලිප්ස් තම සිහිනය සැබෑ කරගැනීමට පෙරාතුවම ශිෂ්‍ය දේශපාලනය තුළ ප්‍රබල ක්‍රියාකාරි සාමාජිකයකු විය. තමන්ගේ තරුණ අත්දැකීම් තුළින් බටහිර ලෝකය තුළ පවතින අඩු ලුහුඬුකම් පිරිමැසිය යුතුයි යනු ඔහු අධිටන් කළේය.

ගුරුවරු පංති කාමරවල ශෝසියල් වාදය හඳුන්වා දුන්හ. පිලිෆ්ස් කාල් මාක්ස් පිළිබඳ පුළුල්ව හැදෑරුවේය, ෆිල්ප්ස් ඔහුව මාක්ස්වාදියෙකු හා ලෙනින් වාදියෙකු යනුවෙන් හඳුනාගත්තේය.

නියම මාක්ස්වාදියෙකු හා ලෙනින් වාදියෙකු වශයෙන් තමන්ව හඳුනාගත් ෆිල්ප්ස්, කාල් මාක්ස්ගේ නිර්මාණයන් සියුම්ව කියවන්නට පටන් ගත්තේය. සමාජයෙහි යම් විපර්‍යාසයක් කළ හැකි සංකල්පය වශයෙන් ශොසියල් වාදය පිළිගනු ලැබිනි. අසාධාරණය තුරන් කර සමාජ සාධාරණත්වය ස්ථාපිත කිරීමට සහතිකයක් මේ සංකල්පය තුළින් දෙන ලද අතර, මෙම වෙනස් කම් විප්ලවයකින් කළ හැකි බවත් ඔවුන්ට උගන්වන ලදි යනුවෙන් ෆිලිප්ස් පවසයි.

කළු ජාතීන් මුහුණ දෙන ප්‍රශ්නවලට දේශපාලන විසඳුමක් අවශ්‍යයි යන පිපාසය ඔහු කැලිෆෝර්නියාව

කරා යන්නට බාධාවක් නොවීය. (එම පිපාසය ඔහු කැඳවාගෙන ගියේය) එහි කළු කොටි (බ්ලැක් බේන්තර්ස්) වැනි කළු ජාතීන්ගේ අයිතින් වෙනුවෙන් පෙනී සිටින සංවිධාන සමග ෆිලිප්ස් තමන්වද බැඳවා ගත්තේය. එම අත්දැකීම් පිළිබඳ ෆිලිප්ස් පවසන විට මෙම සියළු සංවිධාන කළු ජාතීන්ගේ අයිතීන් වෙනුවෙන් පෙනී සිටින සංවිධාන වේ. මෙහි ප්‍රබල නායකයන් වූයේද කළු ජාතීන්ය, එම යුගයෙහි කළු ජාතීන් මහත් අසාධාරණයන්ට ලක්වූ ජාතියක් විය. එබැවින් ඔවුන්ගේ හඬ නිදහස වෙනුවෙන්, තම අයිතීන් වෙනුවෙන් රැව් පිළිරැව් දෙමින් පැවතුනි. එනමුත් සුදු ජාතීන්ගේ පාසැල්හි අධ්‍යාපන ලැබූ සුදු ශිෂ්‍යන් පවා මෙම සංවිධානයන්ට තම පූර්ණ සහයෝගය ලබා දුන්නේය. ඉන් පසු මෙම සියළු පාර්ශ්වයන් සටන් ව්‍යාපාරවල නිරත විය. කාන්තා නිදහස් ව්‍යාපාර යනුවෙන් සම ලිංගික සේවණ සංවිධානයන් බිහිවෙන්නට පටන් ගත් බව ෆිලිප්ස් පවසයි.

කාලය මෙසේ ගතවීමත් සමග තමන් තුළ යම් පිළිකුල් බවක් ඇති වූ බව පිලිෆ්ස් පවසයි. සංවිධානවල සිටි බහුතර සාමාජිකයන් මත් ද්‍රව්‍යන්වලට ඇබ්බැහිවී සිටියේය. ආරක්ෂක අංශ වෙනුවෙන් යනු පවසා ජනතාවගෙන් ආධාර එකතු කර එම මුදල සාදයන්, මත් ද්‍රව්‍යන් සඳහා වැයකරන්නට පටන් ගත්හ. ජනතාවගේ ආධාරවලින් යැපෙන්නන් බවට මොවුන් පත්වූහ. මේ සියල්ල ෆිලිප්ස්ගේ සිත් තුළ දැඩි කලකිරීමක් ඇති කළ ක්‍රියාවන් විය.

මෙම කාල වකවානුවෙහි "නේෂන් ඕෆ් ඉස්ලාම්" යන නමින්ද කළු ජාතීන්ගේ අයිතීන් වෙනුවෙන්



සංවිධානයක් පැවතුනි. මොවුන් කළු මුස්ලිම් වරු යනුවෙන් අමතන ලදි. මෙම සංවිධානයේ නිර්මාතෘවරයා වූයේ "එලිජා මුහම්මද්" ඉස්ලාමීය නම ඔවුන් භාවිතා කළත් සැබෑ ඉස්ලාමීය ප්‍රතිපත්තිවලින් ඔවුන් මුළුමනින් වෙන්ස් වී සිටියේය.

කළු ජාතීන් පරිශුද්ධ වන්තයින්, සුදු ජාතීන් යක්කු යනුවෙන් එලිජා ප්‍රචාරය කළේය. දෙවිවරු අතුරින් මහත් දෙවිවරයා තමන්ට ඇවිත් උපදෙස් කළ බවත්, තමන් දෙවියන්ගේ දූතවරයා බවත් එළිජා හා එහි සාමාජිකයින් ප්‍රචාරය කරමින් සිටියේය.

එලිජා මුහම්මද්ගේ සංවිධානයෙහි සාමාජිකයකුව සිට පසුව එයින් පිටත්වූ මැල්කම් එක්ස්ගේ ස්වයං චරිතාපදනය යන කෘතියට ජනතාව අතර හොඳ පිළිගැනීමක් තිබුනි. නේෂන් ඔෆ් ඉස්ලාම් සංවිධානයෙහි ඉතා වැදගත් සාමාජිකයකු වූ මැල්කම් එක්ස් සැබෑ ඉස්ලාම් පිළිබඳ නිසි දැනුමක් ලබාගැනීමෙන් පසු එම සංවිධානයෙන් ඉල්ලා අස්වී ඉස්ලාම් දහම පිළිගත්තේය. මෙම සිද්ධිය වී මාස හයක් ගත වීමටත් පෙර මැල්කම් එක්ස් ඝාතනය කරනු ලැබිනි. සැබෑ වූ ඉස්ලාම් දහම තමන්ට තිබුනු කථික හැකියාවෙන් ප්‍රචාරය කිරීමට පෙරම මැල්කම් එක්ස් ඝාතනය කරනු ලැබුවේය. එබැවින් ඔහුගේ ස්වයං චරිතාපදනය කියවූ උදවියට පමණක් ඔහුගේ ගමනෙහි වැදගත්කම පිළිබඳ අවබෝධකරගන්නට හැකිවූයේය.

මැල්කම් එක්ස්ගේ ස්වයං චරිතාපදනය කියවූ ෆිලිප්ස්, නේෂන් ඔෆ් ඉස්ලාම් සාමාජිකයින්ගේ ආගමික

ස්ථානයට දවසක් පැමිණියේය. එම සංවිධානයෙහි සාමාජික කාන්තාවන් වැදගත් විදිහට ඇඳුම් ඇඳ සිටීම ඔහු ආකර්ෂණය කළත් එම සංවිධනායෙහි ප්‍රතිපත්තීන් පළක් නැති බව ෆිලිප්ස් සිතුවේය.

1975-හි එලිජා මුහම්මද් මිය යෑමත් සමග, ඔහුගේ පුතා වරීදුද්දීන් මුහම්මද්, නේෂන් ඔෆ් ඉස්ලාම් සංවිධානයෙහි මූලික වෙනස්කම් රාශියක් කළේය. කාලෝචිතව කරනු ලැබූ මෙම වෙනස් කම් නිසා නේෂන් ඔෆ් ඉස්ලාම් සංවිධානය අන්තවාදී සංවිධානයක් යන තත්ත්වයෙන් මිදී, සැබෑවූ ඉස්ලාමීය සංවිධානයක් අසලට ගෙන ඒමට ඔහු සමත්විය.

කළු ජාතීන්ගේ පරම අභිලාෂයන් ඉටු කරගැනීමෙහිලා ඇමෙරිකාවෙහි ක්‍රියාත්මක වූ කළු ජාතීන්ගේ සංවිධාන කිසිදු පිටුවහලක් නොවනු ඇත යනුවෙන් සිතූ පිලිෆ්ස්, ඇමෙරිකාවට පැමිණි අරමුණ මුදුන්පත් කරගැනීමට නොහැකි බව සිතා යළි කැනඩාවටම යන්නට විය.

විශ්ව විද්‍යාලයෙහි අවුරුදු දෙකක කාලයක් නිම කර සිටි පිලිෆ්ස්, අධ්‍යාපනය දිගටම පවත්වාගෙන යෑමට නොහැකිව එයින් පිටත්විය. ටොරන්ටෝව මුල්කොට ගෙන ක්‍රියාත්මක වෙන සෝෂියලිස පක්ෂයක තමන්වද සාමාජිකයකු කරගත්තේය.

70- දශක ආරම්භයෙහි ඇමෙරිකාවෙහි සිට හා බටහිර ඉන්දිය කොදෙව් දූපතෙහි සිට කළු ජාතීන් වැඩි සංඛ්‍යාවක් කැනඩාවෙහි පදිංචිවෙන්නට පටන් ගත්හ. පවතින සමාජ ක්‍රමය තුළ කළු ජාතීන්ගේ තත්ත්වය



පිළිබඳ ඔවුන් දැනුවත් කිරීමේ කර්තව්‍යයෙහි බිලාල් හා එම සංවිධානයෙහි සාමාජිකයින් දැනුවත් කරමින් සිටියේය.

කළු ජාතීන්ට අසාධාරණයක්වූ කැනඩානු නීති මාලාවෙහි සංශෝධන ගෙන ඒමේ කාලීන අවශ්‍යතාවය පිළිබඳ ද කළු ජාතීන් දැනුවත් කරමින් සිටියේය. සෝශියලිස සංවිධානය පවත්වන හමුවල පිලිෆ්ස් අප්‍රිකානු ඉතිහාසය පිළිබඳ හා, සමාජ සංවිධාන පිළිබඳ ද පහදා දුන්නේය. තමන්ට ඇති සහජ සංගීත හැකියාව පෙන්වමින් පිලිෆ්ස් තම සංවිධානයට මුදල් එක් රැස් කළේය. ඔහුගේ සිතුවම්. ඇඳීමේ හැකියාවද මේ වෙනුවෙන් උපයෝගි කරගත්තේය. තම කලාත්මක හැකියාව, දේශපාලන විකට චිත්‍ර නිර්මාණ කිරීම සඳහා, දේශපාලන ප්‍රචාරක පුවරු නිර්මාණය කිරීම සඳහාද ඔහු උපයෝගි කළේය.

පිලිෆ්ස් කොමියුනිස්ට් වාදය කෙරෙහි දැඩි සේ ඇළුම් කරන්නට විය. වෘත්තීය අවස්ථාවන්ගෙන් සමන්විත ඇමරිකාව වැනි රටක විප්ලවයක් ඇති කිරීමට නම් චීනයෙහි හා රුසියාවෙහි අනුගමනය කරනු ලැබූ ක්‍රම උපායන් පළක් නොදෙනු ඇත. එබැවින් නව ක්‍රම උපායන් ඒ සඳහා සෙවිය යුතුයි යනු එවකට පැවතුනු දේශපාලන චින්තනය විය. චීනයෙහි හා රුසියාවෙහි විප්ලවය ඇති වීමට මහත් රුකුලක් වූයේ ගම්බද ජීවත් වූ ගොවීන් ය. නමුත් උතුරු ඇමෙරිකාවෙහි නාගරික පෙදෙස්වල සිට සටන් ව්‍යාපාර දියත් කළ යුතු බවත්, මෙය නාගරික ගරිල්ලා සටනක් වශයෙන්

පැවතිය යුතුයි යනුවෙන් එවකට සාකච්ඡාවට බඳුන් වූ ප්‍රධාන මාතෘකාවන් විය.

නාගරික ගරිල්ලා සටන් ක්‍රමය සාර්ථක වීමට නම් නගර මායිම්වල කඳවුරු බැඳිය යුතු අතර, මෙම කඳවුරු ජංගම ඒවා විය යුතු බවත් පිලිෆ්ස්ගේ සංවිධානය උපක්‍රම යෙදූහ. මෙම සටන් ව්‍යාපාරයෙහි වාහන අත්‍ය අවශ්‍ය වූ අංගයක් බව සළකනු ලැබිනි. වාහන පිළිබඳ කාර්මික දැනුම තිබීමත් අවශ්‍ය බව තීරණය කරන ලදි. එබැවින්, වාහන කාර්මික අංශය පිළිබඳ දැනුම ලබා ගැනීම සඳහා වෘත්තිය පුහුණු මධ්‍යස්ථානයකට පිලිෆ්ස් ගියේය.

පිලිෆ්ස්ගේ දේශපාලන වැඩ කටයුතු වලට ඔහුගේ දෙමාපියන්ගෙන් දැඩි විරෝදයක් මතුවිනි. දේශපාලනය පිළිබඳ පිලිෆ්ස්ගේ පියා හා පිලිෆ්ස් අතර දැඩි සංවාදයන් විටින් විට පැවතුනි. තත්ත්වය උග්‍රවන විට ඇගේ මව මැදිහත්වී සමතයට පත්කරන අවස්ථාද එමටය. තාවකාලිකව තම නිවසෙහි නවාතැන් ගත් පිලිෆ්ස්, පසුව තම නිවසින් පිටත් වී තමා මෙන් යොවුන් වියෙහි පසුවූ තරුණයින් සමග පොදු සමාජ ශාලාවෙහි (Commune) නවාතැන් ගත්තේය.

කාලයක් ගත වීමත් සමග තමන් සමග වැඩ කරන්නන්ගේ ක්‍රියා කලාපය හා තම ක්‍රියා කලාපයන් අතර පැහැදිලි වෙනසක් ඔහු දැක්කේය. මෙම පරස්පරතාවයන් බහුලව පැවතුනේ විනයත් සමග බැඳුනු කරුණු වලයි. තම සගයන් අළුත් සමාජයක්



ගොඩ නැගීමට පෙරුම් පිරුවද තමන්ව වෙනස් කරගැනීමට ඔවුන් සූදානම් නැති බව පිලිෆ්ස් දුටුවේය.

සෝෂියලිස වාදය පිළිබඳ සමහර ප්‍රශ්න ඔහුගේ සිත් තුළ යම් තෙරපීමක් ඇතිකළේය. මෙහි ඉතා වැදගත් වූයේ, අළුත් සමාජයක් බිහිකිරීම සම්බන්ධයෙන් පවතින සෝසියලිස් වාදයෙහි හැකියාව පිළිබඳවයි. කොමියුනිස්ට් වාදය හා, සෝෂියලිස් වාදය ඉදිරියෙහි විනය පිළිබඳ න්‍යායන් තිබෙන බව නොපෙනුනි. බහුතරයක් මත් පැන් පානය, සම ලිංගික සේවනය, බාල අතවරයන් ආදී ක්‍රියාවන් විනයත් සමග සම්බන්ධවූ කරුණු ලෙස පිළිගැනීම නිසා එවැනි ක්‍රියාවන් කිසිදු බාධාවකින් තොර නිදහසේ සිදුවෙමින් පැවතුනු බව පවසන පිලිෆ්ස් මෙය මා බොහෝ සේ කළ කිරීමට ලක්වුනු ක්‍රියාවන් විය.

මෙම කාල වකවානුවෙහි ගරිල්ලා සටන් ක්‍රමය හැදෑරීම සඳහා චීනය බලා යෑමට පිලිෆ්ස් තීරණය කළේය. මෙයට අවශ්‍ය කරන උපදෙස් ඔහු එක්රැස් කරමින් සිටින විට, තමන් නියෝජනය කළ සෝෂියලිස සංවිධානයෙහි මධ්‍ය කාරක සභාවෙහි උසස් සාමාජිකාවක් වශයෙන් හා කොමියුනිස්ට් සංකල්පය තුළ ප්‍රබල සාමාජිකාවක් සේ සිටී කාන්තාවක් ඉස්ලාම් දහම වැළඳගත් පුවත පිලිෆ්ස්ට ආරංචි විය. මෙම කාන්තාව ඉදිරිපත් කළ මාර්ක්ස්, ලෙනින් වාදය පිළිබඳ අදහස් කෙරෙහි පිලිෆ්ස් බොහෝ දුරට ආකර්ෂණය වී සිටියේය. නමුත් දැන් ඇය ඉස්ලාම් දහම වැළඳ ගත් පුවත ආරංචි වී ඉස්ලාම් ඇයව කෙසේ ආකර්ෂණය කරන්නට ඇත්ද? යනු දැනැගනීම පිණිස පිලිෆ්ස්

ඉස්ලාම් පිළිබඳ පොත් පත් කියවන්නට පටන් ගත්තේය.

ඊජිප්තුවෙහි ක්‍රියාත්ම වෙමින් තිබුනු "ඉඛ්වානුල් මුස්ලිමූන්" යන මුස්ලිම් සහෝදරවරුන්ගේ සංවිධානයෙහි ඉතා ප්‍රබල නායකයකු වූ සෙයියිද් කුතුබ්ගේ සහෝදරයා මුහම්මද් කුතුබ් ලියූ ,ෂික්ප ඔයෑ එසිමබෑරිඑදදා ඍකසටසදබ, (වැරදිව අවබෝධකරගත් දහම ඉස්ලාම්) යන කෘතිය ප්‍රථමයෙන් පිලිෆ්ස් කියවන්නට විය.

මුහම්මද් කුතුබ්ගේ මෙම කෘතිය, සමාජීය, ආර්ථික, සාරධර්ම කෝනයන්ගෙන් ඉස්ලාම් සෝසියලිසම්, කොමියුනිස්ට් වාදය වෙනත් ධන වාදයත් සමග සංසන්දනාත්මකව ගවේෂණයක් කර තිබුනි. අධ්‍යාත්මික වශයෙන් පමණක් අවදානය යොමු කරන කෙනෙකුට මෙම කෘතිය වැදගත් නොවූවත්, පිලිෆ්ස් වැනි දේශපාලන පන්නරයක් තුළ වැඩුනු අයට ලොකු බලපෑමක් කරන කෘතියක් වශයෙන් මෙය පැවතුනි.

බටහිර සමාජය තුළ සමාජීය, ආර්ථික විප්ලවයක් ඇති කිරීමට ඉස්ලාම් පමණයි එකම විසඳුම යන විශ්වාසය පිලිෆ්ස් තුළ තදින්ම ඇති කිරීමට මුහම්මද් කුතුබ්ගේ මෙම කෘතිය බොහෝ දුරට සමත්විය. ඉස්ලාම් පිළිබඳ ඉංග්‍රීසියෙන් නිමවූ හැම කෘතියක්ම පිලිෆ්ස් කියවන්නට පටන් ගත්තේය. දෛනික, සමාජීය, ආර්ථික විප්ලවයක් පුද්ගලයන් තුළ ඉස්ලාම් ඇති කිරීම දැක පිලිෆ්ස් මවිතයට පත්විය.



මුස්ලිමෙකු වීමට නම් සම්පූර්ණයෙන් වෙනස් විය යුතුයි. සම්පූර්ණ නොවූ වෙනසකින් කිසිදු පළක් නැත යන තීරණයකට පිලිෆ්ස් එළඹිය. "මාගේ ජීවිතය එදා පටන් යම් පාලනයකිනුයි පැවතුනේ. එබැවින් ඉස්ලාම් පනවන විනය ගරුක සීමාවන් මට බාධාවක් නොවීය. නමුත්, ඉස්ලාම් දහමට ඇතුල් නොවී සිටීමට ෂෛතාන් විවිධ බාධාවන් ඇති කළේය. එම කාලයෙහි ඉඳ හිට හෝ මත් පැන් පානය කිරීමේ, දුම් පානය කිරීමේ පුරුද්ධක් මට තිබුනි. මෙවැනි ආශ්වාදයක් ගෙන දෙන ක්‍රියාවලින් නුඹ මිදෙන්නෙද්? මෙවැන් අවස්ථා නුඹ අත්හරින්නටද යන්නේ? යන හඬක් මා තුල රැව් පිළිරැව් දෙමින් තිබුනි.

මෙය මා තුළ යම් පීඩනයක් ඇති කළ අතර මාගේ ඉස්ලාමීය වෙනසට ද යම් ප්‍රමාදයක් ඇති කළ බව පිලිෆ්ස් කියයි.

දේශපාලනික වශයෙන් ඉස්ලාමීය චින්තනයන් ඔහු තුළ ලොකු විපර්යාසයක් ඇති කළ, නමුත් අධ්‍යාත්මික වශයෙන්, දෙවියන්, ජින්වරුන්, දේවදූතයින් පිළිබඳ ඉස්ලාමීය ප්‍රතිපත්තීන් පිළිගැනීම පිලිෆ්ස්ට තරමක් දුරට අපහසු විය.

පිලිෆ්ස් පවසයි: "මාගේ සිතෙහි දෙවියන් පිළිබඳ අපැහැදිළි දර්ශනයක් පැවතුනි. නමුත් එයද දෙවියන්ව මුළුමනින් ප්‍රතික්ෂේප කිරීමට උගන්වන කොමියුනිස්ට් වාදය නිසා මාගේ සිතෙන් මුළුමනින් සේදී ගොස් තිබුනි. මාගේ විද්‍යාත්මක පසුබිමත් දෙවියන් පිළිගැනීමට මට බාධාවක් විය.

දිනක් රාත්‍රියෙහි පිලිෆ්ස් බයානක හීනයක් දැක්කේය. මෙයින් ඇතිවූ බලපෑම නිසා ශුද්ධවූ අල්කුර්ආනය හොඳින් අධ්‍යයනය කළ යුතුයි යන තීරණයකට පිලිෆ්ස් එළඹිය.

තම සිතෙහි දෙවියන් පිළිබඳ පහළවූ සැකයන්ට නිසි පිළිතුරු ශුද්ධවූ අල්කුර්ආනයෙහි දැක ඔහු මවිතයට පත්විය. ඔහු දුටු හීනයෙහි ඔහු මිය යන බව දැක්කේය. ශුද්ධවූ අල්කුර්ආනයෙහි මතු සඳහන් පාඨය ඔහුගේ සිත තුළ බොහෝ දුරට ලොකු බලපෑමක් කරන්නට විය.

"ප්‍රාණයන් මරණයට පත්වන විටත්, මරණයට පත් නොවී ප්‍රාණයන් නින්දෙන් පසුවෙන විටත් අල්ලාහ් අත්පත් කරන්නේය. කුමක් සඳහා මරණය නියම කළේද එය තමන් සතුව පවත්වාගෙන, සෙසු (ප්‍රාණයන්) නියමිත කාලයක් (ජීවත් වීම) සඳහා මුදවා හරින්නේය. කල්පනා කරන ජනයාට මෙහි විවිධ සාක්ෂීන් ඇත." (ශු අල්කුර්ආනය 39-42).

ශුද්ධවූ අල්කුර්ආනයෙහි දෙවියන් පිළිබඳ සඳහන් කරුණු ඔහු තුළ දේව විශ්වාසය තදින්ම ඇති කළේය. අවසානයේදී 1972 හි පෙබ්‍රවරි මස ඉස්ලාම් දහම වැළඳගත් ඔහු තමන්ට බිලාල් යනුවෙන් නම තබාගත්තේය.

ඉස්ලාම් තම ජීවන ක්‍රමය වශයෙන් තෝරාගැනීමෙන් පසු සංගීත භාණ්ඩ උපයෝගි කිරීම මුළුමනින් ඔහු



අත්හැරියේය. ඒ වගේම සිතුවම් ඇඳීමද ඔහු අත්හැරියේය. තම මුළු කාලයම ඉස්ලාම් පිළිබඳ දැන ගැනීම සඳහාම වැය කළේය. අරාබි මාධ්‍යය හදාරා කෙටි කලකින් අල්කුර්ආනය කියවන තත්ත්වයට තමන් දියුණු කරගත්තේය.

අරාබි මාධ්‍යය හා, ඉස්ලාමීය නීති රීතීන් ඉජිප්තු ජාතියෙකුගෙන් ඔහු හැදෑරුවේය. මෙම ඉජිප්තු ජාතිකයාගේ පියා ආගමික විද්වතෙකු වූ අතර, ඉහ්වානුල් මුස්ලිමූන් සංවිධානයෙහි සාමාජිකයකුද විය.

විවිධ කෝනවලින් ඉස්ලාම් පිළිබඳ දැනුම පිලිෆ්ස් ලබා ගත්තේය. නමුත්, ඉස්ලාම්හි කේන්ද්‍රස්ථානයක් වශයෙන් සැළකෙන සවුදි අරාබියාවට ගොස් ඉස්ලාම් දහම හැදෑරිය යුතුයි යන ආශාව ඔහු තුළ විය. මදීනාවෙහි පිහිටි ඇති විශ්ව විද්‍යාලයෙන් ඔහුට අනුමැතිය ලැබීමෙන් පසු ඔහු සවුදි බලා පිටත්වී ගියේය.

පිලිෆ්ස් සවුදි අරාබියාවට දැනුම සොයා ගිය අවසථාවෙහි මදීනා විශ්ව විද්‍යාලයෙහි ජීවන තත්ත්වය ඉතා දිළිඳු මට්ටමකයි පැවතුනේ. සෙබළුන් හැර ගිය කඳවුරුයි එහි අධ්‍යාපනය ලබන ශිෂ්‍යන්ගේ නවාතැන් වූයේ. දැඩි සීතල කාලයෙහි උණු ජලය හෝ, දැඩි උශ්නත්වය පවතින කාලයෙහි, වායු සමීකරණ පහසුකම් හෝ ශිෂ්‍යන්ට නොවීය. බිලාල් නවාතැන් ගත් ස්ථානයෙහි දෙවරක් ඔහුව ගෝනුස්සන් දෂ්ට කරන්නට විය. නමුත් අල්ලාහ් කෙරෙහි මුළුමනින් විශ්වාසය තබා තම අධ්‍යාපනික කටයුතු දිගටම පවත්වාගෙන ගියේය.

මදීනා ඉස්ලාමීය විශ්ව විද්‍යාලයෙහි බිලාල් අවුරුදු හයක කාලයක් සිප් සතර හැදෑරුවේය. අරාබි දරුවන්ට, ඉංග්‍රීසි දැනුම හා කරාටි පුහුණුව ඔහු ලබා දුන්නේය. ඉන් පසු රියාද් හි පිහිටා ඇති "රජු සවූද්" විශ්ව විද්‍යාලයට එක්වී විශාරද උපාධිය (master Digiri) කළේය. තම දෙමාපියන්ද සවුදි රටට ගෙන්වා ගත්තේය. මිනාරතුල් රියාද් ජාත්‍යන්තර පාසැලෙහි ගුරු වෘත්තිය සඳහා ඔවුන් බැඳුනහ. තම විශාරද උපාධි (master Digiri) පංති සවස් වරුවේ පැවතුනු නිසා බිලාල් තම විවේකි කාලය තුළ මිනාරතුල් රියාද් පාසැලෙහි ඉස්ලාමීය ගුරුවරයකු වශයෙන් කටයුතු කළේය.

පාසැලෙහි බිලාල්ගෙන් ඉටුවූ සේවාව ඉතා මහඟුය. මෙම පාසැලෙහි අධ්‍යාපනය ලබාගත් ළමුන්ගෙන් බොහෝ අය වෙනත් රටවල්වල සිට සවුදි රාජ්‍යට රැකියාවන් සඳහා පැමිණි අයගේ දරුවන් වේ. පාසැල් අධ්‍යාපන ක්‍රමය ඉංග්‍රීසි දන්නා ශිෂ්‍යන්ට උචිත ආකාරයට බිලාල් සැකසුවේය. විෂයන් සමග සම්බන්ධ පොත් පහක් ඔහු නිර්මාණය කළේය.

බටහිර සංස්ස්කෘතියට ආවැඩූ මුස්ලිම් ශිෂ්‍යන්ගේ සිතෙහි පැන නැගෙන ප්‍රශ්න සියල්ලටම බිලාල් තම පංතියේදී පිළිතුරු සපයන්නේය. ශුද්ධවූ අල්කුර්ආනය, හදීස්, තර්කන වාදය තුළින් ඔහු පිළිතුරු දෙයි. තම ගුරු වෘත්තිය පිළිබඳ පවසන විට "මාගේ ශිෂ්‍යන් අතුරින් 15 සිට 20 දක්වා වූ දරුවන් තම රටවල් වලට



ඉස්ලාම් කෙරෙහි පුළුල් විශ්වාසයක් තබමිනුයි හැරෙන්නේ. එහි ගොස් ඉස්ලාමීය ප්‍රචාරක කටයුතු හොඳින් කරති. මාගේ ශිෂ්‍යන් අතුරින් සමහරුන් මුස්ලිම් නිවස්වල සිට පැමිණියත් අද්වේවාදය ඔවුන් තුළ මුල් බැස ගෙන තිබුනි. පංතිවලට සහභාගී වී දැනුම ලබා ගැනීමෙන් පසු නියම ක්‍රියාකාරි මුස්ලිමෙකු වශයෙන් ඔවුන් පරිවර්තනය වීම මා තුළ ඉමහත් සතුටක් ගෙනදෙයි. ඔවුන්ට ඉගැන්වීම සඳහාවූ පෙර සූදානම මට වෙහෙසක් ගෙන දුන්නද මෙම දර්ශනයන් මට ඒ සියල්ල අමතක කර දමයි යනුවෙන් බිලාල් පවසයි.

ෂියියා සංකල්පය පිළිබඳ අල්කුර්ආනය හා අල් හදීසය කෝනයෙන් අරාබි මාධ්‍යයෙන් සැකසුනු කෘතීන් තුනක් ඉංග්‍රීසි බසින් බිලාල් පරිවර්තනය කළේය. "ඉස්ලාමිහි බහු විවාහ ක්‍රමය" යන මෑයෙන් තවත් කෙනෙකු සමග එක් වී කෘතියක් ලියා ඇත. ශුද්ධවූ අල්කුර්ආනයෙහි 49 වැනි අල්හුජුරාත් පරිච්ඡේදයට විවරණය, "ෆික්හ් නීති රීතින්හි පූර්විකාව" "තව්හීද්" ආදී විවිධ කෘතීන් නිර්මාණය කර ඇත.

බිලාල්ගේ කලාත්මක හැකියාව යළි වරක් හිස එසවූ නමුත්, එය අරාබි විචිත්‍ර කළා නිර්මාණය සඳහා පමණක් උපයෝගි කරගත්තේය.

ඉස්ලාම් වෙනුවෙන් ඉටු කිරීමට බොහෝ දේ ඇති බව බිලාල් සිතයි. ග්‍රීස්ම සෘතුවේ ඇමෙරිකාවෙහි හා කැනඩාවෙහි ඉස්ලාම් දහම ප්‍රචාරය කිරීම සඳහා ඔහු වැය කරයි. මධ්‍ය හා දකුණු ඇමෙරිකාවෙහි, තවද

බටහිර ඉන්දිය කොදෙව් දූපත්වලද ඉස්ලාමීය ප්‍රචාරය සඳහා කාලය වැය කරයි.

නිවාඩුව ගත කිරීමට කාලයක් නැත. කාලය කෙතරම් කෙටිද යනු ඔබට හැඟෙන විට ඉස්ලාම් වෙනුවෙන් ඉටු කළ යුතු දේ පර්වතයන් මෙන් තිබීම ඔබ දකිනු ඇත. යනුවෙන් පවසන බිලාල් ඉස්ලාම් වෙනුවෙන් ඇප කැපවී කටයුතු කරයි. ඔහුගේ කෘතීන් විවිධ භාෂා වලට පරිවර්තනය වී ඇත. ඉස්ලාම් පිළිබඳ මනා අවබෝධයක් ලබා දෙන ඔහුගේ වෙබ් අඩවියක්ද ඇත.

එහි ලිපිනය නම්: www.bilalphilips.com .



## ශුද්ධවූ අල්කුර්ආනය කළ හාස්කම!

**"කේට් ස්ටීවන්ස්"** පොප් සංගීත ලෝකයෙහි නම් දරා සිටි සුප්‍රසිද්ධ ඉංග්‍රීසි ගායකයකි, ඔහුගේ ජීවිතයෙහි ඔහුට අවශ්‍ය කරන ප්‍රසිද්ධිය හා මිළ මුදල්, සම්පත් හිමිවිය. නමුත් ඔහු තුළ පැන නැගුනු ප්‍රශ්න වැළකටයි නියම පිළිතුරු නොලැබුනේ. විවිධ නිර්මාණයන් ඔහු කියවන්න පටන් ගත්තේය, ඔහු සොයන්නට විය, නමුත් ඔහු පැතූ දේ එයින් නොලැබිනි.

දවසක් එක් කුස උපන් ඔහුගේ සහෝදරයා ඔහු තුළ පැන නැගුනු පැනයන්ට නියම පිළිතුරු ලැබෙන ජීවමාන හාස්කමක් ලබාදුන්නේය. ඔහු එය කියවන්න පටන් ගත්තේය, එහි අන්තර්ගත කරුණු අධ්‍යයනය කළේය. අවසානයේදී ඔහු "යූසුෆ් ඉස්ලාම්" යනුවෙන් අළුත් පරිච්ඡේදයක් පෙරලන්නට විය.

**ඔහුගේ මෙම වෙනස පිළිබඳ ඔහුගේ මුවින්ම අසමු.**

ආඩම්බරයන් වලින් පිරුනු නවීන ලෝකයක මා වැඩුනෙමි. විනෝදය ව්‍යාපාරය කරගත් උසස් තලයක සිට සුඛෝපබෝගී ජීවිතයක් ගතකරමින් ජීවත්වුනෙමි, කිතු පුවලක උපත ලැබුවෙමි.

උපත ලබන සෑම දරුවෙකුම ස්වභාවික දහම තුළයි උපත ලබන්නේ ඔවුන්ගේ දෙමාපියනුයි තම තමන්ගේ දහම්වලට ඔවුන්ව මාරු කරන්නේ යනු අපි දැන සිටින කරුණකි. ඒ අනුව මාද කිතු වරයෙකු වශයෙන් හැඩ ගස්සනු ලැබූ අතර ඒ පසුබිම තුළ සිටයි මා කල්පනා

කළේ. දෙවියන් සිටින බව මට උගන්වන ලදි, නමුත් එම දෙවියන් සමග සෘජුව සම්බන්ධතාවන් ගොඩනැගීමට නොහැක. යේසුස් වහන්සේ මගිනුයි දෙවියන් සමග සම්බන්ධතාවන් ගොඩ නැගිය හැක්කේ, දෙවියන් හමුවන දොරටුව යේසුස් වහන්සේ යනුවෙන් මට කියන ලදි. මෙම ප්‍රතිපත්තිය පිළිගෙන මා ජීවත් වූයෙමි.

නමුත් එයට මුළුමනින් එකඟවීමට මට නොහැකි විය. යේසුස් වහන්සේගේ ප්‍රතිමාවන් කෙරෙහි මා අවදානය යොමු කළෙමි, ඒ සියල්ල මට පෙනුණේ අජීවි ගල් වශයෙනුයි. දෙවිවරු තිදෙනෙකු යනුවෙන් පැවසූ විට මා තුළ නවත් ප්‍රශ්න රාශියක් මතුවෙන්නට විය. නමුත් මට සංවාදයන් පැවැත්වීමට නොහැක. මා මේ සියල්ල විශ්වාස කළෙමි, මන්ද මාගේ දෙමාපියන්ගේ විශ්වාසයට ගරුකිරීම මාගේ යුතුකමක් නිසා.

නමුත් කෙමින් කෙමින් මෙම ආගමික විශ්වාසයන්ගෙන් මා ඈත්වෙමින් සිටියෙමි. සංගීතයට නැඹුරුවුනෙමි ප්‍රසිද්ධ තරුවක් වශයෙන් බැබලිය යුතුයි යනු මාගේ අපේක්ෂාව විය. මා දුටු සිනමාව හා විද්‍යුත් මාධ්‍යන් මා ඒ කරා තල්ලු කළ අතර එය මාගේ සිත ආක්‍රමණය කළේය. මුදල් ඉපැයීමයි දෙවියන් යනුවෙන් සිතන්න පටන් ගත්තෙමි.

ලස්සන සුඛෝපබෝගි කාරයකට හිමිකම් කියන මාගේ ඥාතියෙකු සිටී, ඔහු තම ඉලක්කය සපුරාගත් බව මා සිතුවෙමි. ඔහු මිළ මුදල් සම්පත් වලට හිමිකම් කියන කෙනෙකි යනු මාගේ **සිත** කියයි. මා වටා සිටියවුනුත්



මෙයයි ජීවිතය, මුදලයි දෙවියන් වන්නේ යන හැඟීම මාගේ සිත තුළ වැපිරුවේය.

වැඩි වශයෙන් මුදල් උපයා සුඛෝපබෝගි ජීවිතයක් ගත කළ යුතුයි යන තීරණයකට එළඹුනෙමි. පොප් ගායකයින්වයි මා උසස් කොට සැළකුවේ. මා ගීත නිර්මාණය කිරීමට පටන් ගත්තෙමි.

නමුත් මාගේ සිත තුළ සෙසු අය පිළිබඳ ද ආදර හැඟීමක් පැවතුනි. මා පොහොසතෙකු වූවා නම් දුප්පත් අසරණයින්ට උදව් උපකාර කළ යුතුයි යන හැඟීම මා තුළ විය. මා ප්‍රසිද්ධියට පත්වුනෙමි, මාගේ 20 වැනි විය මා පසු කිරීමටත් පෙර සියළු මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යන්හි මා පිළිබඳ කියන්න, ලියන්න පටන්ගත්හ. මාගේ රූපයන් පළවිය. මට ආඩම්බරය, ගෞරවය, ප්‍රසිද්ධිය හිමිවුනි. මා ද සුඛෝපබෝගි ජීවිතයක් ගත කිරීමට පටන් ගත්තෙමි.

මත් පැන් හා මත් ද්‍රව්‍යයි ජීවිතය යන තීරණයට එළඹුනෙමි. පුරා වසරක් මහත් මුදලක් උපයා ආඩම්බර ජීවිතයක් ගත කිරීමෙන් පසු දැඩිලෙස රෝගාතුර වුනෙමි. කාස රෝගය වැළඳ පීඩිත තත්ත්වයකට පසුවුනෙමි. රෝහලෙහි නේවාසික ප්‍රතිකාර ගැනීමට තරම් තත්ත්වය උග්‍ර විය. මෙම පසුබිම තුළ සිටයි මා කල්පනා කරන්න පටන් ගත්තේ.

මට සිදුවූයේ කුමක්ද? මා හුදු ශරීරයක් පමණද? මාගේ ජීවිතයෙහි අභිලාෂය කායික අවශ්‍යතාවන් ඉටු කිරීම පමණද? යනු සිතන්න පටන් ගත්තෙමි.

මාගේ රෝගී තත්ත්වය යනු දෙවියන් මට දුන් භාග්‍යයකි. යළිත් මාගේ දෙනෙත් විවෘත කර බැලීමට අවස්ථාවක් යනු සිතුවෙමි.

මා මෙහි සිටින්නේ ඇයි? මා ඇඳක සිටින්නේ ඇයි? මෙවැනි විවිධ ප්‍රශ්නවලට පිළිතුරු සොයන්න පටන් ගත්තෙමි. කල්පනා කරන්න පටන් ගත්තෙමි. එළවළු වර්ග පමණක් අනුභව කරන බව තීරණය කරගත්තෙමි. දැන් සාමය හා ශාන්තිය කෙරෙහි ඇල්මක් ඇති කෙනෙකු බවට පරිවර්තනය වූයෙමි.

ජෙන් සිං ගණිත ශාස්ත්‍රය ජ්‍යොතිශ්‍යය යන විවිධ අංශ පිළිබඳ සොයා බැලුවෙමි. යළිත් වරක් බයිබලය විවෘත කළෙමි නමුත් මා අපේක්ෂා කළ දේ මට නොලැබුනි. ඒ වන විටත් ඉස්ලාම් පිළිබඳ මා කිසිවක් නොදැන සිටියෙමි.

එවිටයි හාස්කමක් සිදුව ඇත්තේ, මාගේ සහෝදරයා ජෙරූසලමෙහි පිහිටා ඇති මස්ජිදයකට ගොස් ඇත. එම මස්ජිදයෙහි ඔහු දුටු දර්ශණයන් ඔහුව මවිතයට පත් කළේය. කිතු හා යුදෙව් පල්ලි පාලුවට ගියා මෙන් මස්ජිදයන් පාලුවට නොගොස්ය. ඒවා ක්‍රියාකාරිව පැවතුනු අතර එහි පැවතුනු ශාන්තිය හා මනස්කාන්ත පරිසරය මාගේ සහෝරදයාගේ සිත් ගන්නා සුළු දර්ශණයන් විය. මස්ජිදයට ගිය එම අත්දැකීමත් සමග ලන්ඩන් හැරුනු විට අල්කුර්ආනයෙහි පරිවර්තනයද රැගෙන ආවේය, එම මස්ජිදයෙහි අත් දුටු අත්දැකීම් පිළිබඳ පවසා මට අල්කුර්ආනයද පිරිනැමුවේය.



මාගේ සහෝදරයා මුස්ලිමෙකු නොවූවත් එහි සැබෑ වෙනසක් ඔහු අත් විඳ ඇත. මාද ඒ තුළින් යම් දෙයක් අත් විඳිය හැක යනුවෙන් සිතා ඇත.

මා අල්කුර්ආනය කියවීමට පටන් ගැනීමත් සමග මට සියළු දේ පහදා දෙන මාර්ගෝපදේශයක් වශයෙන් එය දැක්කෙමි. මා කව්ද? මාගේ ජීවිතයෙහි යථාර්ථය කුමක්ද? සත්‍ය කුමක්ද? මා පැමිණියේ කොහේ සිටද? යන මා තුළ තැවුනු ප්‍රශ්නවලට පිළිතුරු එහි දැක්කෙමි. මෙයයි සත්‍යවූ එකම දහම යනුවෙන් අවබෝධ කරගත්තෙමි. ආගම යනුවෙන් මා කියන්නේ බටහිර ලෝකය අවබෝධ කරගෙන සිටින අර්ථයෙන් නොවේ. පැරණි යුගයට ගැලපෙන ආගම යන අදහසින්ද නොවේ.

ආගම වෙනස් කර වෙනත් ආගමක් ඔස්සේ ගමන් කරන්නන් අන්තවාදීන් යන විශ්වාසය බටහිර ලෝකය තුළ මුල් බැස ඇත. මා අන්තවාදියෙකු නොවේ, කය හා ආත්මය අතර පවතින සම්බන්ධතාවය පිළිබඳ මා තුළ අර්බුදයක් පැවතුනි. මේ දෙක වෙනස් නොවේ යනුවෙන් හා ආත්මාව වර්ධනය කර ගැනීම සඳහා කඳු වලට යෑම අවශ්‍ය නැති බවත් මා අවබෝධ කරගත්තෙමි.

අපි අල්ලාහ්ගේ නියෝගයන්ට අවනත වී ජීවත් විය යුතුයි. එසේ ජීවත් වන විට දේව දූතවරුන්ට වඩා උසස් භාවයක් අපට ලබාගත හැක යනු මා දැනගත්තෙමි. දැන් මා කළ යුතු ප්‍රථම වැඩ කොටස නම් මුස්ලිමෙකු වීමයි.

සියල්ල ඔහුගේ ශක්තියට බලයට යටත් බවත් ඔහුට සුළු නින්දක් හෝ නැත යනු මා දැනගත්තෙමි. මෙම අවස්ථාවෙහි මා පිළිබඳ ලොකුවට හිතීම මා අත්හැරියෙමි. මාගේ හැකියාවන්ගෙන් පමණයි මෙම ස්ථානයට පැමිණුනේ යනු සිතමින් සිටියෙමි. නමුත් දැන් මට වැටහුනි, එයට මා විතරක් හේතු නොවන බව. මෙම විශ්වයේ ජීවත්වීමේ මුළු අරමුණ ඉස්ලාම් යන ජීවන සැලැස්මට අවනත වී ජීවත් වීම යනු මට හරි හැටි අවබෝධ විය.
මා කුමන දේ කෙරෙහි විශ්වාසය තැබිය යුතුද? යනු මා වටහාගන්නට පටන් ගත්තෙමි මා මුස්ලිමෙකු යනු හඳුනා ගත් අතර ශුද්ධවූ අල්කුර්ආනය හදාරන විට සෑම ශාස්තාවරයකුම රැගෙන ආ පණිවුඩය එකම පණිවුඩය යනු දැනගත්තෙමි.

නමුත් යුදෙව්වරු හා කිතුවරුන් ඇයි වෙන්ව සිටින්නේ? යුදෙව්වරුන් යේසුස් වහන්සේ නොපිළිගත් අතර එතුමන්ගේ වචනයන් ඔවුන් විකෘති කිරීමද මට දැන් අවබෝධ විය.

කිතුවරුන් දෙවියන්ගේ වාක්‍යන් වැරදිව අවබෝධ කර යේසුස් වහන්සේ දෙවියන්ගේ කුමාරයන් වශයෙන් සළකා පුදන්නට පටන් ගත්හ. ශුද්ධවූ අල්කුර්ආනයෙහි පාඨයන් බුද්ධියට පිළිතුරු සැපයූ අතර, මෙය ශුද්ධවූ අල්කුර්ආනයටම ආවේනිකවූ ලක්ෂණයයි. අල්කුර්ආනය හේතු කාරණා පසුබිම් කොට අපව අධ්‍යයනය කිරීම සඳහා ඇරයුම් කරයි.



ඉර හා හඳ මේ දෙකට ඔබලා යාඥා නොකරන්න, මේ සියල්ල මැවූ අල්ලාහ්ට ඔබලා යාඥා කරන්න යනුවෙන් එය පවසයි. ඉර හඳ ඒ වගේම ඔහුගේ වෙනත් නිර්මාණයන් පිළිබඳ අධ්‍යයනය කරන ලෙස මානව සංහතියට ඇරයුම් කරයි.

චන්ද්‍රයාගෙන් සූර්යා කෙසේ වෙන්වී පවතින්නේද යනු ඔබ දුටුවේද? මෙය පෘතුවියෙන් වෙන්වී පිහිටා ඇත නමුත් ඒ සියල්ල එක හා සමාන දුරකින් පවතින බවයි පෙනෙන්නේ.

ග්‍රහ ලෝකයන්ට පියාසර කරන ගගණ ගාමීන් පෘතුවියෙහි කුඩා ප්‍රමාණය හා ග්‍රහ ලෝකයන් හි සුවිශාල බව දැක මවිතයට පත්වෙති. එය දකින ඔවුන් තුළ දේව විශ්වාසයක් ඇතිවෙන්න පටන්ගනි. මන්ද ඔවුන් අල්ලාහ්ගේ පැහැදිළි සාක්ෂින් දැක ගැනීමේ අවස්ථාව ඔවුන්ට උදවෙයි.

ශුද්ධවූ අල්කුර්ආනය මා තව දුරටත් කියවන විට එය යාඥාවන් පිළිබඳ හා දයාව කරුණාව දැක්වීම පිළිබඳවත් දන මාන කිරීම පිළිබඳවත් ඉදිරිපත් කළ ඇති අදහස් මා දුටුවෙමි. එම අවස්ථාවෙහි මා මුස්ලිමෙකු වශයෙන් ප්‍රසිද්ධ නොකරගත්තෙමි. නමුත් මාගේ සිත් තුළ පැන නැගෙන සෑම ප්‍රශ්නයකටම පිළිතුර අල්කුර්ආනයයි යනු මා අවබෝධ කරගත්තෙමි.

අල්කුර්ආනය විවිධ මට්ටමෙන් තම අදහස් ඉදිරිපත් කරයි. තවත් කෝනයකින් අල්කුර්ආනය හඳුනා ගැනීමට මට හැකිවිය. එනම් "විශ්වාසවන්තයින් ඒක දේවත්වය

ප්‍රතික්ෂේප කරන්නන්ව තමන්ගේ කල්‍යාන මිත්‍රයින් වශයෙන් නොගනි විශ්වාසවන්තයින් තමන් අතර සහෝදරයින් වේ" යන පාඨය කියවුවෙමි මේ අවස්ථාවේදී මා මුස්ලිම් සහෝදරවරුන් හමුවීමට ප්‍රිය කළෙමි.

මාගේ සහෝදරයා කළා සේම ජේරුසලම බලා යෑමට තීරණය කළෙමි. ජේරුසලමෙහි පිහිටා ඇති එක් මස්ජිදයකට ගොස් වාඩිවුනෙමි. කෙනෙකු පැමිණ ඔබට අවශ්‍ය කුමක්ද? යනුවෙන් මාගෙන් ප්‍රශ්න කළේය එයට මා මුස්ලිමෙකු යනුවෙන් පිළිතුරු දුන්නෙමි ඔබේ නම කුමක්ද? යනුවෙන් ඔහු මාගෙන් ප්‍රශ්න කළේය මා " ස්ටීවන්ස්" යනුවෙන් පිළිතුරු දුන්නෙමි. ඔහුට එය ප්‍රෙහේළිකාවක් විය. මා පසුව සලාතයට එක්වී එය ඉටු කළෙමි නමුත් එය නිවැරදි ලෙස මා ඉටු කළාද යනු කිව නොහැකිය.

පසුව මා ලන්ඩන් බලා පැමිණ "නෆීසා" යන සහෝදරිය හමු වී මා ඉස්ලාම් දහම පිළිගැනීමට කැමති බව දැන්වූවෙමි. ඇය මාව නියූ රීජන්ට් මස්ජිදයට කැඳවාගෙන ගියේය. එය 1977 වර්ෂයයි ශුද්ධවූ අල්කුර්ආනය මා කියවීමට පටන්ගෙන අවුරුදු එකහමාරක් ගතවෙමින් තිබූ අවස්ථාවයි. මා තුළ ඇති උඩඟු කම මා තුරන් කළ යුතුයි ඉබ්ලීස් ෂෛතාන්ව මා තුළින් පන්නා දැමිය යුතුයි මා කඹාවට මුහුණලා සිටිය යුතුයි යනු මා අධිටන් කර ගත්තෙමි. සිකුරාදා දින මස්ජිදයෙහි ප්‍රමුඛත්වය උසුලන ඉමාම් වෙත ගොස් කලිමා ප්‍රතිඥා ගත්තෙමි.



මුදල් හා ප්‍රසිද්ධිය ලැබුනු කෙනෙකු වශයෙන් මා සිටියෙමි. නමුත් නිවැරදි මගයි මට මහත් උත්සහයකින් පසුත් නොලැබෙමින් තිබුනේ. ශුද්ධවූ අල්කුර්ආනය මට ලැබෙන තෙක් මෙයයි තත්ත්වය කිතු දහම හෝ වෙනත් සංකල්පයන් මෙන් නොව මාගේ හිමියන් සමග සෘජුව සම්බන්ධතාවක් ඇති කරගැනීම හැකි බව මට දැන් වැටහුනි.

හින්දු කාන්තාවක් මට, ඔබ හින්දුවරුන් හරි හැටි අවබෝධ කරගත්තේ නැත අපිත් එකම දෙවි කෙනෙකු කෙරෙහියි විශ්වාසය තබා ඇත්තේ. නමුත් අවධානය නොබිඳීම සඳහායි මෙම රූපයන් ප්‍රතිමාවන් අපි භාවිතාකරන්නේ යනුවෙන් එක් අවස්ථාවකදී පැවසුවාය. දෙවියන් කරා සමීපවීමට ඔහුට ආදේශයන් ඇති කළ යුතුයි යන අදහසයි ඇය කියන්නට උත්සහ කළේ. නමුත් ඉස්ලාම් දෙවියන්ට සමීපවීමට ඇති සියළු බාධක කඩා බිඳ දමයි දේව ප්‍රතික්ෂේපත්වයෙන් වෙන්කර විශ්වාසය ඔපනංවන ක්‍රියා මාර්ගයක් නම් එයයි සලාතය මෙය සිතෙහි පරිශුද්ධත්වය ඇති කිරීමට නියම පුහුණුවකි.

අවසන් වශයෙන් මා අල්ලාහ්ගේ තෘප්තිය ලබාගැනීම සඳහායි සියල්ල කරන්නේ යනු කීමට කැමැත්තෙමි. මාගේ අත්දැකීම් තුළින් ඔබටත් යම් ප්‍රයෝජනයක් ලැබීමට මා අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කරමි. මා ඉස්ලාම් දහම පිළිගැනීමට පෙර කිසිදු මුස්ලිමෙකු සමග සම්බන්ධතාවයක් මට නැත. මා ප්‍රථමයෙන් කියවන්නට පටන් ගත්තේ ශුද්ධවූ අල්කුර්ආනයයි. කිසිදු මිනිසෙකු

අංග සම්පූර්ණ නැති බව මා වටහා ගත්තෙමි ඉස්ලාම් පමණයි පරිපූර්ණව පවතින්නේ.

අපි අල්ලාහ්ගේ අවසන් ශාස්තෘවරයානන් වන මුහම්මද් නබි (සල්) තුමන්ගේ ආදර්ශයන් නිසි ලෙස පිළිපදින විට ජය ලැබිය හැක එම උත්තමයානන්ගේ මග ඔස්සේ ගමන් කිරීමට අප සියල්ලන්ට අල්ලාහ් ආශිර්වාද කරත්වා!

## "අලි බිලෝසින්!"

"මාගේ ජනතාවනි! අල්ලාහ්ගේ ඇරයුමට ඇහුම්කන් දෙන්න" යන දේව පාඨය ප්‍රත්‍යක්ෂ කරන්නා සේ, ඉස්ලාමීය කැඳවුම් කරුවෙකු හා ප්‍රචලිත චරිතයක් වන "අලි බිලෝසින්" රුසියානු ජනතාවට තම හද පත්ලෙන් ඉස්ලාම් කරා ඇරයුම් කරයි.

ඔහුගේ නිර්මාණයන් හා දේශණයන් තම සමාජය ඉස්ලාම් කරා කැඳවන විලාශයෙන් පවතී. මාර්ක්ස් වාදයෙහි හා කිතු දහමෙහි නම් දරා සිටි කෙනෙකු සේම අවසන් වශයෙන් ඉස්ලාම් තුළද නොසැලුනු චරිතයක් විය.

කොමියුනිස් සංකල්පයෙහි ආචාර්යය වරයෙකු වන මෙම කුලපතිවරයා එය තමන්ගේ ජීවය වශයෙන් සළකා ක්‍රියා කළ කෙනෙකි, තවද එය කරා සමාජය කැඳවූ කෙනෙකි.



කොමියුනිසයෙහි සිට කිතු දහමට ප්‍රවිශ්ට වූ ඔහු, "නැගෙනහිර ආර්ඩොතොක්ස්" සංකල්පයෙහි විශාරදයකු වී ඔවුන්ගේ ප්‍රධාන ආගමික නායකයකු වශයෙන් ක්‍රියා කළේය. පසුව ඔහු තුළ ක්ෂණිකව ඇතිවූ වෙනස නිසා, ඉස්ලාම් දහම පිළිගත් බව ප්‍රසිද්ධියෙහි ප්‍රකාශ කිරීම කිතු සභාවෙහි ස්ථම්භක සොලවන්නට විය.

මෙය දරාගන්නට නොහැකි වූ ආර්ඩෝතොක්ස් නිකායේ සභාපති (කිතුවරුන්ගේ එක් කොටසක්) මොහුට ආත්ම 7 කට විනාශය ඇතිවේවා! යනුවෙන් ශාපකර ඇත. කුවෙයිට් රාජ්‍යයේ සිට මුද්‍රණය වන අල්මුජ්තමඃ සඟරාව ඔහු සමග කළ පිළිසඳරයි මේ:

**අල්මුජ්තමඃ** :- ඔබගේ නම? ඔබ ගැන කෙටියෙන් විස්තර කළා නම්.

**බිලෝසින්**:- මාගේ නම "අලි බිලෝසින්" කොමියුනිස් වාදයෙහි ආචාර්ය වරයෙකු වන මම දේශපාලනයෙහි ද ඩිප්ලෝමා කර ඇත්තෙමි. සෝවියත් රුසියාව එකට පැවතුනු කාලයෙහි දර්ශනය පිළිබඳ කුලපති වශයෙන් කටයුතු කළෙමි. නමුත් මාර්ක්ස්ගේ (අදේවවාදි) සංකල්පය කෙරෙහි එතරම් මා තුළ කැමැත්තක් නොවිය. එහි යම් අඩුවක් පවතින බව මා තුළ දුටුවෙමි. සැබවින්ම මෙම විශ්වය මැවූ, මැවුම් කරුවෙකු සිටීම අවශ්‍යයි මා තීරණය කළෙමි. මේ පසුබිම තුළ සිටයි මා කිතු දහම පිළිබඳ විශ්ලේෂනය සඳහා ඒ පිළිබඳ හැදෑරීම සඳහා දවසක් කිතු සභාවට ගියේ. ඉන් පසු එය පිළිගෙන කිතු දහම ප්‍රචාරය කරන කිතු පූජකවරයෙකු වුනෙමි. සෝවියත් රුසියාවෙහි

බෙදීමෙන් පසු කිතු සභාවෙහි ආධාරය ඇතුව ප්‍රථම වතාවට රුසියානු පාර්ලිමේන්තුවට තේරී පත්වී, සිව් වසරක් රුසියානු පාර්ලිමේන්තුවෙහි උප සභාපති වශයෙන් කටයුතු කළෙමි.

**අල්මුප්තමඃ** : රුසියානු පාර්ලිමේන්තුවෙහි ඔබගේ වැඩ කොටස කෙසේ පැවතුනේද?

**බිලෝසින්**: පාර්ලිමේන්තුවෙහි ආගමික සංගමයන්හි සභාපති වශයෙන් සිටියෙමි. ජනතාව තමන් නියෝජනය කරන දහම නිදහසේ පිළිපැදිය යුතුයි, යන අරමුණින් ආගමික නිදහස පිළිබඳ නීති මාළාව සකස් කළෙමි. රුසියානු පාර්ලිමේන්තුවෙහි සිව් වසරක රාජකාරිය නිමවීමත් සමග මාගේ මුල් රාජකාරිය වූ ආගමික ප්‍රචාරක කටයුතු වල නියැලුනෙමි.

**අල්මුප්තමඃ** : කිතු දහමෙන් ඔබ නික්වීමට හේතුව?

**බිලෝසින්**: පාර්ලිමේන්තු රාජ කාරිවලින් යළිත් කිතු සභාවට පැමිණීමෙන් පසු, බටහිර හා නැගෙනහිර කිතු දහම පිළිබඳ පුළුල්ව කියවීමට පටන් ගත්තෙමි. ඒ දෙක අතර පැහැදිලි හා මවිතයට පත් සුළු පරස්පරතාවයන් දැක ගන්නට හැකි විය. විශේෂයෙන් යේසුස් වහන්සේ, එතුමන් තුළ පැවතුනු මිනිස් ස්වභාවය, දේව ලක්‍ෂණ, තවද ත්‍රිත්වය ආදීන් අතර පැහැදිලි මත භේදයන් පැවතුනි. මෙය ඒක දේවත්වයට පට හැනි මතය පමණක් නොව, තර්කන බුද්ධියටද පටහැනි සංකල්පයක් වශයෙන් තීරණය කළෙමි.



ඉන්පසු කාලය මුළුල්ලේ කිතු දහමෙන් දුරස්වෙන්නට පටන් ගත්තෙමි.

මෙම තත්ත්වය කිතු දහම සත්‍යට පටහැනි සංකල්පයක් යනු අවංකවම මා තුළ ඒත්තු ගන්වපු කාරණාවක් විය. දිනින් දින මා කිතු දහමෙන් ඈත් වී ඒකීය දෙවියෙකු කෙරෙහි විශ්වාසය මා තුළ ගොඩනැගෙමින් පැවතුනි. ඇත්ත වශයෙන්ම මෙවැනි තීරණයකට එළඹීම මාගේ පසුබිම තුළ අපහසු කාර්යයක් විය. මන්ද මා අවුරුදු 16ක් කිතු දහම ප්‍රචාරය කළ ආගමික නායකයෙකු වශයෙන් සිටි කෙනෙකි. කිතු දහම සත්‍යවූ දහම වශයෙන් පිළිගෙන ජීවත් වූ පුද්ගලයෙකි.

**අල්මුප්තමඃ** :- එනම් ඔබ කිතු දහමෙහි ඒකීය දෙවි කෙනෙකු විශ්වාස කරමින් සිටියා හැරෙන්නට මුස්ලිමෙකු වශයෙන් නොසිටියේය?

**බිලෝසින්**:- එසේය මා මෙම කාල වකවානුව තුළ ඒක දේව සංකල්පයක් පිළිබඳ පවසන ආගමක් පිළිබඳ දැන නොසිටියෙමි. ඉස්ලාම් පිළිබඳ කෘතියක් හෝ මා කියවා නොසිටියෙමි. "කරාට්සොපිට්ස්කි" යන විශාරදයෙකු විසින් රුසියානු මාධ්‍යයට පරිවර්තනය කළ ශුද්ධවූ අල්කුර්ආන් පරිවර්තනය මට අවබෝධ කරගැනීමට අපොහොසත් විය.
රුසියානු රූපවාහිනි නාලිකාවක් විසින් දිනක් "ඊදුල් අල්හා" හජ් උත්සවය නිමිත්තෙන් විශේෂ වැඩසටහනක් විකාශනය කළේය. එම වැඩසටහන තුළින් ඉස්ලාම් පිළිබඳව හා එහි මූල ධර්මයන් පිළිබඳ පැහැදිලි කළ අතර ඉස්ලාම් ඒක දේවත්වය කරා

කැඳවන දහමක් වශයෙන් විස්තර කරන ලදි. මෙය මා බොහෝ දුරට ආකර්ෂනය කරන්නට විය. එම අවස්ථාවෙහි මා තුළ පැවතුනු අඥානයන්ගෙන් මිදුනු බවත් මෙම දහම වෙනුවෙන් මාගේ සිත විවෘත වූ බවත් මට හැඟුනි. මා තුළ මා මුස්ලිමෙකු වශයෙන් තීරණය කර මාගේ ඉස්ලාමීය වෙනස පිළිබඳ ප්‍රසිද්ධියට පත්කර, පුවත් පතකට ලීවෙමි. එය එම පුවත් පතෙහි පළවීමත් සමග මට ඇතිවුනු සතුට වචනවලින් වර්ණනා කිරීමට නොහැකි තරම්ය. මෙය අවුරුදු හතකට පෙර සිදුවූ සිදුවීමකි.

**අල්මුජ්තමඃ** :- ජනතාව අතර මෙහි බලපෑම කුමන ආකාරයෙන් පැවතුනේද?

**බිලෝසින්**: මා කිතු දහමෙහි පූජකවරයෙකු වශයෙන් හා මහත් ගරුත්වයට පාත්‍රවූ කෙනෙකු වශයෙන් හා කිතු සභාවෙහි අධාරයෙන් පාර්ලිමේන්තුවට පිවිසී එහි උප සභාපති වශයෙන් පමණක් නොව ආගමික සංගම් හි නායකයා වශයෙන්ද කටයුතු කළ කෙනෙකු වශයෙන් මෙය මහත් අර්බුදයක් මතු කළ අතර විශේෂයෙන් කිතු සභාව තුළින් දැඩි විරෝධතාවන් මතු විය.

ජන මාධ්‍යයන් සෘජුව මට සම්බන්ධවී අදහස් විමසන්නට විය. හැම පුවත් පතක්ම සඟරාවක්ම මාගේ ඉස්ලාමීය වෙනස පිළිබඳ ලියන්නට විය. එක් පත්තකින් සුභවාදීව ලියූ අතරම තවත් පත්තකින් ද්වේෂ සහගතවද ලියන්නට විය. එම නිමේෂය පටන් මා ඉස්ලාම් දහම ප්‍රචාරය කරන ප්‍රචාරකයෙකු වශයෙන් කටයුතු කිරීමට පටන් ගත්තෙමි. එම අවදියේ



රූපවාහිනී ආයතනයක වැඩසටහන් නිෂ්පාදක වශයෙන් කටයුතු කිරීමට මට ඇරයුමක් ලැබිනි. මා අවුරුදු දෙකක් එහි සේවය කළෙමි.

ආර්ඩෝතොක්ස් (රෝමානිය) කිතු සභාව මට හා මගේ 7 පරම්පරාවට විනාශය අත්වීම සඳහා ශාප තීරණයක් සම්මත කළේය. ඒ පමණක් නොව මාගේ ලේ ඥාතීන් කැඳවා මාත් සමග පවතින සියළු සම්බන්ධතාවන් නතර කරන ලෙස නියෝග කළේය.

**අල්මුජ්තමඃ** :- ලේ ඥාතීන්ගේ සම්බන්ධතාවය ඔබට අහිමිවී යෑම ඔබගේ සිත් තුළ යම් බලපෑමක් ඇති කළේද?

**බිලෝසින්**:- ඇත්ත වශයෙන්ම එම තීරණය නිසා මා මානසිකව සෑහෙන ලොකු පීඩනයක් වින්දෙමි. මාගේ ලේ ඥාතීන් මගෙන් ඈත්වීම නිසා මා තනිවූ පුද්ගලයෙකු වශයෙන් සිටියෙමි. නමුත් පසුව එය මට හුරු විය. ඒ වගේම ඉස්ලාමීය සහෝදරත්වය තුළින් අල්ලාහ් ඒ අඩුව මට පිරිමසා දුන්නේය. අල්ලාහ්ට සියළු ප්‍රශංසා හිමිය.

**අල්මුජ්තමඃ** :- රූපවාහිනී වැඩසටහනක් නැරඹීම තුළින් ඉස්ලාම් දහමට ඇතුල් වූ ඔබ එයත් සමග ඉස්ලාමීය ප්‍රචාරකයකු වශයෙන් කටයුතු කළේය, ඒ වන විට ඔබගේ ඉස්ලාමීය දැනුම කුමන මට්ටමකද පැවතුනේ?

**බිලෝසින්**:- ඉස්ලාම් පිළිබඳ සෑහීමට පත්විය හැකි තරම් දැනුමක් මා තුළ නොවිය. ඒ අංශයෙන් මා

දුර්වලව සිටියෙමි. එම අවස්ථාවෙහි මට නිසි ලෙස සලාතය පවා ඉටු කිරීමට නොදන්නේය. උපවාසය අනිවාර්ය බව මා නොදැන සිටියෙමි. ඉස්ලාම් පිළිබඳ පහදා දෙන මුස්ලිමෙකු හෝ හමු නොවී ඉස්ලාම් පිළිබඳ කිසිදු කෘතියක් නොකියවමිනුයි මා ඉස්ලාම් දහම පිළිගත්තේ. ඉස්ලාම් පවසන ඒක දේව සංකල්පයයි මා ඉස්ලාම් කරා ආකර්ෂණය කළේ. නමුත් පසුව ස්වයංව පොත් කියවීම තුළින්, තවද මුස්ලිම් කැඳවුම් කරුවන්ගේ සහය ඇතුව ඉස්ලාම් පිළිබඳ දැනගත්තෙමි.

**අල්මුජ්තමඃ**:- ඔබගේ කෘතීන් පිළිබඳ කෙටියෙන් විස්තර කළොත්.

**බිලෝසින්** :- මාගේ ප්‍රථම කෘතිය "අල්ලාහ් දෙසට සමීප කරවන නියම මග" යන කෘතියයි. එම කෘතියෙහි ඉස්ලාම් පිළිබඳ පුළුල්ව විස්තර කර ඇත්තෙමි. එය බොහෝ වාර ගණන් මුද්‍රණය වී ඇත. මේ වන විට ලක්ෂයකට අධිකව මෙම කෘතිය මුද්‍රණය වී ඇත. රුසියානු භාෂාව කථා කරන දහස් සංඛ්‍යාත ජනතාව මෙය කියවා ඉස්ලාම් දහම පිළගෙන ඇත යනුවෙන් මා පැවසුවත් එය අතිශෝක්තියක් නොවේ.

මාගේ දෙවැනි කෘතිය "ෂිර්ක්හි (අල්ලාහ්ට ආදේශයන් ඇති කිරීමේ) ආරම්භය" යන කෘතියයි. මෙම කෘතිය තුළින් ඉස්ලාම් පවසන ඒක දේව සංකල්පයෙහි අවශ්‍යතාවය පිළිබඳ පැහැදිළි කරන අතර අල්ලාහ්ට හවුල් කරුවන් ඇති කිරීමේ භයානකත්වය පැහැදිළි



කර ඇත. මෙය දැනුම ලද් සමාජයක් වෙනුවෙන් ලියා ඇත.

තෙවැනි කෘතිය "නවක මුස්ලිම් වරුන්ගේ දෘෂ්ටියෙන් බයිබලය" මෙම කෘතිය තුළින් බයිබලයහි පවතින අඩු ලුහුඬුකම් හා මත භේදයන් පිළිබඳ මනා ලෙස, මාතෘකා අනුව විග්‍රහ කරන කෘතියකි. යේසුස් වහන්සේට දේවත්වයක් පවතින බව විශ්වාස කරන කිතු ප්‍රවීනයන් වෙනුවෙන් මෙය ලියා ඇත. තවද විවිධ මාතෘකාවන් යටතේ මාගේ නිර්මාණයන් ඇත.

**අල්මුජ්තමඃ** :- කෘතීන් ලිවීම හැර වෙනත් ඔබගේ ක්‍රියා කාරිත්වය පිළිබඳ පවසනවා නම්.

**බිලෝසින්**:- රුසියානු අග නුවර වන මොස්කෝව මුල් කොටගෙන "අස්සිරාතුල් මුස්තකීම් (නිවැරදි මග)" යන නමින් ඉස්ලාමීය ආයතනයක් පිහිටා එහි අධ්‍යක්ෂවරයා වශයෙන් කටයුතු කරමින් සිටිමි. මෙය මුස්ලිම් නොවන සහෝදරවරුන් ඉස්ලාම් කරා කැඳවීමට මුල් තැන දෙන අතර නවක මුස්ලිම් වරුන් කෙරෙහිද වැඩි අවධානයක් යොමු කරයි. තවද අපගේ වෙබ් අඩවියක්ද ඇත. රුසියානු මුස්ලිම්වරුන්ගේ පුවත් පත් සංගම් සභාපති වශයෙන්ද කටයුතු කරන අතර රුසියානු මට්ටමේ ආගමික විශාරදයන් වශයෙන් සිටින්නන්ට උපදේසක වශයෙන් කටයුතු කරමි.

**අල්මුජ්තමඃ** :- රුසියාවෙහි නවක මුස්ලිම්වරුන්ගේ මානසිකත්වය පිළිබඳ පැවසුවොත්.

**බිලෝසින්:-** ලේ ඥාතීන් හා මිත්‍රයින් සමග පවතින සම්බන්ධකම් නැතිවී යෑම මහත් දුකකි. ඒ වෙනුවට චෙච්නියානුවන් තාත්තාරිවරුන් තජිකිස්තානුවන් සමග අළුත් මිත්‍රත්වයක් ගොඩනැගීමද අමාරු කාර්යයකි.

ඒ අතර තුර සෙසු ජනතාව කිතු දහමෙහි ජීවත් වී සෙසු රුසියානුවන්ව සුභවාදීව දැකීමේ තත්ත්වයක් සම්පූර්ණයෙන් නැත. ඔවුන්ව අසාධාරණයක් කළ අය වශයෙන් පොදු ජනයාගේ දේපළ සම්පත් හූරා කෑ ඔවුන්ගේ අයිතීන්ට හානි කළවුන් වශයෙන් දකී. මේ සියළු ජනයාගේ සිත් සතන් තුළට කිඳා බස ඇත . මොවුන් සිද්ධස්ථානවලට ඇතුල් වූ විට නවක මුස්ලිම් වරු වශයෙන් පිළි නොගෙන පන්න දමන තත්ත්වයකි. ආර්ඩෝතොක්ස් (මනඃකල්පිත රෝමානු සංකල්පයක් පිළිපදින) ජනතාවත් සමග එක් නොවී සිටීමට එම සිද්ධස්ථාන සමග ගිවිසුමක්ද අත්සන් තබා ඇත. එසේ ඔවුන් ප්‍රවිශ්ටවූ විට ඔවුන්ගේ සිද්ධස්ථාන වලට යළි හරවා යවනු ලබයි.

නවක මුස්ලිම් වරුන්ගේ අධ්‍යාපනය සඳහා එක් ආයතනයක් පිහිටුවා ගැනීමට පවා අසීරු කාර්‍යකි. ඔවුන්ගේ සංඛ්‍යාව මොස්කෝවෙහි පමණක් දහදහ ඉක්මවයි. දිනින් දින එම සංඛ්‍යාව වැඩිවෙමින් පවති. ඔවුනතුරින් විශ්ව විද්‍යාල කුලපතිවරුන් නීතිඥයන් නීතිපතිවරුන් ඉංජිනේරුවන් ශිෂ්‍යන් ආදි සෑම පංතියකම අය සිටිති.

ඔවුන් උනන්දුවෙන් ඉස්ලාම් පිළිබඳ සොයා හදාරති. සමහර ඉස්ලාමීය පාසැල්වල භාගයටත් අධික අය



නවක මුස්ලිම්වරු වේ. නවක මුස්ලිම් වරු මුහුණ දෙන තවත් ප්‍රශ්නයක් නම් එයයි විවාහය. එහිදීත් කාන්තාවන්ගේ ආරක්ෂාව යනු මහත් ප්‍රශ්නයකි. ඔවුන් සළකන විට පැරණි සිරිත් විරිත් නැතහොත් ගෝත්‍රික ක්‍රමය කොහෙත්ම නොගැලපෙයි. (මේ කරුණු වලට ඉස්ලාම් විරුද්ධය).

**අල්මුජ්තමඃ** :- මුස්ලිම් නොවන රුසියානුවන් ඉස්ලාම් කරා කැඳවීමෙන් ඔබ ලද අත්දැකීම්

**බිලෝසින්:-** රුසියානුවන්ගෙන් බහුතරයක් කිසිදු විශ්වාසයක් නොමැති අය වේ. පුරාවෘත්ත කතාවන් විශ්වාස කරති. එනමුත් කෘතීන් සිනිමාව රූපවාහිනී නාලිකාවන් ජනතාව අතර පැතිර ඇති කථාවන් මේ කිතු දහම පිළිබඳ දැන සිටී. කෙතරම් දුරට කිවහොත් යෙසූස් වහන්සේගේ රූපය නාට්‍යක් වශයෙන් දකී. එබැවින් ප්‍රථමයෙන් ඔවුන්ගේ සිත් තුළ ශාස්තෘවරුන් යනු කව්ද? ඔවුන්ගේ ගරුත්වය කුමක්ද? යනු අවධාරණය කළ යුතුයි. ඉන් පසු යේසුස් වහන්සේ පිළිබඳ කිතු දහමෙහි පවතින වැරදි ආකල්පයන් මුලිනුපුටා දැමිය යුත්තේ. මුල් අවදියේ කිතු විද්වතුන් ලියූ කෘතින් සිද්ධීන් පිළිබඳ පරස්පර අදහස් ඉදිරිපත් කරති. මෙයට කැමති ආකාරයට කෙනෙකුට විස්තර කළ හැක. නමුත් යේසුස් වහන්සේ පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ටිය ඉතා ඥානාන්විත හා බුද්ධිගෝචර වේ. ඉන් පසු කිතුවරුන් විසින් ඉස්ලාම් පිළිබඳ වැරදි ප්‍රතිරූපයක් නිර්මාණය කිරීම සඳහා මාධ්‍යයන් ඔස්සේ ගෙන ඊනියා ප්‍රචාරයන්ට නියම පිළියම් යෙදිය යුතුයි. ඉන් පසු විශ්වයේ එකම මැවුම් කරුවානන් වන

අල්ලාහ්ට හවුල් කරුවන් ඇති කිරීමේ ඇති භයානකත්වය පිළිබඳ සමාජයට පහදා දිය යුතුයි. මෙම ක්‍රියා මාර්ගයන් අපි ගන්නා විට මිනිස් සිත් සතන් අතරට යෑමේ මග විවෘත වන අතර ඉන් පසු ඉතිරිව පවතින්නේ පිවිතුරු චේතානව හා අල්ලාහ්ගේ දයාව පමණි.

**අල්මුජ්තමඃ** :- ඔබ මුහුණ දෙන අභියෝග කුමක්ද? එම අභියෝග ඔබ බාරගන්නේ කෙසේද?

**බිලෝසින්**:- රුසියානු ජනතාවට වචනවලින් තේරුම් කර දීම යනු අපහසු කාර්යයකි. ඉස්ලාමීය කෝනයෙන් රුසියානු සංස්කෘතික අන්‍යතනතාවයන් පහදා දිය යුතුයි. එනම් ඉස්ලාම් ඉතිහාසය, තර්කන වාදය, සාහිත්‍ය කෙසේ දකීද යනු "ඩෝල්ස් ඩොව් ඩෝස් ෂෝපිස්කි" වෙනත් මධ්‍යස්ත විද්වතුන්ගේ කෘතීන් ආශ්‍රයෙන් පහදා දිය හැක.

ඒ වගේම ඉස්ලාමීය මූලික ප්‍රතිපත්තීන් ඉස්ලාම් දහම පිළිබඳ පැරණි රුසියානුවන්ට ඔවුන්ගේ භාෂාවෙන්ම ඔවුන් වෙත රැගෙන යෑමෙන් ශුද්ධවූ අල්කුර්ආනය නිසි ලෙස පරිවර්තනය කර (කුෆ්ර් ප්‍රතික්ෂේපත්වය) (ෂිර්ක්: ආදේශයන් ගැනීම) (තව්හීද්: ඒක දේව සංකල්පය) (රූහ්: ජීවය) (වලි: වගකියන්නා) (වසීලා: මාධ්‍යය) ආදි ඒ වගේම වෙනත් ඉස්ලාමීය ව්‍යවහාරයෙහි පවතින වචනයන් කිතු ආකල්පයන් සමග රුසියානු ජනතාවගේ සංස්කෘතිය හා සාරධර්ම සමග සාපේක්ෂිව පැහැදිළි කිරීම මගින් මෙයින් ජය ගත හැක.



# ස්වාමි ආනන්දා මුහිබ්බුල්ලා වූයේ කෙසේද?

සමාජ සුභදත්වය සඳහා සංවිධානය කර ඇති මෙම වැඩසටහනට සහභාගි වී සිටින ඔබ සියළු දෙනාට ප්‍රථමයෙන් අස්සලාමු අලෛකුම් වරහ්මතුල්ලාහ් (ඔබ සියළු දෙනාට අල්ලාහ්ගේ ශාන්තිය හා සාමය හිමිවේවා).

මට ඔබලා ඉදිරියේ කථා කිරීමට කෙටි කාල වේලාවකුයි ලැබී ඇත්තේ. ඉස්ලාම් දහම පිළිගෙන අවුරුදු 7 ක් නිම වී 8 වැනි අවුරුද්දට පා තබා ඇත්තෙමි. මගේ ජීවිතය මීට පෙර කෙසේ පැවතිනි, මාගේ ජීවිතයෙහි මෙවැනි වෙනසක් ඇති වීමට හේතුවූ කරුනු කුමක්ද? යනු පිළිබඳ කෙටියෙන් විස්තර කර ඔබගෙන් සමුගැනීමට අදහස් කරමි.

මා ඉස්ලාම් දහම පිළිගැනීමට පෙර සිටම වෙනත් සෑම් ආගමක් පිළිබඳම පුළුල් දැනුමක් මා තුළ තිබිනි හින්දු, ජයනා, ක්‍රිස්තියානි, සීක් මෙවැනි විවිධ ආගම් පිළිබඳ මා අධ්‍යයනය කළෙමි. කෙතරම් දුරට කිවහොත් සංවාදයන් පවත්වන තරම් මට ඒ ආගම් පිළිබඳ පුළුල් දැනුමක් තිබිනි. නමුත් ඉස්ලාම් පිළිබඳ මට කිසිදු දැනුමක් නොතිබිනි.

මා සිතුවේ ඉස්ලාම් යනු එය හුදු, යම් කිසි තනි පුද්ගලයෙකුට අයිති දහමකි. සෑම ආගමක්ම රූපවලට ප්‍රතිමාවලට යාඥා කරන්න උගන්වයි. නමුත් ඉස්ලාමිහි රූපයන්ට පිළිමයන්ට වන්දනා මාන නැත. දෙවියන්ට

රූපයක් නොගෙන යාඥා කිරීමට උගන්වන නිසා එයට මා තුළ කිසිදු එකඟතාවක් නොවීය.

ඉස්ලාම් දහම පිළිබඳ නොදැනම මාගේ ජීවිතයේ අවුරුදු 45ක් ගත විය. එම අවුරුදු 45 මා මිනිසෙකු වශයෙන් ජීවත් නොවුනෙමි. මා බෞද්ධ ආගමෙහි පූජකවරයෙකු වශයෙන් ජීවත් වුනෙමි. මාගේ පස් වැනි වියෙහි තායිලන්තයෙහි බැංකොක් නගරයෙහි පිහිටා ඇති සිම්මායි යන ස්ථානය ඉන්දියාවෙහි ඌටි, කෝලෙක්කානල් වැනි ස්ථානයන්ට සමාන සුන්දර මනරම් ස්ථානයකි. ලෝකයෙහි ඒ තරම් ලස්සන ස්ථානයක් නොමැති තරම්ය. ඔස්ට්‍රේලියාවට සමානව ඇති ස්ථානයකි. එහි ඇති සුප්‍රසිද්ධ බෞද්ධ විහාරයට මා රැගෙන ගොස් මාගේ හිස කෙස් බූ ගසා සිවුර පොරවා මාගේ දෙමාපියන් මා බුදුරජානන් වහන්සේට කැප කරන බව කීවේය.

පස් වැනි වියෙහි පටන් පුරා අවුරුදු විස්සක් එම විහාරයෙහි පුහුණුව ලබා, මට ලෝකයෙහි ගෞතම බුදුන් හැර වෙන කිසිවෙකු පිළිබඳ දැනුමක් නොවීය. බුදුන් තමයි මේ ලෝකයෙහි එකම දෙවියන් යනුවෙන් අවුරුදු විස්සක් මා පුහුණුව ලැබුවෙමි. එම විහාරයෙහි 600 අධික මහණ වූ 5, 6, 7, 10 වයසට ඇතුලත් අය සිටිති. ලෝකය තුළ ලක්‍ෂ සංඛ්‍යාත බෞද්ධ (හාමුදුරුවරු සිටිති). මෙයට උදාහරණ වශයෙන් තායිලත්තය ඒ වගේම අසලින් පිහිටා ඇති ශ්‍රී ලංකාව කිව හැක. ලංකාවෙහි වීදිවල සාමාන්‍ය ජනතාව පස් දෙනෙකු ගමන් කරනවා නම් 10 දෙනෙකු හාමුදුරුවරුන් වෙති. ඒ තරම් එහි හාමුදුරුවරුන් සිටිති. නමුත් මේ



ලෝකයෙහි ඒ අතුරින් පස් දෙනෙකුයි ඉතා වැදගත් බෞද්ධ ආගමික නායකයින් වන්නේ. ඔවුන් ලෝකය පුරා ප්‍රචාරයන් සඳහා යති. ඒ වගේම ඔවුන්ටයි Green Card පිරිනමනු ලබන්නේ ලෝකය පුරා ඔවුන්ට සංචාරය කළ හැක.

ඉන්දියාවෙහි නිහඳසට ඔවුන් තමයි කැපවුනු බවත් ගාන්ධි යනු ඔවුන්ට කව්රුන් කියා හෝ නොදන්නේය. නිදහස යනු කුමක්ද? කියා ඔවුන් නොදන්නේය. නිදහස වෙනුවෙන් කැපවූ අය නිහඬව සිටිති. නමුත් සමහරුන් ඔවුන්ට ලැබී ඇති කාඩ් පත පෙන්වා බසයක නැග තවත් බසයකින් යමින් සිටිති. මට පිරිනමනු ලැබූ කාඩ් පත එවැනි එකක් නොවෙයි. එම හයසිය දෙනා අභිබවා පස් දෙනෙකුට පිරිනමනු ලබන කාඩ් පත, එම පස් දෙනා අතුරින් කෙනෙකු මිය යන විට වෙනත් කෙනෙකුට එය පිරිනමනු ලබයි. මා විසි වැනි වියෙහි පසු වන විට ඒ පස් දෙනා අතුරින් කෙනෙකු මිය ගියේය. ඒ විට එම හය සිය දෙනා අතුරින් මටයි එම පදවිය පිරිනමනු ලැබුවේ.

මා ඉන්දියාවට පැමිණි මුල් අවදියෙහි මට එතරම් දෙමළ පරිහරණය කිරීමට නොහැක. මා දෙමළ කථා කළේ නම් ඔබලාටත් එය අමතකවනු ඇත. ඒ තරම් දුර්වලය. නමුත් මා මෙහි පැමිණීමෙන් පසු දෙමළ කථා කිරීමට ඉගෙන ගත්තෙමි.

එම Green Card මට ලබා දුන්නේ ජපන් ආණ්ඩුවයි. මාගේ විසි වැනි වියෙහි එම නායකයින් පස් දෙනා අතුරින් කෙනෙකු මිය යෑමත් සමග මට එය පිරිනැමුනි.

ඉන් පසු මාගේ රාජකාරිය වූයේ ලෝකය පුරා ගොස් බෞද්ධ ආගම ප්‍රචාරය කිරීමයි. මා උදේ ආහාරය දිල්ලියෙහි ගෙන දහවල් ආහාරය සඳහා සිංගප්පූරුවට ගොස් එහි බෞද්ධ ආගම ප්‍රචාරය කරමින් සිටියෙමි.

හින්දු දහමෙහි මුරුගන් යන නමින් දෙවිවරයෙකු සිටින බව පවසති. තම සහෝදරවරුන් සමග අමනාප වී මුළු ලෝකයම එක් වරක් කැරකී ආ බව පුරාණය පවසයි. මා මේ ලෝකය පුරා තුන් වරක් සංචාරය කළ ආ කෙනෙකි. මා නොගිය රටවල් වන්නේ අරාබි රටවල් පමණයි. මා එම රටවල් වලට යෑම සඳහාද උත්සහ කළෙමි. නමුත් මට අනුමැතිය නොලැබිනි. මෙම ඇඳුමෙන් එහි පැමිණීමට නොහැක. එසේ පැමිණියත් බෞද්ධ ආගම පිළිබඳ ප්‍රචාරයන් කිරීමට නොහැක. එම අරාබි රටවල් හැර සෙසු සියළු රටවල් වලට මා තෙවරක් ගොස් ඇත්තෙමි. දැන් වුනත් මාගේ එකම සහෝදරයා ඇමෙරිකාවෙහි බෞද්ධ ආගමික නායකයකු වශයෙන් කටයුතු කරයි.

මා ජ්‍යොතිෂය වේදියෙකු වශයෙන් සිටියෙමි, කාන්තාවකට විවාහය සිදුවන්නේ කවදාද යනු අනාවැකි කියන්නෙකු වශයෙන් සිටියෙමි, දරු භාග්‍ය නොමැති අයට එම භාග්‍ය ලබාදෙන්කෙු වශයෙන් සිටියෙමි, ව්‍යාපාරය සරු නොවූ විට හිස මත මාගේ පාදය තබා අද සිට ඔබගේ ව්‍යාපාරය සාර්ථක වේ යනුවෙන් පවසන්නෙකු වශයෙන් සිටියෙමි, පූජකවරයෙකු වශයෙන්, දෙවිකෙනෙකු වශයෙන්, දෙවිකෙනෙකුගේ අවතාරය වශයෙන් සිටියෙමි. නමුත් මිනිසෙකු වශයෙන් නොසිටියෙමි. මා ඉස්ලාම් දහම පිළිගෙන අල්ලාහ්ගේ



අවංක දසයෙකු වීමෙන් පසු මිනිසෙකු වශයෙන් සිටිමි යනු කෘතියක්ද ලියා ඇත්තෙමි. කැමති කාටත් එම කෘතිය කියවීමට හැක "පූජකවරයා මිනිසෙකු වූයෙමි"

සෑම ආගමකම තමන්ට විශේෂ බලයක් තිබෙන බව පවසන්නන් සිටිති. මා ලොකු මිනිහෙකි. සියල්ල මට දන්නවා. මා සියළු භාග්‍යන් ලබා දෙමි යනුවෙන් පුර සාරම් දොඩවන්නන් සිටිති. මා අවුරුදු හතළිහක් ඒ සියල්ල අත් වින්දෙමි, මේ සියල්ල මුලාව පමණයි. මාගේ කෘතියෙහි මෙම කරුණු පිළිබඳ මා ලියා ඇත්තෙමි.

වැසි වසී කී සැනින් වැසි වසිවීද? විවාහයක් සිදුවෙයි කියා කී සැනින් එය සිදුවෙයිද? ඔබට යහපත සිදුවෙයි යනු කී සැනින් යහපත සිදුවෙයිද? මිනිසෙකු කියන අනාවැකි සත්‍ය වෙයිද? ඔහු කරන මන්ත්‍ර ගුරුකම් සත්‍යද? තඹ තහඩු වලට තියෙන බලය කුමක්ද? මා මෙවැනි බලයක් ඇති පූජකවරයෙකු සොයා ලෝකය පුරා සැරිසැරුවෙමි. මට එවැනි කිසි කෙනෙකු හමු නොවීය. මා ඇතුළු සියල්ලන් ජනතාව මුළා කරන්නන් මිස වෙන කිසිවක් නොවීය.

මා ආගමික නායකයකු වශයෙන් සිට මාගේ හතළිස් වැනි වියෙහිදියි ඉස්ලාම් පිළිබඳ අධ්‍යයනය කරන්නට පෙළඹුනේ. කිසිවෙකුගේ දිරිගැන්වීමකින් තොර ස්වයංව මම ම සිතා ඉස්ලාම් කියන්නේ කුමක්ද? මදකට සොයා බලමු අවුරුදු හතළිහකින් පසු හරි ඉස්ලාම් මොකක්ද? යනු දැනගනීමට මුල් පියවර තැබුවෙමි. සෑම ආගමක් පිළිබඳම දැනුමක් ඇති මට

ඉස්ලාම් පිළිබඳ පමණයි නොදන්නෙ? දෙවියන්ට කිසිදු රූපයක් නැති බව පවසයි එය කෙසේද? රූපයක් දැකීමේනුයි යාඥා කළ හැක්කේ? මොහුයි යේසුස්, මොහුයි ගෞතම බුදුන්, මොහුයි රාමන් එවිටයි යාඥා කළ හැක්කේ. නමුත් කිසිවක් නැත අල්ලාහ් යනුවෙන් පවසති එය කෙසේද? මෙය අධ්‍යයනය කළ යුතුයි. මෙය දැන ගත යුතුයි.

මා මාස තුන හතරක් පමණයි අල්කුර්ආනයෙහි පිටු පෙරලන්න පටන් ගත්තේ, අවුරුදු හතළිහක් පුරා ගෞතම බුදුනුයි දෙවියන් යනුවෙන් විශ්වාස කරමින් සිටි මාගේ සිත මේ සියල්ල මිථ්‍යා විශ්වාස. ගෞතම බුදුන් මෙලොවට පැමිණියේය සමුගෙන ගියේය, යේසුස් වහන්සේ මෙ ලොවට පැමිණියේය සමුගෙන ගියේය, ගුරුනානක් පැමිණියේය සමුගෙන ගියේය, හින්දු මහත් දෙවියන් වශයෙන් සළකා යාඥා කරන රාමර් පැමිණිය සමුගෙන ගියේය. හේතුව මේ සියළු අය මිනිසුන්. මිනිසුන් නම් උපත ලබති මිය යති. මා ඉස්ලාම් දහමට ඇතුල්වීමට පෙර බුදුන් ඔබයි එකම දෙවියන් යනුවෙන් පවසමින් සිටියෙමි. නමුත් මිනිසෙකුට පවතින පොදු සමාන දුර්වලතාවන්ගෙන් වෙන්ව දකින විශේෂ බලයක් නැති ඉස්ලාම් අධ්‍යයනය කිරීමෙන් පසු දැනගත්තෙමි.

දැන් ඔබ සියල්ල කෙසේ මාගේ මිත්‍රවරුන්ද ඒ වගේම කලකට පෙර මාගේ හොඳම මිත්‍රයෙකු තමයි හින්දු ආගමික නායක සංගරච්චාරියාර්. හින්දු ආගමෙහි මහත් දෙවිවරයෙකු වශයෙන් සැළකෙන බිරම්මා ඔහු තම හිස තුළින් රැගෙන ජනතාවට දෙමින් සිටියේය. ඔවුන්ගේ දෙපාමුල වැටෙන්නැති කිසිවෙකු නොවන



තරම්ය. අගමැති පටන් මහ ඇමති දක්වා සියළු අය ඔහුගේ දෙපාමුල වැටුනේය. ඔහු තමයි ස්වාමි ප්‍රේමානන්දා පී එසේ තමයි පුවත් පත්ද ඔහු ගෞරවයෙන් ඇමතුවේ.

මෙසේ සිටි අවස්ථාවෙහි වරක් පොලිසිය තිරුච්චි ආශ්‍රමයට ගොස් ඔහුව අත් අඩංගුවට ගනී. මාගේ අවුරුදු 16 - 17 මිත්‍රවරයෙකු. ඊයේ වෙනකම් ප්‍රේමනන්දා පී යනුවෙන් ලියමින් සිටි පුවත් පත් මන්ද ඔහු තම හිසෙන් දෙවිවරුන් අරන් දෙමින් සිටියේය. මම කියමින් සිටින්නේ පුවත් පත් වල පලවූ සත්‍ය පුවත් වේ. හැමෝම දන්න කරුණකි. ඉතා වැදගත් නායකයින් නිල තල තිබෙන්නන් පැමිණී විට පමණක් තම හිසෙන් දෙවිවරුන් අරන් දෙයි. දහස් ගණන් ජනතාව පිරී පවතින අවස්ථාවෙහි එක් කෙනෙකුට දෙදෙනෙකුට තම හිසෙන් දෙවිවරු අරන් දෙයි. මේ තරම් ප්‍රසිද්ධවූ පුද්ගලයෙකුව පොලිසියෙන් පැමිණ අත් අඩංගුවට ගන්නා විට ඔහු කිසිදෙයක් නොදැනුවත්ව සිටි. අල්ලස් නොගන්නා පොලිස් අධිකාරිවරයෙකු ඔහුට පහරවල් දෙන විට ඔහු මට ගහන්නට එපා! යනුවෙන් ආයාචනා කර මම කාන්තාවන් 167 දෙනෙකු දූෂණය කර ඇත්තෙමි. මිනි මැරුම් 7 ක් කළ ඇත්තෙමි යනුවෙන් කට උත්තර දෙයි. මෙම වැදගත් ආගමික නායකයා දැන් ආයුෂ දෙකක සිර දඬුවම ලබා හිර ගෙදර කල් ගෙවයි.

මට විශේෂ බලයක් තිබෙන බව ලෝකයට පැවසූ එම පූජකවරයාට පොලිසිය පැමිණ තමන් අත්අඩංගුවට ගන්නා විට කිසිවක් කිරීමට ශක්තියක් නොවීය. තම

හිස තුළින් දෙවිවරුන් අරන් දුන් ඔහුට තම හිස බූ ගසන විට කුමක් හෝ කිරීමට කිසිම ශක්තියක් නොවීය. මන්ද ඔහු සාමාන්‍ය මනුෂයෙකු පමණයි. අපි සේම ඔහු ආහාර පාන ගනී. අපි වගේම මළ මුත්‍රා පහ කරයි. නමුත් ජනතාව මුළාවෙමින් සිටී. මට මෙම කරුණු පුරා අවුරුදු හතළිහක් නොවැටෙහම්නුයි පැවතුනේ. මා කෙදින අල්කුර්ආනය අතට ගත්තේද එදින පටන් මට මෙම කරුණු අවබෝධවෙන්න පටන් ගත්තේය.

ලක්ෂයකට අධික ශාස්තෘවරුන් මෙලොවට පැමිණ ඇත. එම සියළු ශාස්තෘවරුන් එකම දෙවිකෙනෙකුට යාඥා කිරීමටයි ඇරයුම් කළේ. මෙහි මදනි තම කථාවෙහි සඳහන් කළාක් මෙන් මෙම විශ්වය පුරා ශාස්තෘවරුන් එවනු ලැබුවේය. ඔවුන්ගේ රාජකාරිය ඔවුන් ඉටු කර මෙලොවින් සමුගත්හ. ඔවුනතුරින් ගෞතම බුදුන්ද කෙනෙකු විය හැක. රාමර් කෙනෙකු විය හැක. ගුරුනානක් කෙනෙකු විය හැක. යේසුස් වහන්සේ කෙනෙකු විය හැක.

මා අවුරුදු හතළිහක් ගෞතම බුදුන් එකම දෙවියන් යනුවෙන් විශ්වාස කර ඔහුගේ දෙපාවල වතුර දමා මල් දමා යාඥා කරමින් සිටියෙමි. එම ගෞතම බුදුන්ද අල්ලාහ් විසින් එවන ලද ශාස්තෘවරයෙකු විය හැක එසේ නොවීමටත් හැක. නමුත් මගේ මතය නම් එසේ නොවිය හැකි යනු වේ. මීට විරුද්ධ මත දරන්නන්ද සිටිය හැක. නමුත් ඔහු මිනිසෙකි. අපි මෙලොවෙහි දකිමින් සිටින සියල්ලට අවසානයක් ඇත. ඒ සියල්ල අල්ලාහ් විසින් මවනු ලැබූ ඔහුගේ නිර්මාණයන්ය. යම්



දෙයකට අවසානයක් නොවෙයි නම් ඔහු සදාතනිකයි නම් ඔහුයි පුදනු ලැබීමට එකම සුදුස්සා. ඔහු දැකිය හැක්කේ කවදාද? සෙසු සංකල්පයන් වෙනත් ආත්මවල දැකිය හැකි බව පවසයි. බෞද්ධ ආගම පවා ආත්මයන් 7ක් තිබෙන බව විශ්වාස කරයි. නමුත් මෙය මුස්ලිම්වරුන් විශ්වාස නොකරති. එය කෙසේද? මෙය පිළිබඳ මා අධ්‍යයනය කළෙමි. බෞද්ධ ආගමික නායකයකු වශයෙන් සිට අධ්‍යයනය කළෙමි.

මා යම් දුරකට අල්කුර්ආනය අධ්‍යයනය කරමින් සිටියෙමි. ඉස්ලාම් පිළිබඳ තොරතුරු ලබාදෙන මධ්‍යස්ථානයක් වශයෙන් පැවතුනු ජාක් මධ්‍යස්ථානයකට මාගේ ආගමික ඇඳුමෙන්ම ගියෙමි. එහි සිටි අය මා දෙස විමතියෙන් බැලුවේය. මා ඒ පිළිබඳ කලබල නොවී මා ඉස්ලාම් පිළිබඳ ප්‍රශ්න එකළොහක් ඇසිය යුතුයි, එයට මා අවසර ඉල්ලා සිටියෙමි. අවුරුදු හතළිහකට පසු එනම් මාගේ 41 වැනි වියෙහිදී ඉස්ලාමීය මධ්‍යස්ථානයකට පා තබා ඇති ප්‍රථම අවස්ථාව මෙයයි. මා අවුරුද්දක කාලයක් අල්කුර්ආනය අධ්‍යයනය කරමින් සිටිමි. මා ආගමික නායකයකු නිසාත් ඉක්මනින් යා යුතු නිසාත් පැමිණ සිටි සෙසු අයට වඩා මට මුල් තැන ලබාදී ප්‍රශ්නයන් ඉදිරිපත් කරන ලෙස මට කියන ලදි.

මා ඇසූ මුල්ම ප්‍රශ්නය පුනරුත්පත්තිය පිළිබඳවයි. සෑම ආගමක්ම පුනරුත්පත්තිය පිළිබඳ විශ්වාස කරන විට මුස්ලිම්වරුන් පමණක් ඇයි විශ්වාස නොකරන්නෙ? අල්ලාහ් මිනිසාව මරණයට පත්කරයි. මිනිසා මරණයට පත්වීමත් සමග කිසි දෙයක් ඔහුට නොඇසෙයි එම

සිරුර මුළුමනින් අක්‍රිය වී යයි. ඔහු මිහිදන් කර කාලයක් ගතවීමත් සමග ඇට කටුත් දිරාපත්වී යයි කිසිදු සළකුණක් එහි නැත මරණින් පසු ඔහු අල්ලාහ්ට පිළතුරු දිය යුතුයි. ඉස්ලාම් තුළ වෙනත් කිසිදු ආත්මයක් පිළිබඳ විශ්වාසයක් නොමැත. මෙය කෙසේ ආගමක් වන්නේ? යනුවෙන් ප්‍රශ්න කළෙමි. මා පුරා අවුරුද්දක් අල්කුර්ආනය කියවූවත් පුනරුත්පත්තිය පිළිබඳ මාගේ විශ්වාසය දැඩිව පැවතිනි. මාගේ ප්‍රශ්නවලට පිළතුරු දීමට එහි සිටි ඉස්ලාමීය ආගමික විද්වතා ඔබ ඉතා හොඳ ප්‍රශ්නයක් අසා ඇත. ඔබට ප්‍රශ්න එකළොහක් තිබෙන නිසා සෙසු අයට අවස්ථාව නොදී ඔබගේ ප්‍රශ්නවලට මුල් තැන දෙමු යනුවෙන් පවසා මාගෙන් ආත්මයන් කීයක්ද තිබෙන්නේ? යනුවෙන් එම විද්වතා විමසීය. මා ආත්මයන් හතක් බව පැවසුවෙමි. ඔහු යළිත් මාගෙන් බෞද්ධ ආගමෙහි මෙම විශ්වාසය තිබේද? යනුවෙන් ප්‍රශ්න කළේය මා එසේය යැයි පිළිතුරු දුනිමි. එසේ නම් දැන් ඔබ කීවෙනි ආත්මයද ගතකරමින් සිටින්නේ? යනුවෙන් ප්‍රශ්න කළේය. මා නිරුත්තරවූයෙමි. ප්‍රශ්නය ඉතා සුළුවූවත් මා ඉදිරියේ එයට කිසිදු පිළිතුරක් නොවීය.

මා මේ ලොකය පුරා තෙවරක් සංචාරය කළ ඇත්තෙමි. මා ආගමික නායකයකි. එයට දීමට මා ඉදිරියේ පිළිතුරක් නොවීය. රජිව් කාන්ධි හිසම තුන් වරක් මාගේ දෙපාවලින් පගා ඇත්තෙමි. මාගේ මුවින් යමක් පිටවූවා නම් සියළු අය එය ඇසුවා මිස හරස් ප්‍රශ්න කව්රුත් ඇසුවේ නැත. මාගෙන් මේ වන තෙක් කව්රුත් හරස් ප්‍රශ්න අසා නැත. මාගේ ජීවිතයේ මුල් වතාවටයි



කෙනෙකු මගෙන් හරස් ප්‍රශ්නයක් අහන්නේ? මා මෙයට කෙසේද පිළිතුරු දෙන්නේ? මා උපත ලබා හමාරයි කියා පවසනවාද? තාම උපත නොලැබුවෙමි යනුවෙන් කියනවාද? නැතහොත් ආත්මයන් සියල්ල නිමයි කියා පවසනවාද? ඔහු යළිත්, ඔබ වැදගත් ආගමික නායකයකු නිසා මෙම ප්‍රශ්නයට පිළිතුරු දිය යුතුයි යනුවෙන් මාගෙන් ඉල්ලා සිටියේය. මම සෙසු ප්‍රශ්නද නොඅසා වෙනත් අවස්ථාවක එන බව පවසා එම ස්ථානයෙන් පිටත්වුනෙමි.

නමුත් මාගේ ඉස්ලාම් පිළිබඳ අධ්‍යයනය අඛණ්ඩව කරමින් සිටියෙමි. අල්කුර්ආනය දිගටම කියවමින් සිටියෙමි. මෙවැනි සියළු සැකයන්ට මා ඉස්ලාම් තුළ පිළිතුරැක් දුටුවෙමි.

මා ඉස්ලාමය කරා ප්‍රවිශ්ටවීමට මුල් වූ හේතුන් පළිබඳ පැහැදිළි කිරීමට ලැබී ඇති වේලාව ප්‍රමාණවත් නැතැයි මා සිතමි. ඒ සඳහා අවම වශයෙන් පැය දෙකක් හෝ අවශ්‍ය වනු ඇත. නමුත් මට ලැබුනු වේලාව තුළ එය විස්තර කිරීමට මා උත්සාහ කරමි. මා අවුරුදු 40 ක් ආගමික නායකයකු වශයෙන් කටයුතු කළෙමි. මා මන්ත්‍ර ගුරුකම් කරන්නෙකු වශයෙන් සිටියෙමි. එබැවිනුයි ජනතාව මාගේ දෙපා ඉදිරියේ වැඳ වැටුනේ. මා කෙනෙකුගේ හිස එක් වරක් පෑගුවේ නම් ලක්ෂ ගණන් මුදල් මා ඉදිරියේ. මාගේ ශිෂ්‍යන් දෙදෙනෙකු දොරටුව අසල සිටිති, ඔවුන්ගෙන් අවසරය ලබාගැනීමෙන් පසුයි කුමන තරාතිරමක කෙනෙකු වූවත් ඇතුල් විය හැක්කේ. මහත් නායකයන් පවා පැමිණෙන්නේ එසේය. මේ

සියල්ල මාගේ කෘතියෙහි සවිස්තරව සඳහන් කළ ඇත්තෙමි.

මම දැන් ද කෘතියක් ලියමින් සිටිමි. "බුද්ධ ගයාවෙහි සිට පරිශුද්ධවූ කෑබාව දක්වා" බුද්ධ ගයා යනුවෙන් ස්ථානයක් ඇත, එහි බුදුන් කාලයක් භාවනාවෙහි සිටියේය. මමද සිව් වසරක් එහි භාවනාවෙහි නිරතවූයෙමි. බුදුන් එම බුද්ධ ගස යට වාඩිවී ආලෝකයක් ලබාගත්තේය, මිනිසෙකු ලෙස සිට දේවත්වය ලැබූ බව පවසති. ඊට පෙර සාමාන්‍ය මිනිසෙකි, රාජ කුමාරයකි. ඔහු පැමිණ එම ගස යට වාඩිවීමෙන් මෙම තත්ත්වය ලැබූ බව පවසති. මෙය ඔබලා පොත් වලිනුත් කියවන්නට ඇති බව මා සිතමි. බෝදි ගස යට වාඩිවී බුදුන් ඥානය ලැබූහ, ආලෝකයක් ලබාගත්හ.

මාගේ ගුරුවරයා මට ආනන්දා! නුඹට ලෝකය පුරා නමක් හා ගෞරවයක් ඇත, නුඹට කැමති ස්ථානයකට යා හැක, නුඹද ඉන්දියාවට ගොස් අවුරුදු තුනක් වාඩිවී සිටිනු. නුඹටත් එම බලය ලබාගත හැක. මා සිව් වසරක් වාඩිවී සිටියෙමි කිසිදු බලයක් හෝ ආලෝකයක් හෝ මට හිමිනොවුනි. කාලය පමණයි අපතේ ගියේ.

මා ඉස්ලාම් දහම අධ්‍යයනය කළෙමි. අල්කුර්ආනය පුරා අවුරුදු දෙකක් අධ්‍යයනය කළෙමි. මා තේරුම් ගත් සත්‍ය නම් මේ සියළු අය මිනිසුන්, එක් මව් කුසක් තුළ උපත ලැබූ අය. බුදුන් පමණක් නොව මෙම ධර්මයන් දේශණා කළ සියළු උගතුන් මිනිසුන් වේ.



මෙම දහම් තුළ කෙතරම් ලොකු පූජකවරයකු වුවත්, තමන් දෙවි කෙනෙකු වශයෙන් ඔහු පැවසුවත් අපි වගේම ජීවත් වී, දුබලත්වයට පත්වී මිය යන්නේය. ඒ සියළු අය මිනිසුන් බව අල්ලාහ් පවසයි. එසේම බුදුන්ද පැමිණ මිය ගියේය. පුරා අවුරුදු හතළිහක් බුදුන්ව දෙවි කෙනෙකු වශයෙන් සළකා ප්‍රශංසා කළෙමි. නමුත් දැන් එයින් මිදුනෙමි. පසුව මන්ත්‍ර ගුරුකම්වලින් ඈත්වුනෙමි. මා නොදන්නා මන්ත්‍ර ගුරුකමක් නැත යන තරමට මා එහි විපුලත්වයක් ලබා සිටියෙමි.

අවුරුදු විස්සෙන් අවුරුදු පහයි බුදුන් පිළිබඳ දැන ගැනීමටත්, පාලි භාෂාව හැදෑරීමටත් වැය කළ යුත්තේ. සෙසු අවුරුදු 15 වම මන්ත්‍ර ගුරුකම් හැදෑරීමටයි වැය කළ යුත්තේ. තිබෙතය, චීනය, ජපානය, බුර්මය මේ ආදි රටවල්වලට ගොස් මා මන්ත්‍ර ගුරුකම් හැදෑරුවෙමි. මන්ත්‍ර ගුරුකම් කරන කුමන ජගතෙකු වුවත් කැඳවාගෙන එන්න! මා ඉදිරිපත් කරන අභියෝගය ඔහුට භාර ගැනීමට නොහැක. මා තබන දෙයක් ඔහුට ගන්නට කියමි ඔහු එයට ඉදිරිපත් නොවෙයි. මන්ද ඔහු සිතයි මොහු මහත් ආගමික පූජකවරයෙකු කුමක් හෝ මෙහි තිබිය හැක, යන බිය ඔහු තුළ පැවතීම නිසා ඔහු ඉදිරිපත් නොවෙයි. ඔහු බියකින් තොර එය ගත්තේ නම් එහි කිසි දෙයක් නැත. මන්ත්‍ර ගුරුකම් යනු ඔබලා විශ්වාස කරන තෙක් පමණයි. ඔබලා විශ්වාස නොකරන්නේ නම් එහි කිසි දෙයක් නැත.

මන්ත්‍ර ගුරුකම් නිසයි මා ලොකුවට වැජඹුනේ. ජනතාව මහත් බලයක් ඇති කෙනෙකු වශයෙන් සළකා මා දෙපාමුල වැඳ වැටෙමින් සිටියේ. ඉස්ලාමයට ඇතුල්

වීමට පෙර මෙය විශ්වාස කරමින්, මෙය තුළින් වැජඹෙමින් සිටියෙමි. ජනයා අතර මහත් බලවතෙකු ලෙස පෙන්වා ඔවුන් මුලා කරමින් සිටියෙමි. ජනතාවද එය විශ්වාස කළෝය. සෑම ආගමකම හින්දු, බෞද්ධ, ජයනා, සීක් ආදී යන වෙනසකින් තොර සෑම ආගමකම මෙවැනි අය දැක ගත හැක.

ඉස්ලාම් තුළ පවා ඉස්ලාම් පිළිබඳ නොදන්නා සමහර නාමික මුස්ලිම් වරුන් සිටිති. ඔවුන් බලා මා ඉස්ලාමයට ප්‍රවිශ්ට වුනේ නැත. ඉස්ලාම් ජනතාව කැඳවන්නේ අධ්‍යයනය කරන ලෙසත්, දැනුම ලබාගන්නා ලෙසත්, ශුද්ධවූ අල්කුර්ආනය අධ්‍යයනය කරන ලෙස පවසයි ඉන් පසු ඉස්ලාම් දහම පිළිගන්නා ලෙස ඇරයුම් කරයි. මා කරන්නේ කුමක්ද? යනු විනිශ්චය නොකරන්න. සෑම ආගමකම වැරදි කරන්නන්, සොරකම් කරන්නන්, දුරාචාරයෙහි යෙදෙන්නන්, බොරු කියන්නන්, බෝම්බ තියන්නන් සිටිති. මා පුරා අවුරුදු දෙක හමාරක් අල්කුර්ආනය අධ්‍යයනය කළෙමි.

පුරා අවුරුදු 45 ක් මා ලබපු ප්‍රසිද්ධිය, ආඩම්බරය, මා ඇඳ සිටි සිවුර මේ සියල්ල අත්හැර දමා පැමිණීමට නොහැකිව මාස හයක් ගත කළෙමි. කෙතරම් ලොකු නායකයන් වූවත් ටෝකනය නොලබා ප්‍රවිශ්ට විය නොහැක, ඔහු රටේ නායකයකු විය හැක ඔහු මාගේ දෙපා ඉදිරියේ වැඳ නැගිටින විටින ලක්ෂ ගණන් මුදල් ඇත. එම මුදල් වලට මොකක්ද? කළේ කියා ඔබලා ප්‍රශ්න කරන්නට පුළුවන් රටේ අගමැතිවරයෙකු පැමිණෙයි මාගේ දෙපා ඔහුගේ හිස මත තබා ආශිර්වාද කරමි, ලක්ෂ පහ, දහය කියා මුදල් පිරිනමා



පිටත් වී යයි. එම මුදල්වලට සිදුවූයේ කුමක්ද ? කියා ප්‍රශ්නයක් ඔබ තුළ නැගිය හැක. මාගේ කෘතිය කියවා බලන්න.

ලාංගේන්ජල් කෝඩාරාවෙහි තට්ටු 62 කේ ආරාමයක් බැඳ, මම ම පුරා වසර 500 යක් එය පාලනය කරන්නට සිතා, ඉන්දියාවට යාත්‍රිකයෙකු වශයෙන් පැමිණ ගෞතම බුදුන් කුමන ගහ යට බුද්ධත්වය ලැබුවේද එම ගස යට මමත් වාඩිවී එම බලය ලබාගන්නට පැමිණුනා මිස ඉස්ලාම් දහම පිළිගැනීම සඳහා මා නොපැමිණියෙමි. එහි ගොස් පුරා අවුරුදු 4 ක් වාඩිවී සිටියෙමි කිසිම ඵලයක් හෝ ඥානයක් හෝ මට නොලැබුනි. ඉන් පසුයි මා අල්කුර්ආනය අධ්‍යයනය කිරීමට පටන් ගත්තේ. ඉස්ලාම් දහම පිළිගැනීමේ අරමුණින් නොව ඉස්ලාම් මොකක්ද යනු දැන ගැනීම පිණිසයි. නමුත් එය මාගේ ජීවිතය මෙතරම් ලොකු පෙරළියක් ඇති කරයි කියා මා නොදැන සිටියෙමි.

මින් පෙර ලෝකයට ආ ශාස්තෘවරුන් දේශණා කළේ එකම ශක්තියකට යාඥා කිරීමටයි, ඔහු ඒකීයයි, ඔහුට සමානව කිසිවෙකු නැත, ඔහුට හවුල් කරුවන් නැත. ඔහුට රූපයක් නැති බව කියති, නමුත් ඔහුට රූපයක් ඇත. අල්කුර්ආනය සියුම්ව කියවා බලන්න! එය අවබෝධ කර ගත හැක. අවසන් විනිශ්ච දිනයෙහි මෙම අහස් පොළෝ තලයන් සියල්ල ඔහු දෑතට රැගෙන ඔතා තබන බව කියයි. එය ඔහුට රූපයක් ඇති බව මොනවට පැහැදිළි කරයි. ඔබලාට මා දැකීමට නොහැක නමුත් මා ඔබලා නිරීක්ෂණය කරමින් දකිමින් සිටිමි යනුවෙන් ඔහු පවසයි, එය ඔහුට දෑස්

ඇති බව පසක් කරයි. නමුත් එය අපේ රූපය මෙන් නොව ඔහුගේ දේවත්වයට ගරුත්වයට ඔබින ආකාරයේ එකක් වේ.

ප්‍රතිමාවන්ට දේව ශක්තියක් ඇති බව පුදති, නමුත් එම ප්‍රතිමාවන් පැහැර ගෙන යන විට එය වැළැක්වීමට එයට කිසිදු ශක්තියක් නැත.

මට කිසිවක් කිරීමට ශක්තිය නොමැති බව, මා සිවුර ගළ වන තෙක් නොකීවේමි. එසේ මා පවසා සිටියේ නම්, මාගේ දෙපාමුල කව්රුත් වැඳ වැටෙන්නේ නැත. මන්ත්‍ර ගුරුකම් පිළිබඳ ඔබලාට මා කිව යුතුයි. ඒ පිළිබඳ ඉස්ලාම් පවසන්නේ කුමක්ද? එය ජනතාව මුළා කරන කාලාවක් පමණයි. මන්ත්‍ර ගුරුකම් මගින් කෙනෙකු කෝටිපතියෙකු කිරීමට හෝ වෙනත් උසස් පදවීන් ලබාදීමට හෝ නොහැක. ඒ මගින් කෙනෙකුට අලාභයන් ඇති කිරීමටත් නොහැක. ජනතාව විශ්වාස කළ නිසා අපි එය කරමින් සිටියෙමු. මා සත්‍ය කථා කරමින් සිටිමි. සමහර නාමික මුස්ලිම් වරුන් පවා මෙසේ ක්‍රියා කරති. මොවුන්ගේ මතයෙහි මොවුන් සත්‍ය වන්නයින් නම් බාබර් මස්ජිදය කඩා බිඳ දමන විට ඔවුන් විශ්වාස කරන නාගූර්, අජ්මීර්, බෑදාද් මැදිහත් වී එය ආරක්ෂා කරන්නට තිබුනි. ඔබලාට ඉස්ලාම් දන්නා තරමට පවා ඔවුන්ට නොදන්නේය. නමුත් ඔහුගේ නම අබ්දුල් කාදර් විය හැක.

හින්දු ආගමික පූජකවරුන් තමන්ගේ මන්ත්‍ර ගුරුකම් බලයෙන් බාබර් මස්ජිදය ඉදි නොකර අපි නොනවතිමු යනු කියන්නන්ගේ මුව වසන්නට තිබිනි. එය ඔවුන්ට



කළ නොහැක. මෙය හුදු ජනතාව මුලා කරන කාලාවක් පමණයි. පෙර දින රාත්‍රියෙහි පවා මාගේ කෘතියෙහි මා සඳහන් කළෙමි. වාජ්බායි, අද්වානි බාබර් මස්ජිදය පිළිබඳ පවසන විට ඔබලාගේ මන්ත්‍ර ගුරුකම් බලයෙන් වැසිය නොහැක්කේ මන්ද? මොකක්ද අගමැතිට මෙහෙම කිව්වේ කියා මට විරුද්ධව පැමිණිලි කරන්න පුළුවන්, නමුත් මෙය නොවේද සත්‍ය. ඇත්ත වශයෙන්ම කියනවා නම් මෙම මන්ත්‍ර ගුරුකම් වලට කිසිදු බලයක් නැත. අල්ලාහ්ගේ කැමැත්තෙන් තොර මෙම විශ්වයෙහි කිසි දෙයක් සිදු නොවෙයි.

වෙනත් ඔබගේ ප්‍රශ්නයන්ට පිළිතුරු දීමේ වැඩසටහකුත් පැවැත්වීමට නියමිත නිසා, මා ඉස්ලාම් දහම පිළිගත් පුවත කෙටියෙන් විස්තර කර, මා ඔබෙන් සමුගැනීමට අපේක්ෂා කරමි. ඒ සඳහා වැඩි වේලාවක් අවශ්‍ය වූවත් මා කෙටියෙන් එය විස්තර කරමි.

"ස්වාමි ආනන්දා, මුහම්මද් මුහිබ්බුල්ලාහ්" යනුවෙන් පරිවර්තනය වූයේ කෙසේද?. මෙම පුවත දැනගැනීමත් සමග ලෝකය පුරා සිටින බෞද්ධ ආගමික නායකයින් අතර ලොකු ආන්දෝලනයක් ඇති විය. එය ඇසූ සැනින් බෞද්ධ ආගමික නායකයින් ඉන්දියාව බලා පිටත් වී එන්නට විය. අද දින මා මුස්ලිම් සමාජයෙහි ඇසුරු කරන්නන් අනන්තයි. නමුත් එම අවස්ථාවෙහි මා තනිවයි සිටියේ, වැඩිම උනත් මා ඇසුරු කල සංඛ්‍යාව පහක් දහයක් අතර වේ. බෞද්ධ ආගමික නායකයින් 60 දෙනෙකු ලෝකය පුරා සිට ඉන්දියාවට පැමිණිය. ප්‍රශ්ණය උග්‍ර තත්ත්වයකට හැරී ඇත. ඉස්ලාම් දහමට ගිය නුඹව සුළුවෙන් අත්හරින්නට

නොහැක. නුඹව විනාශ කිරීමටයි අප පැමිණ ඇත්තේ. මෙලෙස අඛණ්ඩව සතියක් වාද විවාද පැවතෙමින් තිබුනි. කිසිදු සාකච්ඡාවක් එළ නොදුන්නේය. අවසානයේ දී මා කීවේමි මාගේ සියළු සේ සත, ඇමෙරිකාවෙහි වෙනත් රටවල් වල පවතින සියළු සම්පත් අත්පත් කරගෙන මා අත්හරින ලෙසයි. මාගෙන් කිසිදු බාධාවක් ඔබලාට නැත, නමුත් ඔවුන් පැවසුවේ, එය අපට අවශ්‍ය නැත. අපට අවශ්‍ය වී ඇත්තේ නුඹයි. වෙනත් රටවල්වල සිටින බෞද්ධ ආගමික නායකයින් පිළිබඳ පවසන විට කව්ද? කොහෙද? යනුවෙන් ප්‍රශ්න කරති. නමුත් "ස්වාමි ආනන්දා" කියා මාගේ නම කියූ සැනින් මන්ත්‍ර ගුරුකම් කරන, යක්කු කුප්පිවල දමා වසන, ඔබලා කලබල වෙන්නට එපා වසන බව මා කියමින් සිටියෙමි. ඔවුන් එය විශ්වාස කළෝය. මුළු ලෝකයටම දන්නා ප්‍රචලිත පුද්ගලයකි. එසේ ප්‍රචලිත කෙනෙකු ඉස්ලාම් දහම පිළගත්තා යන ආරංචිය ලෝකය පුරා පැතිර යන විට බෞද්ධ ආගම තුළ කුමක් වත් නැද්ද? යන ප්‍රශ්නය ජනතාව තුළ ඇතිවෙයි එබැවින් නුඹව සුළුවෙන් අත්හැරීමට නොහැක. නුඹ අපත් සමග පැමිණිය යුතුයි, යනුවෙන් තරයේ ප්‍රකාශකරමින් සිටියෝය.

මා අවසන් වශයෙන් මෙය මාගේ නිදහස, මට කැමති දහමක් පිළිපැදිය හැක, මාගේ කැමැත්ත අනුවයි මා මෙම මාර්ගය තෝරා ගත්තේ, කිසිදු බල කිරීමකින් නොවේ. මා ශුද්ධවූ අල්කුර්ආනය අධ්‍යයනය කිරීමෙන් පසුයි, මා තුළ මෙම වෙනස ඇතිවූයේ. මෙන්න ශුද්ධවූ අල්කුර්ආනය ඔබලත් කියවා බලා තීරණයකට



එළඹෙන්න, යනුවෙන් පැවසුවෙමි. ඔවුන් එය ප්‍රතික්ෂේප කළෝය. මෙසේ සතියක් ගතවුනි.

අවසානයේදි එම ආගමික නායකයින් 60 දෙනාම පිටත්වී තම තමන්ගේ වාහනවලට නැගින්නට සැරසුනහ. එම අවස්ථාවෙහිදී මාත් සමග මුස්ලිම් වරු කිහිප දෙනෙකු සිටියේය. ඇමෙරිකාවෙහි සිටින මාගේ සහෝදරයකු පිළිබඳ, මීට පෙර සඳහන් කළෙමි. ඔහුද එහි විය. ඔහු දැඩි තීරණවලට එළඹෙන මනසකින් යුත් කෙනෙකි, ඔහු සිටි විලාශයද මා තුළ චකිතයක් ඇති කළේය.

පුරා වසර ගණනාවක් මා අධ්‍යාපනය ලද් මාගේ ගුරුවරයාද එහි විය. ඔහු හිස කෙස් විහිදා දැම්මේය, එය දිගට වවා තිබුනි. බෞද්ධ ආගමෙහි හිස කෙස් බූ ගැසිය යුතුයි යන නීතිය පැවතුනත්, ඔහුට ඒ පිළිබඳ කියනු ලැබුවත් ඔහු එය නොකළේය. ඔහු එයට පැවසු හේතුව මාත් බුද්ධත්වය ලබපු කෙනෙකි මා (බුදුන්ගේ වෙනත් ආත්මයක්) යන බවයි. ඔහු තම උඩු රැවුලද ඔතා තම සාක්කුවෙහි දමා ගනි. ඔහු මහත් කෙනෙකු වශයෙන් සළකනු ලැබූ කෙනෙකි. එම පස් දෙනා අතුරින් ඔහුද කෙනෙකු වේ. මා සිව්වැනියා ඔහු පස් වැනියා ඔහු ඔස්ට්‍රේලියානු ජාතිකයකි. ඔහු මේ ලෝකයෙහි කුමක් කීවත් සිදුවෙයි යනුවෙන් ජනතාව විශ්වාස කළෝය. මාද එය විශ්වාස කරමින් සිටියෙමි. මා හැම විටම ඔහු ඉදිරියේ ඉතා ගරු සරුවෙන් අත් දෙක බැඳ සිටීමට පුරුදුවී සිටියෙමි. පුරා අවුරුදු හතළිහක් ඔහුගේ දෙපා මුල සිටියෙමි.

ඔහු කෙනෙකු මිය යැයි කියා පැවසුවේ නම්, ඔහු මිය යන බව ජනතාව විශ්වාස කළෝය. ඔහුගේ මන්ත්‍ර බලයෙන් එය එසේම සිදුවන බව විශ්වාස කළෝය. නමුත් එසේ විය නොහැක. නමුත් සිදුවන්නේ කුමක්ද? කෙනෙකුට එසේ කී සැනින් ඔහු සිතන්න පටන් ගන්නේ ලොකු පූජකවරයෙකු මා මිය යන බව කීවා, එතැන් පටන් ඔහු ආහාර පාන ගන්නේ නැත, එය සිත සිතාම එම බියෙන්ම ඔහු මිය යන්නේය. ඉස්ලාම් දහම පිළිගැනීමෙන් පසු මේ සියල්ල මුලාව වශයෙන් මට තේරුනි. ආරම්භයේදී මා තුළත් මේ පිළිබඳ විශ්වාසයන් පැවතුනි.

කාරයට නැගීමට මොහොතකට පෙර, මා මෙතෙක් විස්තර කළ මාගේ ගුරුවරයා පොළොවේ සිට වැලි ටිකක් රැගෙන මා දෙසට විසි කර, නුඹට මා දින නියම කළෙමි මෙතැන් සිට දින 117 ක් ඇතුළත නුඹේ දකුණු කකුල හා දකුණු අත අක්‍රීය වනු ඇත. තවද නුඹ මිය යනු ඇත යනුවෙන් ශාප කළේය.

ඉස්ලාම් දහම පිළිගෙන දින 10 ක් හෝ 15 ක් පමණයි ගතවෙමින් තිබුනේ. නමුත් ඔහුගේ ප්‍රකාශයෙහි සීයට හැටක ප්‍රමාණයක විශ්වාසයක් මා තුළ පැවතුනි. මන්ද මා ඉස්ලාම් දහමට නවකයෙක්. මිය යෑම පවා ප්‍රශ්නයක් නැත නමුත් මාගේ ගුරුවරයා මාගේ වම් අත හා වම් කකුල අක්‍රීය වන බව පැවසීම මා තුළ වද දෙන්නට විය. නමුත් දවස් ගෙවෙන්න, ගෙවෙන්න ඔහු කෙරෙහි ඇති විශ්වාසය සීයට හතළිහක් වශයෙනුත්, අල්ලාහ් කෙරෙහි ඇති විශ්වාසය සීයට 60 ක් වශයෙනුත් වැඩි විය. නමුත් මා තුළ බියක් දිගටම



පැවතුනි. තවද ඔහුගෙන් මට දිගටම තර්ජනද පැමිණෙමින් තිබුනි. දින 40 ක් දැන් ගතවී හමාරයි, දින 50 ක් ගතවී හමාරයි, දින 60 ක් ගතවී හමාරයි යනුවෙන් ඔහු මා තර්ජනය කරන්නටද විය. දින 100 ක් දක්වා මාද ගණිමින් සිටියෙමි. නමුත් ඉන් පසු මට තිබුනු කාර්ය බහුලත්වය නිසා ගැනීමට අමතක විය. ඉන් පසු පැමිණි දින කිහිපය ගැනීමට අමතක කළෙමි. එම කාලය තුළ වෙනත් රාජ කාරි වැඩි විය. මෙම රටෙහි සිට වෙනත් රටකට පියාසර කරන්නට සූදානම් වෙමින් සිටියෙමි. නමුත් මාගේ අතේ · තියෙන්නේ රුපියල් 65ක් පමණයි.

මා ඉස්ලාමයට පිළිගන්නා විට සියල්ල අත්හැර දමා තනි පුද්ගලයෙකු වශයෙනුයි පැමිණුනේ. මා ළඟ තිබුනු සොච්චමත් ගමන් බිමන් යෑම සඳහායි. මා ඒ සියල්ල අත්හැර දැමුවේ, සාමාන්‍ය ජනතාව රවට්ටා, මුලාකර උපයපු මුදල්. මන්ත්‍ර ගුරුකම් තුළින්, අර වරම් මේ වරම් ලබා දෙන බව පවසා දෙපාවලින් පාගා ආශිර්වාද කිරීමෙන් මෙන්න මේ ආකාරයට ව්‍යාජ ලෙස උපයපු මුදල්, එය සතු කරගැනීම මා පිළිකුල් කළෙමි.

මා ශුද්ධවූ ස්ථානයක් වෙතයි ගමන් කරන්න යන්නේ, අපරාධයෙන් උපයා ගත් එම මුදල් මට අවශ්‍ය නැත. මට ජීවත් වීම සඳහා ආහාර වේලක් ලැබුනොත් ප්‍රමාණවත්. මා අල්ලාහ් පිළිබඳ පවසමින් සිටින විට මා මිය ගියා නම් එයයි මගේ සතුට. එම සතුට මට ප්‍රමාණවත්.

මට ලෝකය පුරා සංචාරය කරන විට කුමන රටවල්වලට යෑමට අනුමැතිය නොලැබුණේද, එම ස්ථානය බලා යෑමට මට දැන් අවස්ථාව උදාවී ඇත. ජනතාව දැන් හජ් යාත්‍රාව ඉටු කිරීම සඳහා යන කාලයයි. මටත් ඒ වෙනුවෙන් අවස්ථාවක් උදාවී ඇත. හජ් යාත්‍රාව යනු ඉස්ලාමීය මූලික කරුණු අතුරින් එක් කරුණකි. මා සතුව කිසිදු මුදලක් නොවීය, එම ශුද්ධවූ ස්ථානය මේ දෙනෙත් වලින් දැකීමට මට අවස්ථාවක් ලැබී ඇත. මේ මගේ ජීවිතය ස්වර්ණමය අවස්ථාවක් යන සතුට නිසා මා දින ගැනීමට අමතක කළෙමි. දින සීයකට ඉරි ගසා තිබුනි. ඉන් පසු මට ගැනීමට අමතක විය. යළිත් එය බලා සටහන් කර ගත්තෙමි. ඉන් පසු මක්කාවෙහි පිහිටි ශුද්ධවූ එම ස්ථානයෙහි යාත්‍රාවන් නිම කර මා අරෆා කඳු වැටියේ සිටින විට 117 වැනි දින නිම විය. අරෆා දිනය යනු වැදගත් දිනයක් හා එම ස්ථානයද වැදගත්ය.

මට ඉන් පසු මහත් ලොකු මන්ත්‍ර ගුරුකම් කරන්නෙකුගේ වචනවලට කිසිම ශක්තියක් හෝ බලයක් හෝ නොමැත. නමුත් මා ඉස්ලාම් දහම නොපිළිගෙන සිටියේ නම් අනිවාර්යෙන් මා මිය යනු ඇත. දින 60 කින්ම මා මිය යනු ඇත හේතුව මා තුළ ආක්‍රමණය කරන බිය හා චකිතය නිසාමයි.

ලොකු පූජකවරයෙකුයි මෙම ශාපය කළේ එය හිත හිතාම නොකා නොබී මා මිය යනු ඇත නමුත් ඉස්ලාම් එවැනි විශ්වාසයන් සියල්ල මුලිනුපුටා දමයි. අල්ලාහ්ගේ කැමැත්තෙන් තොර මේ කිසි දෙයක් සිදුනොවෙයි යනු ඉස්ලාමීය දැඩි විශ්වාසයයි. එබැවින්



ඔබට මා කියන්නේ අල්කුර්ආනය අධ්‍යයනය කරන්න. ඉස්ලාම් පිළිබඳ දැනුම සොයන්න, එය පිළපදින්න. මට වෙනත් අවස්ථාවක් උදාවූයේ නම් මීටත් වඩා පුළුල්ව මා කරුණු පහදා දීමට කැමැත්තෙන් සිටිමි.

## ඉස්ලාමය කරා (උමර් රාව්)!

අල්ලාහ්ගේ කරුණාවෙන් පිදුම් ලැබූ "මුහම්මද් උමර් රාව්" වන මා ඉන්දිය ජාතිකයකි. මාගේ 18 වැනි වියෙහිදී ඉස්ලාම් දහම වැළඳ ගත්තෙමි. දැනට අවුරුදු හයක් ගත වී ඇත. මාගේ ජීවිත කාලය තුළ මා මුහුණ දුන් අත් දැකීම් ඔබ සියල්ලන් සමග බෙදා ගන්නට කැමති වෙමි. මුස්ලිම් නොවන සහෝදරවරුන්ද මෙය කියවා සත්‍ය වටහා ගත යුතුයි යනු මාගේ අපේක්ෂාවයි.

මාගේ ජීවිත තොරතුරු දෙදෙනෙකු සමග බෙදා ගත්විට මා ගත් තීරණය නිවැරදි බව ඔවුන් පවසා මා දිරිගැන්වුවේය.

**මාගේ ජීවිතය :**

මා මධ්‍යම පන්ති බ්‍රාහ්මන පවුලක උපත ලද කෙනෙකි. මාගේ පියා ඉන්ජිනේරුවෙකු හා මාගේ මව ගුරුවරියකි. මාගේ මවගේ සහෝදරයා වන මාමාගේ නිවසෙහි සිටයි මා ආගමික අධ්‍යාපනය ලබාගත්තේ. මාගේ පවුලේ සියල්ලන් හැදෑරු අධ්‍යාපනය මුස්ලිම් වරුන්ට විරුද්ධව පැවතුනු නිසා මා තුළ ද මුස්ලිම් වරුන් පිළිබඳ වැරදි ආකල්පයක් ගොඩ නැගී තිබුනි. කෙටි කාලයක් මා RSS හි සාමාජිකයෙකු වූ නිසා මුස්ලිම් වරු පිළිබඳ වෛරය තවත් ප්‍රගුණ විය. මුස්ලිම්වරුන්ගේ සිද්ධස්ථානයන්හි (අදාන්) ශබ්ද නගා කැඳවීම ඇසෙන විට මා අසන ගීතයන්හි නාදය වැඩි කර එය නොඇසීමට වගබලාගත්තෙමි. නගරයේ ඇති කෝවිලක් පාසා ගොස් යාඥාවන් කරන්නෙකු වශයෙන්



සිටියෙමි. මේ සඳහා මාගේ නිවසේ සියළු අය මා දිරිගැන්වුවේය.

**නැවුම් අත්දැකීම:**

එක් ග්‍රීශ්ම ඍතුවෙහි නිවාඩුවක මුස්ලිම් ව්‍යාපාරියෙකුගේ වෙළඳ සැලක පාලන අංශයෙහි වැඩ කිරීම සඳහා මාගේ මව මා කැඳවුවේය. එයට මා එකග නොවෙමි. කුඩා වියෙහි සිට මුස්ලිම්වරුන් පිළිකුල් කළ නිසා මා එය ප්‍රතික්ෂේප කළෙමි. මාගේ ස්ථාවරය වටහා ගත් මාගේ මව ඉන් පසු ඒ පිළිබඳ කිසිවක් නොකිවේය. සමහර ග්‍රීස්ම ඍතුවෙහි නිවාඩු වල මුස්ලිම් නොවන අයගේ ව්‍යාපාර කටයුතු වල සම්බන්ධ වී මා වැඩ කළෙමි. එයට මාගේ දෙමාපියන්ද විරුද්ධ නොවිය. කාලයක් ගත වීමත් සමග මාගේ අධ්‍යාපන කටයුතු වල කාලය යොමු කිරීමට අවශ්‍ය වූ නිසා වරුවක් පමණක් ව්‍යාපාර කටයුතුවලට සම්බන්ධ වුනෙමි.

මාගේ මව හා සහෝදරිය මුස්ලිම් වරුන්ට අයත් ආයතනයක මාස දෙකක කාලයක් තාවකාලිකව වැඩ කළහ. එම මාස දෙක ඇතුලත ඔවුන් තුළ මුස්ලිම් වරුන්ගේ ක්‍රියා කලාපයන් පිළිබඳ පැහැදීමක් ඇති වී තිබිනි.

මා පිළිකුල් කරන මුස්ලිම්වරුන් පිළිබඳ කව්රුන් හෝ පක්ෂපාතීව කථා කරයි නම් මට එය වාවාගන්නට නොහැකිය. මෙවැනි තත්ත්වයක් තුළ මාගේ මවගේ හා සහෝදරියගේ බල කිරීම නිසා සමහර මුස්ලිම්වරුන්

සමග එක්ව් වැඩ කිරීමට මට සිදුවිය. අකමැත්තේ හෝ එම ආයතනයේ වැඩට එක්වුනු මා තුළ මුස්ලිම්වරු පිළිබඳ පැවතුනු වැරදි ආකල්පය තවත් වැඩිවිය. එයට හේතුව එම ආයතනයෙහි වැඩ කළ මුස්ලිම් නොවන සමහර අය ඉස්ලාම් දහම පිළිගෙන සිටීමයි. ඇයි ඉස්ලාම් දහමට ඔවුන් මෙතරම් මූලිකත්වය ලබාදෙන්නේ? මා පිළිපදින හින්දු ආගමයි ඉතා උසස් වන්නේ ඔවුන්ට එය අවබෝධ කර දීම් සඳහා ඉස්ලාම් හා ඉන්දු දහම අතර ඇති සමානකම් පිළිබඳ අධ්‍යයනය කිරීමට මා පටන් ගත්තෙමි. එම අවස්ථාවෙහි සිට ඉස්ලාම් පිළිබඳ වැඩි වශයෙන් දැනගැනීමට මා තුළ උනන්දුවක් ඇති විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් අල්කුර්ආනයෙහි ඉංග්‍රීසි පරිවර්තනය කියවුවෙමි. එය හදාරා එහි අර්ථය නිසි ලෙස වටහා ගන්නට පටන් ගත් විට මාගේ තරුණ විය මුළුමනින් වෙනස් විය. මා කරමින් සිටි වැරදි ක්‍රියාවන් පිළිබඳ මා තුළ බියක් ඇතිවුනි. මාගේ ඉන්දු දහම පුරාණ කථාවන් හා මනඃකල්පිත දේවලින් පිරුනු දහමකි යනු මට අවබෝධවෙන්නට විය. ඉන් පසු මා තුළ බොහෝ සැක සංකා පහළවෙමින් පැවතිනි. මාගේ රාජකාරිය කුමක්ද? මා කෙසේ සිටිය යුත්තේ? මා කළ යුත්තේ කුමක්ද? ඇයි මෙම සත්‍ය පණිවුඩය බොහෝ අයට නොලැබුනේ? මෙවැනි මා තුළ මතුවූ විවිධ ප්‍රශ්නවලට පිළිතුරු සෙවීම සඳහා මාගේ පාසැල් අවදිය මා වැය කළෙමි.

මාගේ දෙමාපියන්ගෙන්, අවට සිටින්නන්ගෙන් මා ප්‍රශ්න කළෙමි. දෙවියන් නෙත්වලින් දුටු අය කව්රුන් හෝ සිටිද? කුමන පදනමක් මතද රූපයන් ප්‍රතිමාවන් ඇති කරන්නේ? එයට, දෙවියන්ව දුටු අය කව්රුත් නැත යනු



ඔවුන්ගේ පිළිතුර විය. මා අවසානයෙහි සමහර පුරාණ කතාවන් කියවීම තුළින් ඇත්ත තත්ත්වය යම් දුරකට අවබෝධ විය. ඉන් පසු මෙම හින්දු දෙවිවරුන්ගේ කථා මා තුළ ඒ තරම් බලපෑමක් ඇති නොකළේය.

මාගේ දේමාපියන්ගෙන් යළි ප්‍රශ්න කළෙමි. සෑම හින්දු ග්‍රන්ථයක්ම ප්‍රතිමා වන්දනාවට විරුද්ධ වෙයි, නමුත් අපි එය දිගටම කරමින් සිටිමු. කොහොමද? කුමන පදනමක් මතද මෙම ප්‍රතිමා වන්දනය? මේ ප්‍රශ්නය නිසා ඔවුන් මා කෙරෙහි ප්‍රකෝප වී අපේ මුතුන් මිත්තන් කළදේයි අපි දිගටම කරන්නේ යනුවෙන් පැවසූහ. මෙම පිළිතුරෙන් මා සෑහීමට පත් නොවුයෙමි.

පසු දින අල්කුර්ආනයේ දෙවැනි පරිච්ඡේදයෙහි පාඨයක් මාගේ දෙනෙත් වලට ගැටී මා මවිතයට පත්වුනෙමි.

"තවද අල්ලාහ් අනාවරණය කළ මෙම (ග්‍රන්ථය) අනුගමනය කරන්න! යනුවෙන් ඔවුන්ට පැවසූ විට, ඔවුන් එසේ නොව! අපේ මුතුන් මිත්තන් කුමන මාර්ගයෙහි (ගමන් කිරීම) දුටුවෙමුද, එම මාර්ගයම අපිත් අනුගමනය කරන්නෙමු! යනුවෙන් පවසති; ඔවුන්ගේ මුතුන් මිත්තන් කිසිවක් කල්පනා නොකර, නොමග ගියවුන් වශයෙන් සිටියත්ද"? (ශු අල්කුර්ආන් 2: 170).

මෙම කුර්ආන් පාඨය මා තුළ මහත් බලපෑමක් ඇති කළේය. ඉන් පසු පූජාවන්, ප්‍රතිමා වන්දනාව කෙමින් කෙමින් අත්හැරියෙමි.

සකල විශ්වයේ නිර්මාතෘවරයා වන අල්ලාහ්ත් සමග හවුල් කරුවන් ඇති කිරීම බලවත් වරදක් සේ මා අවබෝධ කරගත්තෙමි.

මා මුල් දිනවල ඉස්ලාම් දහම රහසිගතව පිළිපැද්දෙමි. අල් බකරා පරිච්ඡේදයෙහි තවත් ස්ථානයක මෙසේ සඳහන් වෙයි: "තවද (මෙම ව්‍යාජ විශ්වාසවන්තයින්) විශ්වාසවන්තයින් හමුවූ විට අපි විශ්වාස කළවුන් යනුවෙන් පවසති; නමුත් ඔවුන් තම (ප්‍රමුඛයින් වන) ෂෙයිතාන්හු සමග තනිව සිටින විට, නියතයෙන්ම අපි ඔබත් සමගයි. අපි ඔවුන්ව සමච්චල් කිරීම (සඳහා) පමණයි යනුවෙන් පවසති" (ශු අල්කුර්ආනය 2: 14).

ආල ඉම්රාන් නම් පරිච්ඡේදයෙහි අල්ලාහ් මෙසේ සඳහන් කරයි: "අල්ලාහ් ඉදිරියේ පිළිගැනුනු එකම දහම ඉස්ලාම් වේ" (ශු අල්කුර්ආනය 3: 5).

ඉන් පසු තවත් මා තුළ පැහැදීමක් ඇති විය. මාගේ සිත තුළ හිරවී තිබුනු සියළු පැනයන්ට පිළිතුරු මෙම අල්කුර්ආනයේ පමණයි තිබෙන්නේ යනු මට අවබෝධ විය.

අල්ලාහ්ගේ දයාවට අනුව ඉස්ලාම් පිළිබඳ මා දැනුවත් වූ කරුණු මාගේ නිවසේ අයටත් මා පැහැදිළි කළෙමි.

ඩිප්ලෝමා අවසන් වසරේ මා ඉගෙන ගනිමින් සිටින විට ඉස්ලාම් වෙත මා කෙමින් කෙමින් නැඹුරු වීම දුටු මාගේ දෙමාපියන් මා ගෙදරින් පන්නා දැමූහ. මාගේ සහෝදරියද ඉස්ලාම් දහම පිළිගෙන මාත් සමග පිටත්



විය. මා හා මාගේ සහෝදරිය නිවසින් පිටත්වී වසරක කාලයක් කිසිදු ආදායමකින් තොර අමාරුවෙන් කල් ගෙවුවෙමු. නමුත් එවැනි තීරණාත්මක අවස්ථාවන්හි පවා ඉස්ලාම් කෙරෙහි තිබුනු ආදරයෙහි කිසිදු අඩුවක් නොවීම නිසා අපේ සියළු දුක් කරදර අල්ලාහ් පහසු කර දුන්නේය. අල්හම්දුලිල්ලාහ් අල්ලාහ්ට සියළු ප්‍රශංසා හිමිය.

ඉතා අඩු ආදායමක් ලැබුනු රැකියාවක් අපි දෙදෙනා කළෙමු.

මේ වෙනුවෙන් සියළු පීඩා විඳ දරාගත්තෙමු. අල්ලාහ් යහපත් වාතාවරණයන් රාශියක් අපට උදාකර දුන්නේය. පස් වේල සලාතය නිසි ලෙස ඉටු කිරීමට අපහසුවූ නිසා මා මීට පෙර වැඩ කළ ස්ථානයෙන් ඉල්ලා අස්වුනෙමි. මේ හේතුව නිසා හොඳ ආයතන පවා මාගෙන් ගිලිහී ගියේය. ඒ සියල්ල මා අල්ලාහ් වෙනුවෙන් විඳ දරාගත්තමේ.

අල්හම්දුලිල්ලාහ් අල්ලාහ්ගේ කරුණාවෙන් මට දැන් හොඳ රැකියාවක් ලැබී ඇත. සලාතය නියමිත වේලාවට ඉටු කිරීමට කිසිදු බාධාවක් නැත.

සියළු ප්‍රශංසා අල්ලාහ්ට හිමිය.

# අබ්දුල්ලාහ් මනුලාල්!

## මා ඉස්ලාම්යෙකු වූ දා ...... !

බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්

උපතින් ශ්‍රී ලාංකික බෞද්ධයෙකි. ජීවිතයේ ඇති අඩු පාඩු සපුරා ගැනීමේ අරමුණින් යුතුව සෞදි අරාබියට මා පිවිසියේ පින්තාරු කරුවෙකු ලෙසිනි. මා තිදරු පියෙකි. දෙමාපිය උරුමයෙන් ලද ආගම අනුව ජීවිතය ගෙන යමින් කටයුතු කළ මා ලැබෙන සෑම විවේකයකදීම පොත් පත් කියවීම කරනුයේ මගේ එක් විනෝදංශයක් ලෙසටය. නමුත් මෙරටට පැමිණීමෙන් පසු පෙර මෙන් පොත් බැලීම සීමාවිය. එහෙත් එය නතර නොවීය. සේවා ස්ථානයේ අවශ්‍යතාවය අනුව අල් කෝබාර් සිට අබූ හද්රීයා ප්‍රදේශයට සේවය කිරීම පිණිස මා හට යෑමට සිදුවිය. මෙලෙස සේවය කරන අතර තුරදී අහඹු ලෙස ලැබුනු පොත් දෙක කියවුවෙමි. එම පොත් දෙක ඉස්ලාම් ධර්මය ගැන සඳහන් පොත් දෙකකි. එම පොත් දෙකෙහි නාමයන් මෙසේය.

1- සලාත්

2- නිසි ආශ්වාදයට නිසි මග.

පොත් දෙකෙහි අඩංගු කරුණු තුළින් මා සිත වෙනස් වීම සිදුවූයේ වසර 42 ක කාලය පුරාම මා විශ්වාස කරමින් හා ඒ අනුව කටයුතු කළ අයුරු මා විසින්ම තර්කානුකූලව සිතා ගැනීමෙන් අනතුරුවය.



දයාබර මෑනිවරුනි! පියවරුනි! සහෝදර, සහෝදරියනි! මාගේ හදතුල ඉස්ලාම් කෙරෙහි ඇතිවූ භක්ති ප්‍රණාමය මෙලෙස මාහට හැකි අයුරින් සටහන් කරනුයේ ඇත්තටම මෙලොව ජීවිතය යහපත් ලෙස පවත්වාගෙන යෑමටත් ඉන් අනතුරුව පරලොව ජීවිතයද යහපත් වන බව තමන්ටම සනාථ කර ගත හැකි කරුණු ස්වභාවිකව පෙනෙන නිසාය.

මගේ හදවතට එකඟව මෙම සටහන ලියා ඉදිරිපත් කරනුයේ ඇත්තටම මතු දිනයක මෙය සෙසු අයටද දැක බලාගෙන ජීවිතය සාර්ථක කර ගැනීමට හැකියාව ලැබෙත්වා! කියා ප්‍රාර්ථනා කරමිනි. ඔබ සැමට විශ්වයාධිපතිවූත්, ඔබ අප සැමගේ ආරක්ෂකයානන්වූත්, පෝෂකයානන්වූත්, පරම දයාබර අල්ලාහ්ගේ කරුණාව ලැබේවා!

ඉතින් දයාබරන මෑනි වරුනි! පියවරුනි! සහෝදර සහෝදරියනි! මා ඉස්ලාමිකයෙකු වූ දා යන මාතෘකාව යටතේ සකස් කරන මෙම සටහන තුළින් ප්‍රථමයෙන්ම මා පිළිබඳ කෙටි හඳුන්වාදීමක් කරනු ලැබූ අතර එමගින් මෙය කියවනු ලබන ඔබ සැම මා ගැන තරමක හෝ දැනුවත් වීමක් වූවා කියා මා විශ්වාස කරමි. ඉතින් මා මෙම තත්ත්වයට එහෙම නැතිනම් ඉස්ලාම් වැළඳ ගැනීමට තරම් මසිතට පිවිසි කරුණු කාරණා ගැන සහ එම කරුණු මා ලද අයුරුත් එම කරුණු සඳහන් පොත් පත්වල කතෘවරයා ගැනත් යමක් නොසිටියහොත් මා එක් යුතුකමක් පැහැර හැරියා වගේ

සිතුව නිසා මෙම සටහන් අවසන් පරිච්ඡේදයෙන් එම යුතුකම ඉටු කිරීමට මාගේ මෙම සූදානම.

මා ඉස්ලාම් දහම ගැන පීවිතය කියවනු ලැබූ ප්‍රථම පොත් දෙක නම් "නිසි ආශ්වාදයට නිසි මග" සහ " සලාත්" නම් වූ පොත් දෙකයි. ඉතින් මෙම පොත් දෙක අතුරින් "නිසි ආශ්වාදයට නිසි මග" යන පොත රචනා කරමින් සකස් කර කතෘවරයා වූයේ ජුබෙල් නගරයෙහි පිහිටි විදේශිකයන් කැඳවීමේ කාර්යාලයෙහි කැඳවුම් කරු ලෙසින් ඉතාම කැපවීමකින් කටයුතු කරන මුහම්මද් අස්හර් මුහම්මද් යූසුෆ් මාතායි, එතුමා ශ්‍රීලාංකිකයෙකි, සෞදි අරාබියට පැමිණ විශ්වයේ මැවුම් කරුවානන්වූද ඔබ අපගේ පෝෂකයානන් වූද ආරක්ෂකායනන් වූද එකම දෙවි හූ සර්ව බලධාරී අල්ලාහ්ගේ ඒක දේව වාදය තුළින් ප්‍රජාවට නිවැරදි ජීවන මාර්ගෝපදේශයක් ආගමානුකූලව තෝරා ගැනීමට උදව් කරන අල්ලාහ් දෙවිඳුගේ දසයෙක් වැනිය. මම මෙමගින් එතුමන්ට අල්ලාහ් දෙවිඳුන්ගේ ආශිර්වාදය ලැබී එවන් සාර්ථක කෘතීන් තව තවත් ලියා ජනතාවට යොමු කිරීමට හැකියාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරන අතරම මාගේ හද බැඳි ප්‍රණාමයද එතුමන් හට පුද කර සිටිමි.

ඒ වගේම මා සමග ප්‍රථමයෙන් ඉස්ලාම් දහම ගැන කථා කරමින් මූලික දැනුවත් කිරීම කර අදාල පොත් පත් ලබා දී මගේ ඉස්ලාම් දැනුම වර්ධනය කරගැනීමට සහය වෙමින් ඉස්ලාම් දහමට අනුව ඉස්ලාමීකයෙකු වීමට අවශ්‍ය කරන සියළු කටයුතු සම්පූර්ණ කරදී මාව ඉස්ලාමයට ඇතුල් කර දුන් අල්හෆ්පි ඉස්ලාම්



මධ්‍යස්ථානයෙහි සිටින ශ්‍රී ලාංකීක මෞලවි මුහම්මද් ලාෆිර් මාගේ හද බැඳි ප්‍රණාමය පුද කරමින් එතුමන්ටද සර්ව බලධාරිවූ අල්ලාහ් දෙවිඳුන්ගේ ශාන්තිය සමාදානය සහ ආශිර්වාදය ලැබී සියළු කටයුතු සාර්ථකව කරගැනීටම හැකියාව ලැබේවා යනු ප්‍රාර්ථනා කරමි.

තවද මා හට ඉස්ලාම් දහම ගැන දැනුම වර්ධනය කරගැනීම පිණිස නන් අයුරින් දැනුවත් කළ සියළු දෙනාටම මාගේ හෘදයාංගෙන්ම ප්‍රණාමය පුදකර සිටිමි. ඉතින් එවැනි දැහැමි සේවාවක ප්‍රතිඵලයක් ලෙසින් මා ඉස්ලාමය පිළිබඳ දැනුවත් වී යථාර්ථවාදීව ජීවත්වීමට හැකි පැහැදිලි හා සරළ ඒ වගේම ස්වභාවික ආගම් දර්ශනයක් තුළින් මෙලොව ජීවිතයත් මරණින් මතු ජීවිතයත් සාර්ථක කර ගත හැකි බව මා වටහා ගනිමින් මේ දක්වා කළ නමස්කාර රටාව නතර කරමින් ලා ඉලාහ ඉල්ලල්ලාහ් මුහම්මදුර් රසූලුල්ලාහ් යන වැකිය මාගේ ආගමේ තේමාව කරගනිමින් ජීවත්වීම ආරම්භ කිරීම සූදානම් වෙමින් මා ඉස්ලාම් දහම වැළඳ ගත්තෙමි. ඉතින් මේ කියවනු ලබන ලොකු කුඩා සෑම සියළු දෙනාගෙන්ම කරනු ලබන ආයාචනය මෙයයි. තමන් ෂතු බුද්ධිය දැනුම තුළින් පෝෂණය කරගන්න. එම දැනුම නිවැරදි ක්‍රමයට ලබා ගැනීමට අදාල පොත් පත් කියවා තේරුම් ගෙන මෙලොව ජීවිතයත් මරණින් මතු ජීවිතයත් සාර්ථක කරගැනීමට යථාර්ථය අවබෝධ කරගත හැකි ඉස්ලාම් ආගම් දර්ශනය පිළිබඳ දැනුවත් වන්න කියා ආයාචනා කරමි.

# අබ්දුල්ලාහ් මනුලාල්ගෙන් ඔබටත් ඇරයුමක්!

## අස්සලාමු අලෛකුම් වරහ්මතුල්ලාහ්

ඔබට අල්ලාහ්ගේ ශාන්තිය හා සාමය හිමිවේවා!

කියවනු ලැබූ පොත් පත් ඇසුරෙන් මා දැනුවත්වූයේ ඉස්ලාම් යන වචනය යෙදී තියෙන්නේ ආරාබි භාෂාවේ වදනකිනි. මෙහි අර්ථවන වනුයේ සාමය හා අවනතවීමයි. ඉස්ලාම් ධර්මය වැළඳ ගත් අය මුස්ලිම් යැයි නම් වී ඇත. මුස්ලිම් අය සැබෑ ලෙසම ඉස්ලාමය අනුව ජීවත්වනුයේ, අල්ලාහ් දෙවිඳුන් මෙලොවට යොමු කළ අවසන් ශාස්තෘවරයානන් වූ මුහම්මද් (සල්) තුමාගේ ජීවිතය තුළින් මුළු මහත් මානව වර්ගයා හමුවට අල්ලාහ් දෙවිඳුන් ඉදිරිපත් කළ දේවත්වය තුළින් සැක සූ ජීවන මාර්ගෝපදේශය භක්තිමත්ව පිළිගනිමිනි. තවද මොවුහු අල්ලාහ්ට බැතිමත්ව උන්වහන්සේගේ මගපෙන් වීම හා නබි තුමාගේ දේශණා (හදීස්) අනුව ජීවිතය හැඩගස්වාගෙන ජීවත් වනවා කියන පොරොන්දුවද ඇතිවය.

මෙම අදහස පිළිබිඹු කරවන කරුණ මා දුටුවේ සිංහල පරිවර්තනයෙන් තිබූ සලාත් නම් පොත බැලීමෙනි. " අෂ්හදු අන්ලාඉලාහ ඉල්ලල්ලාහු වඅෂ්හදු අන්න මුහම්මදර් රසූලුල්ලාහ්" ඉස්ලාම් භක්තිකයෙක් ලෙස මෙලොව සිටින සහ ඉස්ලාම් භක්තිකයෙක් වීමට අදහස් කරන සියළු දෙනා මූලිකව පිළිගත යුතු හා පිළිපැදිය යුතු ප්‍රධාක කරුණු කීපයක් ශුද්ධවූ අල්කුර්ආනයෙහි



ඇති බව මුහම්මද් නබි (සල්) තුමන් විසින් අවධාරණය කරන ලදි. එය පිළිගෙන ඒ අනුව කටයුතු කරන අය සැබෑ ඉස්ලාම් භක්තියන් වූ මුස්ලිම් වරුන් වන බව පවසා ඇති අතර එලෙස කටයුතු නොකරන අය (කාෆිර්වරු- ප්‍රතිකෂේපකරුවන්) බව මා දුටුවෙමි.

එහි ඇති සාර්ථකත්වය හා නිවැරදි බව දැනට මා ගෙවාලන ඉස්ලාමික ජීවිතය තුළින් අත්දුටු කරුණකි. ඉහත සඳහන් කරනු ලැබූ විස්තරය ගැන මා දරන අදහස සහ දැනුවත් වී ඇති අයුරින් පැහැදිළි කිරීමක් කර ඉදිරිපත් කරනුයේ මෙය කියවනු ලබන ඔබ සැම හට වටහාගැනීමට පහසු වීම සඳහාය.

ප්‍රථමයෙන් ඉස්ලාම් භක්තිකයෙකු වශයෙන් කෙනෙකු විශ්වාස කළ යුතු මූලික කරුණු හය ගැන සහ අනිවාර්‍යයෙන් පිළිපැදිය යුතු කරුණු පහ ගැන විස්තර කරගනිමු. අරාබි ව්‍යවහාරයෙන් මෙයට ඊමාන් යැයි කියනු ලැබේ. (ඉස්ලාම් ධර්මයට අනුව)

1- ආමන්තු බිල්ලාහි, මෙහි අදහස අල්ලාහ් දෙවිඳුගේ ඒකීය භාවය පිළිගැනීම හා විශ්වාස කිරීම.

2- වමලාඉකතිහි, මෙහි අදහස අල්ලාහ් දෙවිඳුගේ දේව දූතයන් පිළිගැනීම සහ විශ්වාස කිරීම.

3- වකුතුබිහි, මෙහි අදහස අල්ලාහ් දෙවිඳු විසින් හෙළි කළ පුස්තක (ග්‍රන්ථ) පිළිගැනීම සහ විශ්වාස කිරීම.

4- වරුසුලිහි, මෙහි අදහස අල්ලාහ් දෙවිඳුගේ ධර්මය ප්‍රචාරය කිරීමට එවනු ලැබූ නබිවරුන් (ශාස්තෘවරුන්) පිළිගැනීම සහ විශ්වාස කිරීම.

5- වල්යව්මිල් ආඛිරි, මෙහි අදහස මරණින් පසු කරනු ලබන විනිශ්චය දිනය පිළිගැනීම සහ විශ්වාස කිරීම.

6- වල්කද්රි ඛයිරිහි වෂර්රිහි මිනල්ලාහි තආලා, මෙහි අදහස සෑම දෙයකම හොඳ නරක අල්ලාහ් දෙවිඳුගේ පෙර මිණුම අනුව ක්‍රියාවට නගන බව පිළිගැනීම සහ විශ්වාස කිරීමක. ඉහත පහදා ඇති කාරණා හය අවංකව විශ්වාස කරන අය, පිළිපැදිය යුතු හා ඒ අනුව කටයුතු කිරීම විනයානුකූලව අනිවාර්ය කර ඇත.

තවද ඉස්ලාමය සැබෑ ලෙසම ස්ථාපිත කරවන මූලික කාර්යයන් පහක් ඇති බව සඳහන් කර ඇති අතර ඒ ඉස්ලාමීය පංච ස්ථම්භය ලෙස හඳුන්වා දී ඇත. එය මා මෙසේ පැහැදිළි කරමි.

1- අල්ලාහ් දෙවිඳු හැර නැමදීමට අවනතවීමට සහ නීති සම්පාදනය කිරීමට වෙන කිසිම දෙවි කෙනෙකු නැති බවත් මුහම්මද් (සල්) අල්ලාහ්ගේ දසයා හා ශාස්තෘවරයා ලෙස පිළිගැනීම සහ විශ්වාස කිරීම.

2- දිනකට පස් වරක් සලාත් නැමදුම් ඉටු කිරීම.



3- ශුද්ධකාරක බද්ධ ගෙවීම මෙයට සකාත් යැයි කියනු ලැබේ.

4- රමළාන් මාසය තුළ උපවාසය ඉටු කිරීම.

5- හජ් වන්දනාව ඉටු කිරීම.

ඉහත සඳහන් සියල්ල විශ්වාස කරමින් ඒ අනුව කටයුතු කරන අය සැබෑ ඉස්ලාම් භක්තිකයන් හැටියට ජීවත් වනුයේ අල්ලාහ් දෙවිඳුගේ ආශිර්වාදයද ලබාගෙනය. මෙවන් තැනැත්තන්ගේ ජීවිත යහපත් ලෙස පවත්වාගෙන යෑමට කිසිම අපහසුවක් ඇති නොවන බව මාගේ විශ්වාසයයි. නමුත් අයහපත් ආකල්ප දරමින් සිටින විවිධ ඝනයේ වන්දනා කරන අය ඇති කරවන අපහසුතා මැඩගෙන අඛණ්ඩව නොසැලී කටයුතු කිරීමට ඊමාන් භක්ති ප්‍රකාශය පිළිගෙන නිවැරදිව කටයුතු කරන අයට අපහසුවක් නැති බවද මාගේ අත්දුටු විශ්වාසයයි. මෙවන් ආත්ම විශ්වාසයක් ඇතිව කටයුතු කරන සියළු දෙනාටම සර්ව බළධාරී වූ එකම දෙවි වූ අල්ලාහ් දෙවිඳුගේ ආශිර්වාදය නිරන්තරයෙන්ම ලැබෙන බවද මා තරයේ විශ්වාස කරන මූලික කරුණ වේ. කිසියම් විදිහකින් කෙනෙකුගේ ඊමාන් භක්තිය බිඳීගියහොත් ඉතාමත් අවාසනාවන්ත තත්ත්වයක් උදාවන බවද වටහාගැනීමට මාහට හැකියාව ලැබුනේ ඉස්ලාම් දහම ගැන සඳහන් පොත් බැලීමෙනි. මේ සියළු කරුණු ඔබ අපි සැම දෙනාගේම දෛනික ජීවිතය තුළින් ප්‍රායෝගිකව අත් විඳිය හැකි කරුණු බවද සඳහන් කරනුයේ අවංකවම අල්ලාහ්

දෙවිඳු නමස්කාර කරමින් අදහන අතරම අල්ලාහ් දෙවිඳුට ඇති බියත්, ලැදිකමත් නිසාමය.

කාරුණික හිතවතුනි! අපි සිතිය යුත්තේත්, බැලිය යුත්තේත් නිවැරදි දෙයයි. එහෙම නම් අපි පිළපැදිය යුත්තේද නිවැරදි දේ නම් අපි සෑම කෙනෙක්ම කළ යුතු ප්‍රථම කාරණය නම් තමන්ගේ බුද්ධියට එකඟව කටයුතු කිරීම නේද? මෙහි සාර්ථකත්වය උදා කරගැනීමට හැකියාව ලැබෙන්නේ දැනුම වර්ධනය කරගනිමින් ස්වභාව ධර්මයාගෙන් හා වෙනත් අයුරින් දකින අසන අත්විඳින සියළු දේ ගැන, ප්‍රායෝගිකව තම බුද්ධියට එකඟව සිතා ගැනීමෙන් පමණි. මෙහිදී අල්ලාහ් දෙවිඳු ඉදිරිපත් කළ ඉස්ලාම් දහම මගින් මානව වර්ගයාට ශුද්ධවූ අල්කුර්ආනය තුළින් මුහම්මද් (ස්ල) තුමාගේ ජීවිත ආදර්ශයෙන් හෙළි කළාවූ සදාචාරත්මක වැදගත්කම විදහා පාන විනයානුකූලව සකස් කරනු ලැබූ චර්යා ධර්මය අනුගමනය කළ යුතුය. මෙය අනුගමනය කරන අය ඉතාම පිරිසිදු චේතනාවෙන් අන් අයට අපහසුවක් ඇති නොවන අයුරින් ජීවත් වනුයේ සෙසු අයටද ආදර්ශයක් අත්කරවමිනි. මේ අනූව කටයුතු කිරීම ආරම්භ කරන අය සැබෑ ලෙසින්ම එලොව මෙලොව සාර්ථකත්වය උදාකරගන්නා බව හොඳ නරක තේරුම් ගත හැකි කුමන වර්ගයක වූවත් ජාතියක වූවත් කුමන රටක වූවත් ජීවත් වන බුද්ධිමත් අය තීරණය කරනු ලබන්නේ නිරායාසයෙනි. නමුත් කාලීනව හිතා බලන කළ දේවත්වය පවා අලෙවි කරමින්, සත්‍ය යටපත් කරවිමින් උරුමයෙන් යැයි පවසමින් ගතානු ගතිකත්වය තුළ අනුකාරයක යෙදී සිටින මිනිසුන් විසින්ම කරනු ලබන ක්‍රියා නිසාම මසිත



කල කිරි ඉස්ලාමය තෝරාගනු ලැබුවේ සියල්ල කෙරෙහිම මා ලද දැනුම හා අත්දැකීම් බුද්ධියට එකඟව සිතින්ම තර්කානුකූල සිතා බැලීමෙන් අනතුරුවය.

මා අද අල්ලාහ් දෙවිඳුගේ ආශිර්වාදයට ලක්වූ කෙනෙකි. මගේ උත්සහය මෙය රැකගෙන මෙලොව ජීවිතය යහපත් හා ආදර්ශමත් ලෙසින් පවත්වාගෙන පරලොව ජීවිතය සාර්ථක කරගැනීමය. එවිට ඊමාන් ප්‍රකාශයේ හය වැනි කරුණට බිය වීමට හා තැති ගැනීමට මා හට සිදු නොවන අතරම එම ප්‍රකාශයේ පස් වැනි කරුණට සැනසීමෙන් මුහුණ දීමට හැකියාව ඇති බව මා විශ්වාස කරන ඊළඟ කරුණය. මගේ එකම පැතුම මෙලොව සිටින සමස්ත ප්‍රජාවටම නිවැරදි දැක්මක් ඇති කරගැනීමට හැකියාව උදා කරගැනීම සඳහා කටයුතු කිරීමය. මෙයද එක් ආරම්භක උත්සහයකි. මෙය සාර්ථක කරගෙන යෑමට මා නිරතුරුවම මැවුම් කරුවාණන් වූත් දෙලොවෙහිම අධිපති වූත් සර්ව බලධාරී අල්ලාහ් දෙවිඳුගේ ආශිර්වාදයත් රැකවරණයත් නිරතුරුව පතමි. කාරුණික හිතවතුනි! මෙම සටහන සකස් කරන මා මීට මාස එකහමාරකට පෙර ඊමාන් භක්තිය අවබෝධ කරගෙන හදවතින් විශ්වාසකරගෙන ඉස්ලාම් භක්තිකයෙක් වීමට පවසන "අෂ්හදු අන්ලාඉලාහ ඉල්ලල්ලාහු වඅෂ්හදු අන්න මුහම්මදන් අබ්දුහු වරසූලුහු" යන දේව පාඨය සිකුරාදා ජුම්ආ සලාතය හමාරවීමත් සමග ඉස්ලාම් බැතිමතුන් ඉදිරි පිටදී මස්ජිද්හි ප්‍රධාන මෞලවී කියන විට මාගේ මුවින් කියා, ජීවන රටාව වෙනස් කිරීම ආරම්භ කළේ අවංකවම හෑද

සාක්ෂියට එකඟවය. එදා සිට මේ දක්වාම මා හට ලැබුනු සෑම විවේකයක්ම ප්‍රයෝජනයට ගැනු ලැබුවේ ඉස්ලාම් ධර්මය ගැන දැනුම වර්ධනය කරගැනීම සඳහාය.

අල්කෆ්ෆි ඉස්ලම් මධ්‍යස්ථානයෙන් සිංහල මාධ්‍යෙන් මුද්‍රණය කර ඇති පොත් රැගෙන ඇවිත් කියවා බලමින් අන්තර්ගතව ඇති කරුණු ගැන බුද්ධිමත්ව සිතා බලමින් දවස ගෙවන අතර තුරදී මා හට අවශ්‍ය වූයේ මෙවන් සටහනක් සකස් කිරීමටය. මෙම අවශ්‍යතාවයේ මූලික පරමාර්ථය වූයේ නිවැරදි දැක්මක් ඇති කරගෙන ජීවත් වීමට ආරම්භයක් සකස් කරගැනීමට උත්සාහ දරන අයගේ උත්සහය සඳහාය. මෙවන් පිරිසිදු චේතනාවක් ඇති කරගෙන මෙම සටහ තබන මා මීළඟට පැවසීමට අදහස් කරනුයේ ඉස්ලාම් ආගමට පිවිසි පසු ජීවිතයක් සාර්ථක කරගන්නා අයුරු ගැන මා දරන අදහස ඔබ සෑම වෙත ඉදිරිපත් කිරීම සඳහාය.

ඉස්ලාම් භක්තිකයා කථාවක් ආරම්භ කරන විටදීත් කිසියම් තැනැත්තේකු මුන ගැසුනු විටදීත් භුවමාරු කරගන්නා ප්‍රථම වචනය නම්, "අස්සලාමු අලෛකුම් වරහ්මතුල්ලාහ්" කියයි. ඇත්තටම මෙහි අදහස අල්ලාහ් දෙවිඳුගේ ශාන්තිය සාමය හා ආශර්වාදය ඔබ හට ලැබේවා! කියාය. මෙම ආමන්ත්‍රණය ඕනෑම සමාජයක පරිහරණය කළ හැකි උතුම් වචනයකි. සදාචාරත්මක වැදගත්කමක් ඇති කිරීම ආරම්භ වන ප්‍රථම වචනය මෙය යැයි කියා කීමද නිවැරදිය.



ඉන් අනතුරුව ඉස්ලාම් භක්තිකයා දිනකට පස් වතාවක් සලාත් නැමදුම තුළින් සර්ව බලධාරිවූ අල්ලාහ් දෙවිඳුගේ දේව නියමයන් අනුව මුහම්මද් නබි (සල්) තුමා අනුගමනය කළ ආගමානුකූලව සිදු කරන වතාවත් කරන විට දී නිරතුරුවම පුද්ගලයා තුළ සීලමය ගුණයත් භාවනාමය ගුණත් සම්පූර්ණ කරගන්නා අතරම සිත ගත සංවර වීම නිසා යහපත් ජීවන රටාවක නියැලී පහුසවෙන් දෛනික කටයුතු කරගැනීමට හැකියාව ඇති බව පවසනුයේ නව ජීවන රටාවෙන් මා ලබන අත්දැකීමෙනි.

මෙලෙස දෛනික කටයුතු කරගනිමින්, පුරා දින හයක් සලාත් නැමදුම සිදු කරමින් කටයුතු කරන ඉස්ලාම් බැති මතුන් සිකුරාදා එනම් ජුම්ආ දිනය පැමිණි විට ඉතා කැපවීමෙන් යුතුව සිත ගත පිරිසිදු කරගෙන ජුම්ආ සලාතයට සහභාගිවෙන්නේ ඇත්තටම අල්ලාහ් දෙවිඳුට සදා සිතින් නමස්කාර කරමිනි. මෙ දින ජුම්ආ සලතායෙහි ඇති විශේෂත්වය වනුයේ ඉස්ලාම් බැතිමතුන් හමුවේ මස්ජිද්හි ප්‍රධාන මෞලවි තුමා පවත්වන කුත්බා දේශණයයි. ඇත්තටම මෙම දේශණය තුළින් සැබෑ ලෙස ඉස්ලාම් භක්තිකයාගේ ජීවන රටාව පනගන්වා දෙමින් ප්‍රජාව අතර සහජීවනයෙන් කටයුතු කළ අයුරු පහදා දෙන්නේ, පරම දයාබර වූ සර්ව බලධාරි වූ අල්ලාහ් දෙවිඳුගේ දේවත්වය, තවද ජීවිත දර්ශණය තුළින් මුළු මිනිස් වර්ගයාටම ජීවන මාර්ගෝප දේශය ශුද්ධවූ අල්කුර්ආනය තුළින් ප්‍රකට කරාවූ මුහම්මද් (සල්) තුමන්ට කළ ගුණ සළකමින් එතුමන්ටද අල්ලාහ් දෙවිඳුගේ සාමයත් ආශිර්වාදයත් ලැබේවා කියාය. මේ ඇත්තමට මා දකිනුයේ මිනිසා

විසින් තවත් මිනිසෙකුට දක්වන ගරුත්වය සහ කළ ගුණ සැළකීමක් ලෙසය.

ඒ වගේම මෙම ජුම්ආ සලාතයට සහභාගි වන සියළු දෙනා අතර අන්යෝන්‍ය වශයෙන් දැන හැඳින ගැනීමක් ඇති වී සහජීවනය තුළින් කටයුතු කිරීමට මිනිස් සිත තුළ ප්‍රිය භාවයක් ඇති වේ. තවද එකි නෙකා අතර ඇති අඩු පාඩු සපුරා ගැනීමටද උදව් උපකාර කරගැනීමද සිදුකරමින් දානමය ගුණයද සම්පූර්ණ කරගනු ලබයි. මෙලෙස මේ ක්‍රියාවලිය අඛණ්ඩව හදවතට එකඟව දෛනිකව කරන අයගේ මෙලොව ජීවිතය සාර්ථක වන බව කිසිදු සැකයකින් තොර පිළිගත හැකි කරුණකි. මෙවන් අය සිටින සමාජයද යහපත් වන බව අමුතුවෙන් කිවයුතු නැතැයි සිතමි. මෙසේ කටයුතු කරන විට මා හට හැඟී ගිය කරුණ නම් මෙලෙසින් මුළු මිනිස් වර්ගයාටම තම දෛනික ක්‍රියාවලිය හැඩගස්වා ගැනීමට නොහැකිවූයේ ඇයි දැයි කියාය! මෙලෙස ජීවිතය සාර්ථකව පවත්වාගෙන යෑමට අල්ලාහ් දෙවිඳු ඉදිරිපත් කළ ඉස්ලාම් ධර්මය නොපිළිගැනීමට හේතුව ඇයි කියන එකයි?

මෙලෙසින් කටයුතු කරන ගමන් මා කළේ එකම එක දෙයයි. එය නම් ම සිතට එකඟව තීරණය කර ජීවිතයට අවශ්‍ය සැනසීම ලබාගැනීම උදෙසා මගේ වැඳුම් පිඳුම් ලැබීමට ඇති එකම සුදුස්සා අල්ලාහ් දෙවිඳු බවත් ජීවිතය සංවරව හැඩ ගස්වා යෑමට ධර්මානුකූලව සකස් කරනු ලැබූ ජීවන මාර්ගෝපදේශය මිනිස් වර්ගයා හමුවට ශුද්ධවූ අල්කුර්ආනය තුළින් හෙළිකළාවූ



මුහම්මද් (සල්) තුමන් අනුගමනය කළ වතාවත් ආරම්භ කිරීම කළේ වැඳුම් පිඳුම් කළ යුතු හා අනුගමනය කළ යුතු ධර්මය ඇත්තේ ඉස්ලාමය තුළ පමණක් යැයි අවබෝධ කරගෙනය. මෙය තේරුම් ගැනීමට හා වටහා ගැනීමට හැකියාව ඇති අයගේ ප්‍රශංසාව සමගින් අල්ලාහ් දෙවිඳුගේ ආශිර්වාදය ප්‍රාර්ථනා කළ අතර මෙම සත් ක්‍රියාව අපහාසයට පත් කරන අයගේ විවේචනයන්ද ඉවසීමට සිදුවූ බව පවසන්නේ අවංකවමය. මේ දක්වා ගෙන හැර දැක්වූ සියළු කරුණු කියවා බැලූ ඔබ සැමගෙන් විමසන කාරණය නම් මෙයයි. කෙනෙක් තමන්ගේ අභිමතය පරිදි දෙලොවෙහිම සැනසීම උදෙසා කටයුතු කිරීමට සත්‍ය දෙවි කෙනෙකු හෙළි කළ ධර්මය පිළිගෙන පිළිපැදීමේ ඇති වරද කුමක්ද කියාය!.

කරුණා බර වැඩිහිටියනි! සහෝදර සහෝදරියනි! ඉස්ලාම් ධර්මයේ මුලින්ම සඳහන් කරනු ලබන කරුණු කාරණා හය ගැන සහ අනිවාර්ය කළ පිළිපැදිය යුතු කාරණා පහ ගැන ඔබ සැම ඉහත දැක බලා දැනුවත් වී සිටින බව මා දනිමි. ඒ සියළු කරුණු හදවතින් පිළිගෙන ක්‍රියාව තුළින් පිළපදින කෙනෙක් ලෙස ඔබ සැම වෙත ප්‍රකාශ කර සිටින තවත් පුංචි කාරණයකි. අපි ජීවත් වන කාලය තුළදී යහපත් ජීවිතයක් ගොඩ නගා ගැනීමට යහපත් දැක්මක් තෝරා ගත යුතුය. එම තේරීම තුළ ධර්මයට අනුකූලව විනයානුකූලව සකස් කර ඇති චර්යා ධර්ම පද්ධතියක් ඇති ඒ වගේම සදාචාරාත්මක වැදගත් කමක් තුළින් දෛනික ජීවිතයේ සිට මෙලොව ජීවිත අවසානයෙන් පසු පරලොව ජීවිතයේද සැනසීමක් ඇති කර ගත හැකි ආගමික

දර්ශණයක් තෝරා ගත යුතුය. එම තේරීම තුළින් ස්වභාවික ජීවිතයේ දී කිසිදු අසීරුවකට පත්නොවී සියල්ල සරලව හිතා බලා තමන්ටම ප්‍රායෝගිකව සත්‍ය වටහාගත හැකි දැයි සොයා බැලිය යුතුය. මෙකී සියළු ගුණාංගයන්ගෙන් පරිපූර්ණවූ ආගම් දර්ශනය ඉස්ලාම් ආගමයි කියා මා පවසනුයේ හදවතට එකඟව සියල්ල කෙරෙහිම සිතා බැලීමෙන් අනතුරුවය. මේ කියවීමෙන් පසුව මා පැවසූ දේ පිළිබඳව ඔබ සැමගේ බුද්ධියෙන් විමසීම් කර ජීවිතය මෙලොව වශයෙන් සාර්ථකව පවත්වාගෙන යෑමටත් පරලොව ජීවිතයද සාර්ථක කරගැනීමට උත්සහායක නියැලෙයි කියා මා විශ්වාස කරමි.

ඉස්ලාම් දහම සඳහන් කර ඇති ශුද්ධවූ අල්කුර්ආනය ගැන මා දැනුවත් වූ ප්‍රමාණයෙන් දරන අදහස ඉතා සරලව ඉදිරිපත් කිරීමට අදහස් කරමි. සමස්ත ප්‍රජාවටම යහපත් ජීවිතයක් යථාර්ථවාදීව ගත කළ හැකි එමගින්ම මෙලොව ජීවිතයටද පරලොව ජීවිතයටද සැනසීම උදා කරගැනීමට හැකියාව ඇති ලෙසින් ආගමික වතාවත් තුළින්ම ජීවන මාර්ගෝපදේශ සකස් කර හෙළි කිරීම සඳහා අල්ලාහ් දෙවිඳු මෙලොවට එවනු ලැබූ අවසන් නබි වූ මුහම්මද් (සල්) තුමන් මීට වසර 1427 කට පෙර හෙළි කළ ධර්ම ග්‍රන්ථයයි. අරාබි කරයේ ප්‍රථම අයිතිහාසික ග්‍රන්ථය බවද සැළකේ. මෙවන් ග්‍රන්ථයක සැබෑ සාර්ථකත්වය මා දකිනුයේ දේව නියමය (වහි) අනුව මුහම්මද් නබි (සල්) තුමන්ගේ ජීවිතය තුළින්ම ක්‍රියාවට නගා ප්‍රජාවට තේරුම් ගැනීමට පහසුවන අයුරින් හෙළි දරව් කිරීමය. තවද මේ දක්වාම කිසිම සංශෝධනයකට ලක්නොවුනු



ග්‍රන්ථය නිසාය. මේ වන විට මා කියවූ පොත් ඇසුරෙන් දැනුවත් වූ අයුරින්ම කියනවා නම් ශුද්ධවූ අල්කුර්ආනයෙහි මූලික තේමාව වනුයේ සියළුම මිනිසුන් හට යථාර්ථය අවබෝධ කර දී සාර්ථකව ජීවිතයකට මුහුණ දීමට නිවැරදි මාර්ගය පෙන්වා දීමය.

තවත් විදිහකට මා අදහස් කරන අයුරින් ශුද්ධවූ අල්කුර්ආනය මූලික කරගෙන ඉස්ලාම් භක්තිකයින්ගේ (මුස්ලිම්) ජීවන රටාව අර්ථවත් කිරීමට සියළු සාධකයන් ගෙන හැර පෙන්වා දී ඉස්ලාම් ජීවිත වල සාර්ථකත්වය විදහා පා සෙසු අයටද මෙම ධර්මය පිළිගෙන කටයුතු කළ හැකී අයුරින් අල්කුර්ආනය සමාජ ගත කිරීමය. මාස එකහාමරක් වැනි සුළු කාලයකදී ම සිත වෙහෙස වා ලබා ගත් දැනුම මූලික කරගෙන පුරා වසර හතළිස් දෙකක් ගෙන ආ ජීවන රටාව වෙනස් කරගනිමින් ඉස්ලාම් දහම තුළ ඇති සාර්ථකත්වය තුළින් අවංකවම ජීවිතයට සැනසීම ලබාගැනීම සඳහා ඒක දේවවාදය අනුව එකම දෙවියන් අල්ලාහ් දෙවිඳුන් පමණි කියන සිතුවිල්ල තුළින් කටයුතු කරමින් සිටින අතර තුරදී මෙලෙස සකස්කරන මෙම සටහන නිමා කිරීමට පෙර යම් දිනක මෙය කියවනු ලබන ලොකු කුඩා සෑම කෙනෙක් වෙනුවෙන් හෘදයාංගම කරනු ලබන ආයාචනය නම් මෙලොව ජීවිතය සාර්ථක පවත්වාගෙන යෑමට ගතානුගතිකත්වයෙන් මදකට හෝ ඈත් වී යථාර්ථවාදීව තම බුද්ධියට එකඟව සිතා බලා කටයුතු කිරීම ආරම්භ කිරීම යහපත් බව මා අත්දැකීමෙන් පවසන කරුණකි.

එම නිසා ඔබ සැමගේ ජීවිත මෙලෝ වශයෙන් හා පරලෝ වශයෙන් සාර්ථක කරගැනීමට ඉස්ලාම් ධර්මය යනු කුමක්ද? කියා තේරුම් ගැනීමට අදාල පොත් පත් කියවා පොත් වල අඩංගු කරුණු කාරණා සියල්ල ප්‍රායෝගිකව ජීවිතය තුළ ක්‍රියා කාරීව පවත්වාගෙන යෑමට හැකියාව ඇති ද කියා බුද්ධිමත්ව සිතා බලන්න. ගනු ලබන තීරණය තුළින් ජීවිතයේ සාර්ථකත්වය තීරණය වන බව කිව යුතුය. ඉස්ලාම් දහම තුළින් ජීවිතයක් සාර්ථක කරගැනීමට ඇති හැකියාව සම්බන්ධයෙන් මේ දක්වා ගෙන හැර දැක්වූ කරුණු තුළින් ඔබ සැමගේ බුද්ධියෙන් විමසීම් කරනු ඇතැයි මා විශ්වාස කරමි.

දේවත්වයේ ඇති සාර්ථකත්වය අත් විඳීමට ස්වභාවිකවම සත්‍ය කරගැනීමට හැකි ධර්මය පිහිටා ඇති එකම ආගම් දර්ශනය ඉස්ලාම් යැයි. මෙය අවබෝධ කරගැනීමට ඔබ සැමට හැකියාව ඇති වේවා කියා ප්‍රාර්ථනා කරමි.

මෙම සටහන මා සකස් කරනු ලැබුයේ ස්වභාවික ස්වරූපයෙනි. මෙ තුළ නව කතා ප්‍රබන්ධයෙකුගේ හැකියාව හෙළි නොවුනත් පවසන ලද සියල්ල මාගේ සිතට එකඟව පිළි අරගත් කරුණු බව මා පවසමි. එසේ නම් අපි ජීවත් වන කාලය තුළදී යහපත් දැක්මක් තුළින් අල්ලාහ් දෙවිඳුගේ ආශිර්වාදය ලබාගෙන දෙලොව සාර්ථක කරගැනීමට මුහම්මද් නබි (සල්) තුමාගේ ජීවිතය තුළින් ලොවට ආදර්ශය සැපයූ දෛනික ජීවන සැලැස්මේ සිට මරණින් මතු සිදුකරන විනිශ්ච දිනය දක්වාමත් ඉතා සරලව හා නිවැරදිව



ඉදිරිපත් කර ඇති ශුද්ධවූ අල්කුර්ආනයෙහි සඳහන් කළ ඇති අයුරින් ජීවත් වීමට අදහස් කරගැනීමට බුද්ධිමත් වන්න කියා පවසන අතරම එලෙසම ජීවන රටාව ගෙන යෑමට ඉස්ලාම් දහම තුළට පිවිසීමට ආරාධනා කරමින් මාගේ සිතුවිලි මෙලෙස ගොනු කරමින් ඔබ හැම අමතා සකස් කර මෙම සටහන නිමා කරමි ඔබ සැමට විශ්වයාධිපති අල්ලාහ් දෙවිඳුගේ පිහිට ලැබේවා!

## සහෝදරයාගේ අඩිපාරේ යමින් මාද ඉස්ලාමය වැළඳ ගතිමි!

## අස්මා සිත්ති ෆර්සානා!

උපතින්ම කිතුණුවෙක් වූ මා නමින් ක්‍රිස්ටිනා මනතුංගය. සහෝදරයන් දෙදෙනෙකුත් සහෝදරියන් හතර දෙනෙකින් යුත් මගේ පවුලේ බාලයා වූයේ මාය. මාගේ දෙමාපියන් උපතින්ම බෞද්ධයන් වූ අතර පසුව ඔවුන් කිතු දහම වැළඳ ගත්තෝ වෙති. ඔවුන් කිතුණුවන් වූ පසු මා ඉපදුන නිසා පවුලේ උපතින්ම කිතුණුවෙක් වූයේ මා පමණි.

කුඩා කල පටන් දේවස්ථානයට යමින් දේව වචනය උගත් මා ආගමික අතින් විවිධත්වයක් ඉසුලූ අප රටේ නිවැරදි දහම කුමක්ද? යන්න සිතමින් කල්ගෙවීමි. මන්දයත් මා පවුලේ සියලූ දෙනා කිතුණුවන් වුවද ඔවුන් තුලින් මා ලත් ආදර්ශයක්

නොවීය. මා පවුල තුල නිතර දක්නට ලැබුවේ දෙමාපියන් අතර හා සහෝදර සහෝදරියන් අතර වූ ගැටුම්ය. මා පෙර පාසල් යන වියේදී මගේ පොඩි අයියා නිවසින් පිටවුණි. ඔහු මුළු මනින්ම පවුලේ අනිත් අයට වඩා වෙනස් අදහස් ඇති කෙනෙකි. ඉන් පසුව ඔහුව මුණගැසීමට හෝ ඔහුත් සමග කථා කිරීමට මට අවස්ථාවක් නොවීය.

ඉන් පසුත් පවුල තුල විශාල ලෙස ගැටුම් ඇති වීය. මේ අතර තුර කාලයේ මා පාසල් ගිය අතර පාසල තුලදී අනිකුත් සියලූ විෂයන් අරඹයා මා කිතුණු දහමට ලකුණු ලබා ගතිමි. මෙසේ කාලය ගතවිය. මේ වන විට මගේ පොඩි අයියා විවාහ වී සිටි අතර ඔහු කොළඹ පදිංචි වී සිටියේය.

මා දහසය වන වියට පා තබන විට දවසට තෙවරක් යාච්ඥා කරන මගේ පියාත් සැම විටම ක්‍රිස්තුස් වහන්සේගේ ගැන කියාදෙන මවත් අතර ගැටුම් උග්‍ර විය. මෙයින් මා සිත බෙහෙවින් කළකිරි තිබුණි. අවසානයේදී දෙදෙනා වෙන්විය. ඒ වන විට පවුලෙන් ඉවත්ව සිටි මගේ වැඩිමල් සහෝදරයා අපට උපකාර නොකර ඉවත බලා ගත්තේය. විවාහ වී සිටි සොහොයුරියගෙන්ද සරණක් නොවීය. මගේ වැඩිමල් සහෝදරයා බෞද්ධ කාන්තාවක් විවාහ කරගෙන සිටින අතර ඔවුන් කිතුණු දහම අදහති. විවාහ වී සිටි සොහොයුරියගේ සැමියා බෞද්ධ නිසා ඔවුන් අදහන්නේ බුදු දහමයි. මෙම සිදුවීම තුළ මගේ දේවස්ථානයේ ඇතැම් පුද්ගලයන් ක්‍රියා කල ආකාරය ගැනද මා සිත බෙහෙවින් කළකිරී තිබුනි. ඉන් පසුව



මාත් මගේ මවත් මගේ වැඩිමහල් සහෝදරියත් විසුවේ පොඩි අයියාගේ නිවසේය. මා දෙමාපියන් මගේ අයියාට නිවසේ සිටි කාලයේදී විවිධ කෙණහිලිකම් සිදු කළද ඔහු අපව නිවසට ගෙන විත් අපට කරුණාවෙන් සැලකීම ගැන මා හට පුදුම සිතුනි. එම නිවසේදී මාහට දැන ගැනීමට හැකිවූයේ මොහු ඉස්ලාම් දහම පිළිගෙන ඇති බවයි. මා ඔහුගේ ජීවිතය තුලින් අප පවුලේ අනිකුත් පුද්ගලයන්ගේ ජීවිත වලට වඩා විශාල වෙනසක් දුටුවේය. එබැවින් මා ඉස්ලාම් දහම ඉගෙන ගැනීමට උත්සුක වූයෙමි. මා පොතපතින්ද මාගේ අයියාගෙන්ද ඔහුගේ බිරිඳ ගෙන්ද ඉස්ලාමය ගැන ඉගෙන ගතිමි.

ඉන් අනතුරුව ඔහු අපට වෙනම නිවසක් තුල පදිංචි වීමට ඉඩ සලසා දුන්නේය. මෙයින් පසුව මා ඉස්ලාමය පිළිගැනීමට කැමති වූවද මගේ මවත් වැඩිමහල් සහෝදරියත් ඉස්ලාමයේ තිබෙන යහපත දැන දැන එය පිළිගැනීමට මැලිකමක් දැක්වීය. ප්‍රථමයෙන් ඔවුන් මාද අධෛර්‍යයට පත්කළ අතර පසුව මා ගත් තීරණයකට අනුව ලොව පාලනය කරන අල්ලාහ් හැර අන් දෙවියෙක් නොමැති බවත් එතුමා මේ විශ්වය මැවීමට පෙරත් සිටි අතර මේ විශ්වය විනාශ වූ පසුත් ඔහු සිටින බවත් එතුමාට මවක් පියෙක් හෝ දරුවන් නොමැති බවත් පිළිගෙන ඉස්ලාම් දහම වැළඳ ගතිමි.

මා මුස්ලිම් ආගම පිළිගත් පසු මේ ගැන මාහට හිතවත් කිතුණු යෙහෙළියකට පැවසුවෙමි. ඒවිට ඇය පැවසුවේ ඔබ උපතින්ම මුස්ලිම් නම් මා හට කම්

නැත. නමුත් ඔබ කිතුණු ආගමේ සිට ආගම ගැන ඉගෙන ගෙන මුස්ලිම් වීම මා අනුමත කරන්නේ නැත. එවිට මා ඇයට පැවසුවේ මා කිතුණු දහම මෙන්ම ඉස්ලාම් දහමද ඉගෙන ගත් බවත් ඒ අවස්ථාවේ දී නිවැරදි දෙය තේරුම් ගැනීමට හැකිවූ බවත්ය.

ඇත්තෙන්ම කිතුණු දහමේදී කිතු බැතියන් යේසුස් වහන්සේ(ඊසා නබි අලෛහිසලාම්)දෙවියන් වහන්සේගේ (අල්ලාහ්)පුත්‍රයා බවට විශ්වාස කරන අතර එතුමා දෙවි කෙනෙකු ලෙස අදහයි. නමුත් බයිබලයේ පැරණි ගිවිසුමේ මෝසෙස්ගේ (මූසා නබි අලෛහිසලාම්) ව්‍යවස්ථාවේ සඳහන් වන්නේ "මා හැර අන් දෙවිවරුන් තට ඇතිව නොසිටව යන්නයි" යේසුස් වහන්සේ(ඊසා නබි අලෛහිසලාම්) සැබෑ ලෙසම දෙවියන් වහන්සේගේ පුත්‍රයා නම් දෙවියන් වහන්සේට(අල්ලාහ්ට) හැකිව තිබුණා අප හැර අන් දෙවිවරුන් තට ඇතිව නොසිටව යන්න ව්‍යවස්ථාවට ඇතුලත් කිරීමට එමෙන්ම බයිබලයේ සඳහන් වෙනවා ආබ්‍රහම් (ඉබ්‍රහිම් නබි අලෛහිසලාම්)තුමාද යේසුස් වහන්සේද(ඊසා නබි අලෛහිසලාම්) චර්ම ඡේදනය කල බව නමුත් අද කිතුණු දහම තුල එවැනි දෙයක් සිදුනොවේ. බයිබලයේ යේසු තුමා (ඊසා නබි අලෛහිසලාම්) පවසා තිබෙනවා "මා පැමිණියේ ව්‍යවස්ථාව සම්පූර්ණ කිරීමට මිස ව්‍යවස්ථාව විනාශ කිරීමට නොවන බව" එසේ නම් අද කිතුණු සභාව තුල වනුයේ ව්‍යවස්ථාව කඩකිරීමක් බව මට වැටහුනි. ආරම්භයේදී ඉතා විනීතව අල්ලාහ්ට සතුට දනවන මාර්ගයේ ගමන් ගත් කිතුණුවන් අද ඔවුන් නොදැනම වැරදි මගකට යොමුවී ඇති බව මට හැඟුණි. යේසුස් වහන්සේගේ (ඊසා නබි



අලෛහිසලාම්) මව වන මරිය(මර්යම්) තුමියට කොටසක් ගරු කරති. තවත් කොටසක් වන්දනාද කරති. එහෙත් ඔවුන් හැඳ සිටින වස්ත්‍ර අනුව එතුමිය ජීවමානව වැඩසිටිනවා නම් පිහිට වීම කෙසේ වුවද එලවා ගනු නියතය. මෙසේ විකෘතිවූ දහමක් අදහන නූතන කිතුණුවන් ගැන මගේ හදවතෙහි නැගෙනුයේ ඉමහත් සංවේගයකි. මගේ අභිනව ආදර්ශකයාණන් වන මුහම්මද් නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් බලාපොරොත්තුව වූයේ මෙවැනි මුලාවීම කරණකොට ගෙන විනාශය කරා ගමන් කරන්නාවූ සියළුම දණන් හට නිවැරදි ජීවන මාර්ගය වන ඉස්ලාමය හඳුන්වා දීමයි. මෙලොව වසන්නාවූ සකල මුස්ලිම් වර්ගයා ගේම වගකීම සහ මෙහෙය විය යුත්තේද එයයි. නිවැරදි දහම සොයා මා පැමිණි ගමනෙන් අවසානයේදී නතරවූයේ විශ්ව දහම වන ඉස්ලාමය වැළඳ ගැනීමෙනි. ඒ සඳහා මට යහමග පෙන්වූ සර්වබලධාරී අල්ලාහ්ට දිවිහිමියෙන් නැමදුම් පුදමි. එසේම මට ඉස්ලාමය හඳුන්වා දුන් මගේ සහෝදරයා සහ නැණාගේ අඩිපාරේ යමින් විනාශය කරා ගමන් කරන්නාවූ සියළුම දණන් හට නිවැරදි දහම වන ඉස්ලාමය හඳුන්වා දීමට දිවි හිමියෙන් කැපවෙමි.

## කාන්තා නිදහස වෙනුවෙන් හඬ නැගූ ඇය ඉස්ලාම් දහම ප්‍රචාරය කරන උතුම් කාන්තාවක් වූයේ කෙසේද?

කිතු දහම ප්‍රචාරය කරන, කාන්තා නිදහස වෙනුවෙන් පෙනී සිටි, ගුවන් විදුලි ප්‍රවෘත්ති නිවේදිකාවක් වූ ඇය දැන් ඉස්ලාම් දහම ප්‍රචාරය කරන සුවිශේෂී කාන්තාවකි. ඇය ඇමෙරිකාවෙහි "ඔහියෝ" නගරයෙහි පිහිටා ඇති මුස්ලිම් කාන්තාවන් සඳහා ඇති ජාතික සංවිධානයෙහි අධ්‍යක්ෂිකාව "ආමිනා අස්ලම්"ය. "හිජාබ් පිටු පස සිට මුස්ලිම් කාන්තාවක් කථා කරයි" යන මැයෙන් ඇමෙරිකාවෙහි ඇති "ඩෙන්නෙස්සි විශ්ව විද්‍යාලයෙහි" ඇය කළ කථාවෙහි ඉතා වැදගත් කොටස් කිහිපයක් මෙහි සඳහන් වේ.

අවුරුදු කිහිපයකට පෙර සරසවියක අළුත් විෂයක් සඳහා බැඳීමට ගොස් සිටියෙමි. පංති කාමරයේදී, සමහර අරාබි තරුණියන් තම පාරම්පරික හිජාබ් ඇඳුමෙන් සැරසී සිටීම දුටු විට මා තුළ පිළිකුලක් ඇති විය. මෙම පිළිකුල් සහගත ජාතියක් සමග මා පංති කාමරය අසුන්ගන්නේ නැත යනු තීරණය කර, වහාම පංති කාමරයෙන් පිටත්වී නිවසට පැමිණියෙමි.

නමුත්, මාගේ ස්වාමි පුරුෂයා ඔබ අනිවාර්යෙන් පංතිවලට සහභාගි විය යුතුයි යනු තරයේ ඉල්ලා සිටි නිසා, මා තුළ යම් තීරණයකට එළඹ යළි පංතිවලට සහභාගිවුනෙමි. මාගේ පංතියෙහි සිටින එම අඥාන මුස්ලිම් තරුණියන්ගේ ආගම් වෙනස් කිරීමයි මා ගත් තීරණයවූයේ. මා සමග එකම පංතියෙහි වූ එම මුස්ලිම් තරුණියන්ව කිතු දහමට හැර විය යුතුයි යන අරමුණෙන් අල්කුර්ආනය කියවන්න පටන් ගත්තෙමි. මුහම්මද් එක් බොරුකාරයෙක්, ඉස්ලාම් පිළිගනු ලැබූ දහමක් නොවෙයි යනු ඔප්පු කිරීම මා තුළ වූ එකම අධිෂ්ඨානය විය.

නමුත් අල්කුර්ආනය කියවන්න කියවන්න ඉස්ලාම් පිළිබඳ දැනගත යුතුයි යන ආශාව මා තුළ වර්ධනය විය. විශේෂයෙන් පිරිමින් හා කාන්තාවන් පිළිබඳ ඉස්ලාම් පවසන්නේ කුමක්ද? යනු දැනගැනීමට මා තුළ ප්‍රිය භාවයක් පැවතුනි.

මුස්ලිම් කාන්තාවන් තම ස්වාමි පුරුෂයන් විසින් වද හිංසාවන්ට ලක්වෙමින් සිටි යනුවෙන් මා සිතූ වාර ගණන අනන්තය. සාමාන්‍යයෙන් මුස්ලිම් කාන්තාවන් පිළිබඳ මෙසේ පවසනු ලැබීම මා විශ්වාස කළෙමි. නමුත්, මේ සියල්ල ශුද්ධවූ අල්කුර්ආනයට මුළුමනින්ම විරුද්ධවූ ක්‍රියාවන් යනු එය කියවීමෙන් පසු අවබෝධ කරගත්තෙමි.

ඉතා පුළුල්ව ඉස්ලාම් පිළිබඳ අධ්‍යයනය කිරීමෙන් පසු පිරිමින්ට හා කාන්තාවන්ට ඔවුන්ගේ ස්වාභාවිකත්වයට ආවේනිකව සමාන අයිතීන් ලබා දී ඇති බව මා වටහාගත්තෙමි. පිරිමින්ට මෙන් කාන්තාවන්ටද අධ්‍යාපනය ලබාගැනීමේ අයිතිය ඉස්ලාම් ලබා දී ඇති බවද මා දැනගත්තෙමි. අවුරුදු 1400 ට පෙරම කාන්තාවන් දේපළවලට උරුමකම් කීමේ අයිතිය ඉස්ලාම් විසින් ලබා දී ඇති බව දැනගත් විට මා මවිතයට පත්වුනෙමි. යම් මුස්ලිම් කාන්තාවක්

විවාහවීමත් සමග ස්වාමි පුරුෂයාට අයිති භුදු භාණ්ඩකයක් නොවෙයි. මේ නිසයි විවාහයට පසුවත් කාන්තාවකට තම ස්වාමි පුරුෂයාගේ නමත් සමග තම නම කීමට අනුමැතිය නැත්තේ. තම විවාහයෙන් පසුවත් තම අනන්‍යතාවය රැකගැනීමට මුස්ලිම් කාන්තාව අයිතිය ලබා ඇත්තේ.

තම පංතියෙහි වූ මුස්ලිම් ශිෂ්‍යාවන්ව කිතු දහමට හැරවීමේ එකම වෛරයෙන් පුරා අවුරුදු දෙකක් ඉස්ලාම් දහම අධ්‍යයනය කළෙමි. නමුත් මෙම කාලය තුළ මා බොහෝ වෙනස් කම් වලට ලක්වුනෙමි. මාගේ ක්‍රියා කලාපයන්හි ඇතිවන වෙනස පිළිබඳ මාගේ ස්වාමි පුරුෂයාද අවදානය යොමු කිරීමට අමතක නොකළේය. මත් පැන් පානය කිරීම සඳහා සුරා සැල්, රාත්‍රී සමාජ ශාලාවල් කරා යෑම මා නතර කළෙමි. ඒ වෙනුවට නිවසෙහි සිට අල්කුර්ආනය කියවීමෙන් මා යම් ආත්ම තෘප්තියක් ලබාගත්තෙමි. මාගේ ක්‍රියා කලාපයන් පිළිබඳ මාගේ ස්වාමි පුරුෂයා තුළ සැක සංකා පහළ වීම නිසා මා දික්කසාද කළේය. මාගේ දරුවන් තිදෙනා සමග මා තනිව ජීවත්වෙන්නට පටන් ගත්තෙමි. එක් මුස්ලිම් විද්වතෙකු වෙත ගොස් මාගේ සැකයන් අසා දුරු කර ගත්තෙමි. පසුව 1977 වර්ෂයෙහි ඉස්ලාම් දහම වැළඳ ගත්තෙමි.

නමුත් සමහර නීති රීතීන් පිළිබඳ මා තුළ දෙගිඩියාවක් පැවතුනි. හිජාබ් නම් ගෞරවනීය ඇඳුම අඳින ලෙස ඉස්ලාම් මුස්ලිම් කාන්තාවන්ට නියෝග කරයි. කාන්තාවන් තම හිස ආවරණය කිරීමෙන් ඔවුන් සියල්ලන් ඉදිරියේ කැපී පෙනීමයි හිජාබ්හි සුවිශේෂත්වය වන්නේ.



කාන්තාව තම කය ආවර්ණය කළ යුතුයි යනු මා පිළිගත්තෙමි. නමුත් මාගේ හිසත් ආවර්ණය කළ යුතුද? යන දෙගිඩියාවක් මා තුළ තිබිනි. නමුත්, ශුද්ධවූ අල්කුර්ආනය මගින්, අප මුස්ලිම්වරුන් වශයෙන් සංකේතවත් කරගැනීම සඳහා කය ආවර්ණය කරන ලෙස නියෝග කෙරෙයි. මා මුස්ලිමෙක්මි - අපේ හිමියන් අපට ලබා දී ඇති අයිතීන් අපි හොඳින් දනිමු. හිජාබ් යනු බාධාවක් නොවෙයි, එය අයිතියක්, වරප්‍රසාදයක් යනු මා අවබෝධ කරගත්තෙමි. එය පැළඳ ගැනීම සඳහා කොයි වගේ කැප කිරීමක් වූවත් කිරීමට, මාගේ දිවිය පුදන්නටත් මා සූදානම් විය යුතුයි යන හැඟීම මා තුළ ඇතිවීමත් සමගම මා එය පළඳින්නට පටන් ගත්තෙමි.

කාන්තා නිදහස වෙනුවෙන් හඬ නැගීමද මා අත්හැරියෙමි. එය මට අධ්‍යාත්මකව සැනසීමක් නොදුන්නේය. මුස්ලිම් කාන්තාවක් වශයෙන් ඉස්ලාම් මට සියළු අයිතීන් ලබා දී ඇති බව මා හොඳින් අවබෝධ කර ගත්තෙමි.

ඉස්ලාම් කාන්තාවන්ට වෘත්තීන්, රැකියාවන් හි නියැළීමට තහනම් කර නැත. නමුත් ඉතා උතුම් වෘත්තිය කාන්තාවක් මවක් වශයෙන් සිටීමයි. එම උතුම් මෙහෙවර තුළිනුයි මතු පරම්පරාවෙහි නැවුම් චින්තනයන් බිහි කළ හැක්කේ.

ඉස්ලාම් දහම වැළඳ ගැනීමෙන් පසු හිජාබ් ඇඳ මා රැකියාවට යෑම නිසා ගුවන් විදුලි ප්‍රවෘත්ති නිවේදිකා පදවිය මාගෙන් උදුරා ගන්නා ලදි. තවද දික්කසාදයත් සමග අධිකරණ තීන්දුවක් මත මාගෙන් උදුරා ගන්නා ලද මාගේ දරුවන් තිදෙනා යළි මාත් සමග එක්වී ඉස්ලාම් දහම වැළඳ ගත්තෝය. මාගේ දෙමාපියන් හා පෙර ස්වාමි පුරුෂයාද ඉස්ලාම් දහම වැළඳ ගත්හ. මාගේ පවුලේ ඥාතීන්ද මෙම සත්‍ය කරා නැඹුරුවෙමින් සිටිති.

මා අභියෝගයන්, බාධක මැද්දේ එඩිතරව ගමන් කළෙමි. මා කුමන ස්ථානයක, මොහොතක වුවත් සත්‍ය එඩිතරව පවසමි. මාගේ වචනයන්, ක්‍රියා කලාපයන් සියල්ලට අල්ලාහ් ඉදිරියෙහි මා පිළිතුරු දිය යුතුයි යන බිය පමණයි මා තුළ රජකරන්නේ.

ඉස්ලාම් දහම සෙසු අය සමග බෙදා ගැනීමයි මා විඳින ලොකුම වින්දනය.

ආමිනා අස්ලම්ගේ මෙම කථාව Knoxville – News – Sentinal, Tennessee යන පුවත් පතෙහි පළවූවකි.



## කවිතා "නූර් ෆාතිමා" ලෙස!

මෙය එක් යුවතියකගේ ඉස්ලාම් දහම වැළඳගත් අපූරු අත්දැකීමකි. ඇය හින්දු සභා ආයතනයට අයත් හින්දු දහමේ මූල ධර්මයන් විශ්වාසයන් ලෙස ගෙන සිටින සිව සේනා යන සංවිධානයට අයත් කෙනෙකි.

මෙහි අපි සඳහන් කරන කරුණු ඇයත් සමග කළ පිළිසඳරක දී ඇය ඉදිරිපත් කළ අදහස්ය. කවිතා ඉස්ලාම් දහම පිළිගැනීමෙන් පසු තම නම "නූර් ෆාතිමා" වශයෙන් වෙනස් කරගත්තේය.

ප්‍ර: ඔබ ඉස්ලාම් දහම වැළඳ ගැනීමට පෙර ඔබේ නම කුමක්ද?
පි: මාගේ පට බැඳි නාමය පූනම්, මාගේ නම කවිතා ය.

ප්‍ර: දැන් ඔබේ ඉස්ලාමීය නම කුමක්ද?
පි: මා ඉස්ලාම් දහම වැළඳ ගැනීමෙන් පසු මාගේ නම නූර් ෆාතිමා වේ.

ප්‍ර: ඔබේ වයස හා උපන් ස්ථානය පිළිබඳ පැවසුවා නම්.
පි: මා උපන්නේ බම්බායි නගරයේ ය. මා දැන් 30 වැනි වියෙහි පසුවෙමි. නමුත් මාගේ ඉස්ලාමීය දැනුම අවුරුදු පහක දරුවෙකුගේ මෙන් පැවතීම නිසා මාගේ වයස අවුරුදු පහක් යනුවෙන් කියන්නට මට සිතේ.

ප්‍ර: ඔබේ අධ්‍යාපනය පිළිබඳ පවසනවා නම්.

පි: බම්බායි නගරයේ පාසැල් අධ්‍යාපනය නිම කරමින්, උසස් අධ්‍යාපනය සඳහා කේම්බ්‍රිඩ්ජ් විශ්ව විද්‍යාලයට ගියෙමි. එහි උසස් අධ්‍යාපනය හා වෙනත් කොම්පියුටර් පාඨ මාලාවන් හැදෑරුවෙමි. මාගේ ලෞකික අවශ්‍යතාවන් සඳහා

මා විවිධ සම්මානයන් ලබා ඇත්තෙමි. නමුත් මාගේ මතු දිවිය සඳහා කිසිවක් මා නොකළ බවට දුක් මුසු හැඟීමක් මා තුළ රැව් පිළිරැව් දෙමින් තිබේ.

ප්‍ර: ඔබේ විවාහය හා දරුවන් පිළිබඳ පවසනවා නම්.

පි: මා විවාහ කරගත්තේ බම්බාහි ය. පසුව මා මාගේ ස්වාමි පුරුෂයා සමග බහ්රෙයින් රටට පැමිණියෙමි. මට පිරිමි දරුවෙන් දෙදෙනෙකු සිටී.

ප්‍ර: ඔබ ඉස්ලාම් දහම පිළිගැනීමට ඉවහල් වූ කරුණු මොනවාද?

පි: ඇත්ත වශයෙන්ම මෙය ඉතා අගනා ප්‍රශ්නයකි. මා ප්‍රථමයෙන් අල්ලාහ්ගේ දයාවට කෘතඥ වෙමි. නබි (සල්) තුමන් ඉස්ලාම් දහම ප්‍රචාරය කිරීම සඳහා ජනයා වෙත එවා අල්ලාහ් දයාව දැක්වූවා සේ මා වෙත ද අල්ලාහ් දයාව දැක්වූයේය. මුස්ලිම් වරුන් දැකීම පවා පිළිකුල් කළ පරිසරයකයි මා හැදුනේ වැඩුනේ. මාගේ යුග දිවියෙන් පසුවයි මා ඉස්ලාම් දහම වැළඳගත්තේ. නමුත් මාගේ තරුණ වියෙහිදීම මා ප්‍රතිමා වන්දනය පිළිකුල් කළෙමි. වරක් නාන කාමරයෙහි තිබූ ප්‍රතිමාවන් ඉවත් කිරීම තාමත් මාගේ මතකයේ ඇත. එම අවස්ථාවෙහි මාගේ මව මට අවවාද කළත් "තමන්ටම කිසිදු පිහිටක් කරගැනීමට හැකියාවක් නොමැති මෙම ප්‍රතිමාවන්ට ඔබ යාඥා කරමින් ලැබෙන සුගතිය කුමක්ද?" යනු මාගේ මවගෙන් ප්‍රශ්නකළෙමි.

යුවතියක් යුග දිවියට පා තබන විට තම ස්වාමි පුරුෂයාගේ දෙපා සෝදා එම ජලය පානය කළ යුතුයි යනු හින්දු ආගමික සිරිතක් වූවත් මා එය තරයේ ප්‍රතික්ෂේප කළෙමි. මේ අවස්ථාවෙහි දී මා විවිධ තරවටු කිරීම්වලට ලක්වුනෙමි.



මා පාසලක ගුරු වෘත්තිය සඳහා බැඳුනෙමි. මා පාසලට යන එන විටත්, වෙනත් ගමන් බිමන් යන විටත් මම ම කාරය පැදවීමට පුරුදුව සිටියෙමි. මෙවන් පසුබිමක අසලින් වූ ඉස්ලාමීය මධ්‍යස්ථානයකට යෑම පුරුද්ද මට ඇතිවිය. මුස්ලිම්වරුන්ගේ කථාව තුළින් ඔවුන් ප්‍රතිමාවන්ට යාඥා නොකරන බව දැනගත්තෙමි. ඔවුන් වෙනත් දෙවිකෙනෙකුගෙන් සියළු භාග්‍යයන් අපේක්ෂා කරති. මොවුන්ගේ මෙම සංකල්පය කෙරෙහි මා තුළ යම් බැඳීමක් ඇතිවිය. මුස්ලිම් වරුන් මුළුමනින් අල්ලාහ්ට අවනත වී ක්‍රියා කරන බව මට අවබෝධ වෙන්නට විය.

ප්‍ර: ඉස්ලාම් ඔබව ආකර්ෂණය කළේ කෙසේද?

පි: මුස්ලිම් වරුන්ගේ සලාතය මා බෙහෙවින් ආකර්ෂණය කළ එකක් විය. මුලින් මට මෙයයි සලාතය යන දැනුමක් නොතිබිනි. මෙය හුදු ශාරීරික ව්‍යායාමයක් යනුවෙනුයි මා සිතාගෙන සිටියේ. ඉස්ලාමීය මධ්‍යස්ථානයකට යෑමෙන් පසුවයි මෙය මුස්ලිම්වරුන්ගේ සලාතය බව මා දැනගත්තේ. මා නින්දට යන හැමවිටම මට හීනයක් දැනුනි. හතරැස් කෝනයකින් යුත් යමක් මට එහි දිස්විය. සමහර අවස්ථාවල බියට පත්වී නින්දෙන් අවදිවූ අවස්ථා ද විය. මෙය දිගින් දිගටම මට පෙනෙන්නට විය. එම හතරැස් කෝනයෙන් යුත් දේ කඃබාවයි යන දැනුම මට එම අවස්ථාවෙහිදී නොතිබුනි. පසුවයි මා එය දැනගත්තේ.

ප්‍ර: ඔබ ඉස්ලාම් දහම වැළඳගත් බව ඔබේ පවුලේ උදවිය දැනගත්තේ කෙසේ ද?

පි: මාගේ විවාහයෙන් පසු මා බහ්රෙයින් රට ට ගියෙමි. බහ්රෙයින් මුස්ලිම් රටක් වීම නිසා ඉස්ලාම් පිළිබඳ දැන ගැනීමේ පසුබිමක් එහි මට විය. අපේ නිවස අවට බොහෝ මුස්ලිම්වරුන් වෙසුනහ. මාගේ හොඳ මිතුරියක් බවට

මුස්ලිම් යුවතියක් විය. ඇය ව හමුවීමට හැමවිටම යෑමේ පුරුද්දක් මට තිබුනි. නමුත් ඇය මා හමුවීමට එන්නේ කලාතුරකිනි. රමළාන් මස තුළ ඇයගේ නිවසට මට නොපැමිණෙන ලෙස මාගේන් ඉල්ලා සිටියාය. හේතුව, එම මාසයෙහි අධික යාඥාවන්හි නිරතවීමට තිබීම නිසා ඔබේ පැමිණීමෙන් එයට යම් බාධාවක් ඇතිවෙයි දෝ යනු මා බියවෙමි යනුවෙන් ඇය කීවාය. ඉස්ලාම් දහම දැනගැනීමටත්, මුස්ලිම්වරුන් කරන යාඥා ක්‍රම පිළිබඳ දැනගැනීමටත් මා තුළ පැවතුනේ පුදුම කැමැත්තකි. මාගේ මිතුරියගෙන් මා බැගෑපත්ව ඉල්ලා සිටියේ මා ඔබේ නිවසට පැමිණීම නොවළක්වන්න, මා ඔබ කරන යාඥාවන් බලා සිටිනවා මිස එයට කිසිදු බාධාවක් නොකරමි යනුවෙනි. ඉන් පසු ඇය කිසිවක් නොකීවාය. මා ඇය කරන සලාතයන් දෙස හොඳින් අවධානය යොමු කර මාද එසේ කිරීමට උත්සහ කළෙමි. පසුව මා ඇයගෙන් ඇය කළ මෙම යාඥාවන් පිළිබඳ ප්‍රශ්නකළෙමි. මෙයයි සලාතය මෙහි පාරායනය කරනු ලබන්නේ ශුද්ධවූ අල්කුර්ආනයයි. මෙසේ කිරීමට මා තුළත් ආශාවක් ඇතිවිය. එම යාඥාවන් කළ යුතු නියම ක්‍රමය පිළිබඳ මට දැනුමක් නොවූවත්, මාගේ නිවසේ එක් කාමරයක් වසාගෙන මිතුරිය කළා සේ කිරීමට පුරුදුවුනෙමි.

වරක් කාමරයේ දොර වැසීමට අමතක වී සලාතය කරමින් සිටියෙමි. අනපේක්ෂිත අන්දමට එම කාමරයට පිවිසුනු මාගේ ස්වාමි පුරුෂයා, නුඹ කරමින් සිටියේ කුමක්දැයි මාගේන් ප්‍රශ්නකළේය. එයට මා සලාතය කළ බව පිළිතුරු දුන්නෙමි. නුඹ හොඳ සිහියකින් ද ක්‍රියා කරන්නේ? නුඹට දන්නවාද නුඹ කියන්නේ කුමක්ද කියා? එම අවස්ථාවෙහි ඇති වූ බිය නිසා අත පය වෙව්ලන්නට පටන් ගත්තේය, නමුත් සැනින් මා තුළ ඇතිවූ ධෛර්යය නිසා මෙම අභියෝගයට මුහුණ දීමේ තත්ත්වයට මා පත්වුනෙමි. මා ඉස්ලාම් දහම පිළිගත් බවත්, එබැවිනුයි මා සලාතය කරමින් සිටි බවත් ශබ්ද නගා පැවසුවෙමි. එයට මාගේ ස්වාමි පුරුෂයා නුඹ මොනවද



දොඩවන්නේ? නුඹ පැවසූ දේ ධෛර්යය තිබේ නම් යළි පවසපන් යනු කියා මා වෙත කඩා පැන්නේය. යළි මා තුළ ධෛර්යය ඇති කරගෙන එයම පැවසුවෙමි. එවිට මාගේ ස්වාමි පුරුෂයා මට දරුණු ලෙස පහර දෙන්නට විය. මෙම ශබ්දය ඇසූ මාගේ සහෝදරිය ද එහි පැමිණ මාගේ ස්වාමි පුරුෂයා වැළැක්වූයේය. මාගේ ස්වාමි පුරුෂයා සිදුවූ දේ පැවසූ විට ඇය ද මට පහර දෙන්නට විය. මා ඇයට ඔබ මාගේ විෂයෙහි ඇඟිලි ගැසීමට අවශ්‍ය නැති බවත් මට හොඳ හා නරක කුමක්ද? යනු හොඳින් දන්නා බව කී විට, මාගේ ස්වාමි පුරුෂයා කුපිත වී මා සිහිසුන් වන තරමට පහර දුන්නේය.

ප්‍ර: ඔබ මෙවැනි පීඩනයකට පත්වූ විට ඔබේ දරුවන් කොහේ සිටියේ ද? එවිට ඔවුන් කීවෙනි වියෙහි පසුවූයේද? ඔබ එම තාඩන පීඩනයන්ගෙන් කෙසේ ද බේරුනේ?

පි: මෙම කටුක අවස්ථාවෙහි මාගේ දරුවන් සිටියේ නිවසෙහි තමයි. එවිට මාගේ ලොකු පුතාගේ වයස නමයයි. පොඩි පුතාගේ වයස අටයි. මෙම සිද්ධියෙන් පසු කිසිවෙකු හමුවීමට හෝ කිසිවෙකු සමග කථා කිරීමට හෝ මට අනුමැතියක් නොලැබුනි. මා කුටියක දමා වසා දැමුවෝය. මෙම අවස්ථාව වන විටත් මා නිසි ලෙස ඉස්ලාම් දහම වැළඳගෙන සිටියේ නැත. නමුත් මා ඉස්ලාම් දහම පිළිගත්තෙමි යන වචනයන් පවසා සිටියෙමි.

ඝන අඳුරු රාත්‍රියක මා කුටියක වසා දැමූ අවස්ථාවක, මාගේ ලොකු පුතා මා වෙත පැමිණ මාගේ දෙඅත් වල කඳුළු සැලෙන තරම් ඇඬුවේය. මා පවුලේ සෙසු අය කොහේදැයි ප්‍රශ්න කළ විට, ඔවුන් ආගමික යාඥාවන් කිරීම සඳහා නිවසින් පිටත්ව ගිය බව ඔහු පැවසුවේය. (එය හින්දු උත්සව දිනයක් විය). මාගේ පවුලේ උදවිය මා ඝාතනය කිරීමට තීරණය කර ඇති නිසා මට නිවසින් ඉක්මනින්

පිටත්ව යන ලෙස ඔහු බැගෑපත්ව ඉල්ලා සිටියේය. එයට මා එසේ කිසිවක් සිදුනොවෙයි, මින් ඉදිරියට ඔවුන් මට කිසිදු හිංසාවක් නොකරයි, ඔබ හොඳින් ඉන්නට ඕන, ඔබේ මල්ලිවද හොඳින් බලාගන්නට ඕන යනුවෙන් පවසා මාගේ සෙනෙහවන්ත පුතාව සැනසුවෙමි. නමුත් මාගේ එම දරු සෙනෙහස මාව නිවසින් ඉක්මනින් පිටත්වන්න යනුවෙන් දිගටම ඉල්ලා සිටියේය. එසේ නොව ඔබව සැබවින්ම ඔවුන් ඝාතනය කරයි. ඉන් පසු සදහටම ඔබව දැකීමේ භාග්‍යය අපට නැතිවී යයි ඒ නිසා ඔබ යන්න යනුවෙන් දුක්මුසුව කියා සිටියේය. "මාගේ දයාබර අම්මේ! ඔබව ඝාතනය කරයි ඔබ යන්න" මෙසේ ඔහු යළි යළි පැවසීම නිසා මා නිවසින් පිටත්වීමට තීරණය කළෙමි. එම අවස්ථාවෙහි මාගේ ලොකු පුතා පොඩි පුතා අමතා කියූ දේ මා දැන් සිතන විටත් ඉමහත් කම්පනයක් මා තුළ ඇතිවෙයි. මල්ලියේ! අවදිවන්න අපේ ආදරනිය මව දැන් අපෙන් වෙන්වී යන්නටයි යන්නේ. මින් පසු අපේ ආදරනීය මව දැකීමට හැකිවෙයිදෝ කියා කිව නොහැක.

මා කුටියක සිරකර තැබීම නිසා, මාගේ පොඩි පුතාව බොහෝ දිනකට පසුවයි මට බැලීමේ භාග්‍යය උදාවුනේ. මා දුටු සැනින් හඬා වැළපුනු ඔහු, මා ඔහුගෙන් ඈත් වූ විට ඔහුගේ හැඬීම තවත් උත්සන්න විය. මාගේ දෙපා මා ඉදිරියට තැබූ විට අම්මා! ඔබ අපෙන් වෙන්වී යන්නටද යන්නේ? යනුවෙන් කඳුළු සලමින් ඔහු ඇසුවේය. ඇත්ත වශයෙන්ම මවෙකුට තම ජීවිතයේ මුහුණ දීමට සිදුවූ මීටත් වඩා කටුක, දුක් බර අවස්ථාවක් තිබිය නොහැක. මේ අවස්ථාවේ දී මට කෙතරම් ලොකු කම්පනයක් ඇතිවන්නට ඇත් ද? යනු විශේෂයෙන් කියන්නට අවශ්‍ය නැතැයි සිතමි. මා අනිවාර්යයෙන්ම ඔබලා යළි හමුවෙමි යනුවෙන් උතුරා යන මව් සෙනෙහසින් පැවසූ විට මට නොදැනුවත්ම මාගේ දෙනෙත් වලින් කඳුළු සැලුනි. එම අඳුරු රාත්‍රියේ මා දස මසක් කුස හොවා, මාගේ ලේ කිරි කර පෙවූ මාගේ



සෙනෙහවන්ත දරුවන්ගෙන් සමුගත්තෙමි. මාගේ එම දරුවන්ද නිවසේ ප්‍රධාන දොර කොඩ තෙක් පැමිණ අත වනා මට සමුදුන් විට ඔවුන්ගේ දෙනෙත් වල කඳුළු පිරී තිබුනි. මා ඔවුන්ගේ දෙනෙත්වලින් ඈත්වන තෙක් ඔවුන් ඇස් නොපියා බලාගෙන සිටියේය. එම අවස්ථාවේ දී මව් සෙනෙහස, දරුවන් කෙරෙහි ඇති අසීමිත ආදරයට වඩා ඉස්ලාම් දහම කෙරෙහි වූ ඇල්ම බලවත්ව පැවතුනා යැයි කීවා නම් මා නිවැරදි. මාගේ දරුවන්ට සෙනෙහස දැක්වීමට අපොහොසත්වූ මවෙකු වශයෙන් මා, මා තුළ හැඩුවෙමි. මෙය දරාගෙන මට පැය තබා ගමන් කිරීමට වීරියක් නොතිබුනි. නමුත් ඉදිරියට පය තැබුවෙමි. මෙම ශෝචනීය අවස්ථාව මට අමතක කිරීම ඉතා අසීරුය. මෙම කටුක අත්දැකීම මතකයට නැගෙන හැම මොහොතකම, එවකට මුස්ලිම් වරුන් තම ඥාතීන්, නිවස් සියල්ල අත්හැර ඉස්ලාම් වෙනුවෙන් මක්කාවෙහි සිට මදීනාවට ගිය හිජ්රත් (සංක්‍රමණය) මා සිහිපත් කරමි.

ප්‍ර: ඔබ කුමන ස්ථානයකට ගොස් ද ඉස්ලාම් දහම වැළඳගත්තේ?

පි: මා නිවසෙහි සිට ගමන් කළේ පොලිස් ස්ථානය වෙතයි. එහි මා කථා කරන භාෂාව කිසිවෙකුට නොතේරුනේය. නමුත් එහි වූ කෙනෙකුට ඉංග්‍රීසි පුළුවන් විය. මාගේ තත්ත්වය ඉතා අයහපත් වූ නිසා සිහිසුන්වූ කෙනෙකු වශයෙනුයි මා සිටියේ. මද වේලාවක් විවේකීව සිටීමට අවසර ඉල්ලා පසුව මා ඔවුන්ට ඉස්ලාම් දහම පිළිගැනීමේ අරමුණින් මා නිවසින් පිටත්වූ බව දන්වා සිටියෙමි. සිදුවූ සියල්ල එහි විස්තර කිරීමට මට අසීරු විය. ඒ අතුරින් කෙනෙකු මා ද මුස්ලිමෙකි. ඔබට හැකි හැම උදව්වක්ම මා නොපැකිලව කරමි. පසුව එම නිලධාරියා ඔහුගේ නිවසට මා කැඳවාගෙන ගොස් පවුලේ අයට මා හඳුන්වා දී එහි නවාතැන් ගැනීමට සියළු පහසුකම් කර දීමට තරම් ඔහු

කාරුණික විය. පසු දින පොලිසියට පැමිණි මාගේ ස්වාමි පුරුෂයා බිරිඳ පැහැරගෙන ගොස් ඇති බව පැමිණිල්ලක් කළ විට, ඔබේ බිරිඳව පැහැර ගැනීමක් සිදු නොවූ බවත්, ඇය පැමිණියේ පොලිස් ස්ථානය වෙත බවත්, තවද ඇය ඉස්ලාම් දහම පිළිගැනීමට කැමැත්තෙන් පසුවෙන බවත් එම නිලධාරියා කියා සිටියේය. නමුත් මෙහි ඥාතීන් කිසිවෙකු නැත, ප්‍රකෝපයට පත්ව සිටි මාගේ ස්වාමි පුරුෂයා සමගද මට යන්නට නොහැක. මාගේ ගිණුමෙහි වූ මුදල්, රන් ආභරණ සියල්ල ඔහුට මා දෙන බවත්, ඔහු සමග මා නොයන බව කළ පැමිණිල්ල ස්වාමි පුරුෂයාට එම නිලධාරියා දන්වා සිටියේය. මුලින් මාගේ ස්වාමි පුරුෂයා එයට එකඟ නොවූවත්, මාගේ දැඩි ස්ථාවරය අවබෝධ කරගත් ඔහු, ලිඛිතව සියල්ල භාරදෙන බව පවසා සිටියේය.

දැන් ඔබේ පවුලේ උදවිය ඔබට කිසිදු හිරි හැරයක් නොකරයි. ඔබේ කැමැත්ත අනුව ඔබට ඉස්ලාම් දහම පිළිගත හැකිය යනුවෙන්, මට සියළු පහසුකම් කරදුන් පොලිස් නිලධාරිය පැවසුවේය. එම නිලධාරියාට මා ස්තුති කර, මාගේ සිරුරෙහි වූ තුවාලයන්ට ප්‍රතිකාර කිරීම සඳහා මා රෝහලකට ගියෙමි. එහි නේවාසිකව ප්‍රතිකාර ගැනීමට මට සිදුවිය. වරක් වෛද්‍යවරයා මාගෙන් ඔබ පැමිණ සිටින්නේ කොහේ සිටද? යනුවෙන් ප්‍රශ්න කළේය. ඔබේ පවුලේ කිසිවෙකු ඔබව බැලීමට නොපැමිණියේ මන්ද? යනු හේතුව විමසා සිටියේය. මා කිසිදු පිළිතුරක් දීමට නොහැකිව තුෂ්නිම්භූතව සිටියෙමි. මාගේ නිවසේ සිට මා එකම හේතුවක් මතයි පිටත්වුනේ, දැන් මට පිහිටවීමට ඥාතීන්ද, නෑදැයෝද නැත. මාගේ එකම නෑකම ඉස්ලාම් පමණි. මෙයයි ජයග්‍රහණයෙහි මුල් පියවර වශයෙන් මා දකින්නේ. පොලිස් නිලධාරිවරයා මා සිය සහෝදරියෙකු සේ සිතා මට ඔහුගේ නිවසෙහි නවාතැන් දුන්නේය. මා කිසිවෙකු නොවී තනිවූ එම රාත්‍රියේ මට නවාතැන් දුන් එම අවස්ථාව මට අමතක කළ නොහැක.



මා නේවාසිකව වෛද්‍ය ප්‍රතිකාරගත් අවස්ථාවෙහි මාගේ ඉදිරි පියවර කුමක්ද? යනු සිතා බෙහෙවින් දුක්වුනෙමි. ශාන්තිය හා සමාදානය සොයන්නේ කොහේද? යන ප්‍රශ්නය මා තුළ පැන නැගෙමින් තිබිනි. මා රෝහලෙන් පිටත්වී කෙලින්ම ගියේ ඉස්ලාමීය මධ්‍යස්ථානයක් වෙතය. එම අවස්ථාවෙහි එහි එක් මහළු වියෙන් පසුවූ කෙනෙකු හැර වෙන කිසි කෙනෙකු නොවීය. ඔහුට මා පැමිණුනු හේතුව පිළිබඳ දන්වා සිටියෙමි. මදක් කල්පනා කළ ඔහු, දුව! ඔබ ඇඳ සිටින මෙම ඇඳුම මුස්ලිම් කාන්තාවකට උචිත ඇඳුමක් නොවෙයි ඉස්ලාමීය කාන්තාවක් අඳින ඇඳුමෙන් සැරසෙන ලෙස මාගෙන් ඉල්ලා සිටියේය. එවිට මා සතුව තිබුනු සොච්චමෙන් හිජාබයක් මිළදී ගෙන ඇඳගත්තෙමි. පසුව එම මහළු වියෙහි පසුවූ කෙනා මට ඉස්ලාමීය ඉගැන්වීම් පිළිබඳ පහදා දුන් අතර සලාතය සඳහා දෝවනය කරන ආකාරයද කියා දුන්නේය. මා දෝවනය කරගැනීමෙන් පසු මා එක් කාමරයට කැඳවාගෙන ගියේය. එම කාමරයේ බිත්තිය මත රූපයක් එල්ලා තිබුනි. මාගේ හීනයෙහි කුමන රූපය මා දකිමින් සිටියේද එම රූපයම මා එහි දුටු විට බියට පත්වී කෑගසුවෙමි. හේතුව මා හීනෙන් මෙය දැක බියවූ වාරද අනන්තය. එයට එම මහළු කෙනා මදහස් පාමින්, මෙයයි මක්කාවෙහි පිහිටා තිබෙන ශුද්ධවූ කඃබාව, ලොව පුරා සිටින මුස්ලිම්වරුන් හජ් කර්තව්‍ය ඉටු කිරීම සඳහා පැමිණෙන්නේ මෙම නිවස වෙතයි. එය "බෙතුල්ලාහ්" අල්ලාහ්ගේ නිවස, ඒ පිළිබඳ දැන ගැනීමට බෙහෙවින් මා ප්‍රිය කළෙමි. මා ඔහුගෙන් අල්ලාහ් වෙසෙන්නේ මෙම නිවසේද? යනුවෙන් ප්‍රශ්න කළෙමි. මා යොමු කළ හැම ප්‍රශ්නයකටම සතුටින් පිළිතුරු දෙමින් සිටියේය. ඉස්ලාම් පිළිබඳ හොඳ ඥානයක් ඔහු සතු බව මා දැනගත්තෙමි. ඔහු සමග කථා කරමින් සිටි එම අවස්ථාවේ මාගේ සියළු පීඩනයන් මට අමතක වී තිබුනි. හැම දෙයක් පිළිබඳම

මාගේ භාෂාවන් පැහැදිළි කළ නිසා මට එය පහදා ගැනීමට පහසු විය.

පසුව කලිමා ප්‍රතිඥාව එනම් "ලා ඉලාහ ඉල්ලල්ලාහ් මුහම්මදුර් රසූලුල්ලාහ්" (යාඥා කරනු ලැබීමට එකම සදුස්සා අල්ලාහ් හැර වෙන කිසිවෙකු නැත. මුහම්මද් (සල්) තුමන් අල්ලාහ්ගේ දූතවරයා) බව මා ප්‍රකාශ කර ඉස්ලාම් දහම වැළඳගත්තෙමි. පසුව මුස්ලිම් යනු කවුද? ඉස්ලාම් යනු කුමක්ද? යනු මට පැහැදිළි කළේය. එම අවසථාව එන විට මා තුළ කිසිදු සිත් තැවුළක් නොවීය. මා තුළ අධ්‍යාත්මිකව ආලෝකයක් දැක්කෙමි. අපවිත්‍ර දෙයකින් පිරිසිදුවූ හැඟීමක් මා තුළ අත්වින්දෙමි.

එම ඉස්ලාමීය මධ්‍යස්ථානයෙහි භාරව කටයුතු කළ කෙනා, මා ඔහුගේ සිය දියණිය වශයෙන් සිතා ඔහුගේ නිවසට කැඳවාගෙන ගොස් සියළු පහසුකම් මට කර දුන්නේය. පසුව මුස්ලිම් පවුලක මාගේ විවාහය සඳහා සියළු සූදානම් කළේය. මා තුළ වූ ප්‍රථම අභිලාෂය අල්ලාහ්ගේ පරිශුද්ධ නිවසවූ කඃබාව බැහැ දැකීමයි. අල්ලාහ්ට සියළු ප්‍රශංසා හිමිය මාගේ එම ආශාවද ඔහු ඉටු කර දුන්නේය. මා උම්රා යාඥාව ඉටු කළෙමි.

ප්‍ර: ඉස්ලාම් දහම වැළඳ ගැනීමෙන් පසු ඔබ ඉන්දියාවට ගියාද?

පි: නැත. මා ඉස්ලාම් දහම වැළඳ ගැනීමෙන් පසු ඉන්දියාවට නොගියෙමි. එසේ යෑමේ අවශ්‍යතාවක්ද මට නැත. මාගේ පවුලේ උදවියට ඉන්දියාවෙහි උසස් මට්ටමේ දේශපාලනික සම්බන්ධකම්, ආගමික මධ්‍යස්ථානයන් සමග විවිධ සම්බන්ධකම් ඇත. මාව ඝාතනය කරන්නන්ට තිළිණ ලෙස මුදල් පිරිනමන බව ඔවුන් දන්වා ඇත. මා මුස්ලිමෙකු වශයෙන් සිටීම පිළිබඳ බෙහෙවින් මා ආඩම්බර වෙමි. මාගේ



ජීවිතය ඉස්ලාමීය ආලෝකය මැද්දේ ගෙන යෑමටයි මා ප්‍රිය කරන්නේ.

ප්‍ර: ඉස්ලාම් දහම වැළඳ ගැනීමට පෙර "ජිහාද්" පිළිබඳ ඔබේ මතය කෙසේ ද පැවතුනේ?

පි: ජිහාද් පිළිබඳව හා එය කරන්නන් පිළිබඳව වැරදි මතයකුයි මා තුළ වපුරා තිබුනේ. නමුත් මට දැන් සැබෑ දේ කුමක්ද? යනු වැටහේ. මා එම උසස් කර්තව්‍ය කරන්නන්ව ප්‍රිය කරමි. මා ඔවුන්ගේ ජයග්‍රහණය සඳහා ප්‍රාර්ථනා කරමි. අල්ලාහ් මට පිරිමි දරුවෙකු භාග්‍යයක් වශයෙන් පිරිනමා ඇත. අල්ලාහ්ගේ මාර්ගයෙහි සත්‍ය වෙනුවෙන් පෙනී සිටින ඒ වෙනුවෙන් සටන් කරන කෙනෙකු වශයෙන් ඔහු පත්විය යුතු බව අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කරමි. අල්ලාහ්ගේ කැමැත්ත අනුව ඔහුගේ දහමෙහි දියුණුව කරා කැපවී කටයුතු කරන දරුවන් සේ මාගේ දරුවන් ඇති දැඩි කරමි.

ඇත්ත වශයෙන්ම මෙම ආදර්ශමත් කාන්තාවගේ ජීවිතය තුළින් අපි උගත යුතු දේ බොහෝය.

පහත සඳහන් ශුද්ධවූ අල්කුර්ආනයෙහි පාඨයන් හා මෙම උතුම්වූ කාන්තාව තම ජීවිතය තුළ මුහුණ දුන් අභියෝගයන් සසඳා බලන්න.

"අපි විශ්වාස කළෙමු" යනු පැවසීමෙන් (පමණක්) ඔවුන් පරීක්ෂණයට ලක් නොකෙරෙන බව මිනිසුන් සිතාගෙන සිටින්නේද?. නියතයෙන්ම ඔවුන්ට පෙරවූවන්වද අපි පරීක්ෂණයට ලක් කළෙමු. සැබවින්ම සත්‍ය ප්‍රකාශකරන්නන් අල්ලාහ් දන්නේය, තවද බොරු කරන්නන්වද ඔහු නියතයෙන් දන්නේය." (ශු අල්කුර්ආනය 29: 2, 3).

"ඔබලාට පෙර සිටි (විශ්වාසවන්තයින් වූ) අයට සිදු වූ වේදනා දුක් කරදර වැනි දේ ඔබලා නොලබාම, ඔබලාට ස්වර්ගයට පිවිසිය හැකි වන්නේ යැයි ඔබලා සිතන්නේද? ඔවුනට දිළිඳු භාවයද, පීඩාවද ඇති විය. තවද (එවකට සිටි) දූතවරයා ද ඔහු සමග සිටි විශ්වාසවන්තයින්ද අල්ලාහ්ගේ පිහිට කවර විටක ඒ දැයි හඬ නගන තුරු ඔවුහු කම්පනයට ලක්කරනු ලැබූහ. දැනගනු, (විශ්වාසවන්තයින්ට) නියත වශයෙන්ම අල්ලාහ්ගේ පිහිට ළඟම ඇත." (ශු අල්කුර්ආනය 2: 214).

තවද බියෙන් හා සාගින්නෙන්ද වස්තුන්, ජීවිත හා භෝග(වල) පරිහානියෙන්ද අපි ඔබලාව පරීක්ෂා කරන්නෙමු. (මෙම පරීක්ෂණයෙහිදී නොසැළෙන) ඉවසිලිවන්තයින්ට සුභ පතන්න. ඔවුන් කවරෙක්ද යත් ඔවුන් වෙත යම් විපතක් ඇති වූ විට ඔවුහු "අපි නියත වශයෙන්ම අල්ලාහ්ගේය. තවද අපි නියත වශයෙන්ම ආපසු යන්නේ ඔහු වෙතම" යැයි පවසති. ඔවුන් හට ඔවුන්ගේ හිමියන් වෙතින් ආශිර්වාද හා දයාව ඇත. තවද යහමග ලද්දෝ ඔවුහුමය." (ශු අල්කුර්ආනය 2: 155-157).

"අධෛර්ය නොවනු. දොම්නස් නොවනු. ඔබලා සැබෑ විශ්වාසවන්තයින් නම් නිසැකයෙන්ම විශිෂ්ඨත්වයට පත්වන්නෝ ඔබලාමය." (ශු අල්කුර්ආනය 3: 139).

"නියතයෙන්ම කවුරුන් අල්ලාහ් අප හිමියන් බව පවසා එහි ස්ථිරව සිටින්නේද (ඔවුන්ගේ මරණ මංචකයේ) දේව දූතවරුන් ඔවුන් වෙත බැස පැමිණ ඔබලා බියනොවන්න! ඔබලා දුක් නොවන්න! ඔබලාට පොරොන්දුවූ ස්වර්ගය මගින් සුභාශිංෂණය ලබන්න (යනුවෙන් පවසති)." (ශු අල්කුර්ආනය 41: 30).



"එබැවින් අපහසුවත් සමග පහසුව ඇත. අපහසුවත් සමග පහසුව ඇත" (ශු අල්කුර්ආනය 94: 5,6)

"විශ්වාසවන්තයිනි! අල්ලාහ්ට ඔබ උදව්කළ විට ඔහුද ඔබට උදව් කරන්නේය, තවද ඔබගේ පාදයන් (ඔහු) ස්ථිරකරන්නේය" (ශු අල්කුර්ආනය 47: 7)

"අල්ලාහ් ඔබලාට උපකාරී වන්නේ නම් කිසිවෙකුට ඔබලා ජයගත නොහැකිය. තවද ඔහු ඔබලා අත්හැර දැමුවහොත් ඔහුගෙන් පසු ඔබලාට පිහිටවන්නේ කවරකුද? විශ්වාසවන්තයින් අල්ලාහ් කෙරෙහි පමණක් භාර කළ යුතුය" (ශු අල්කුර්ආනය 3: 160).

"තවද යහපත් අවසානය බිය බැතිමතුන්ටය" (ශු අල්කුර්ආනය 7: 128).